# දෙසතිය


පුවත් සඟරාව

2025 මාර්තු




# ජන සෙතට අය වැය

# ග්‍රහලෝක පෙළපාළිය




බුධ, සිකුරු, අඟහරු, බ්‍රහස්පති, සෙනසුරු, යුරේනස් සහ නෙප්චූන් යන ග්‍රහලෝක හත නොබෝද (පෙබරවාරි 28) සූර්යයාගෙන් එක් පසෙක පෙළ ගැසුණා. අතිශයින් දුර්ලභ වූ මෙවැනි පෙළගැස්මක් 2040 වසර තෙක් නැවත සිදු නොවන බවයි තාරකා විද්‍යාඥයන් සඳහන් කරන්නේ. තාරකා විද්‍යාඥයන්ට, ග්‍රහලෝක චලිතය හා ආකාශ යාන්ත්‍ර විද්‍යාව අධ්‍යයනය කරන්නන්ට සහ ග්‍රහලෝක පිළිබඳ උනන්දුව දක්වන්නන්ට මෙය අද්විතීය අවස්ථාවක් වුණා.

සියලු ම ග්‍රහලෝක අනුගමනය කරන්නේ පොදු කක්ෂීය මාර්ගයක්. එබැවින් දළ වශයෙන් බටහිර සිට නැගෙනහිරට ඇඳ ඇති මනඃකල්පිත රේඛාවක් වටා බැලීමෙන් ඒවා හඳුනාගැනීමට පහසු වූ බව කොළඹ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අංශයේ තාරකා විද්‍යා හා අභ්‍යවකාශ විද්‍යා ඒකකයේ අධ්‍යක්ෂ සහ නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ සභාපති මහාචාර්ය චන්දන ජයරත්න ප්‍රකාශ කරන කාරණාවක්.

ජනවාරි සහ පෙබරවාරි මාසවල මේ ග්‍රහ පිහිටීම බොහෝ රටවලට දර්ශනය වී තිබෙනවා. එහිදී මුලින් දර්ශනය වී ඇත්තේ ග්‍රහලෝක හයක්. හත්වැන්නා ලෙස පෙබරවාරි 28 දින බුධ ග්‍රහයා දර්ශනය වී තිබෙනවා. ශ්‍රී ලංකාවේ සිට මේ ග්‍රහ පිහිටීම නිරීක්ෂණයේදී බටහිර අහස දෙසින් දීප්තිමත් ව සිකුරු ග්‍රහයා දිස් වූ අතර ඊට මදක් පහළින් සෙනසුරු ග්‍රහයාත් එම ග්‍රහලෝක දෙක අතර රේඛාවක් ඇඳීමෙන් ඊට මදක් ඉහළින් බ්‍රහස්පති ග්‍රහයාත් රේඛාවට ඉහළින් සහ නැගෙනහිර දෙසින් සූර්යයාට විරුද්ධ ව අඟහරු ග්‍රහයාත් දිස්වූ බවත් මහාචාර්යවරයා සඳහන් කළ කාරණයක්.

**රංගිකා අබේසේකර**

# දෙසතිය

පුවත් සඟරාව


**වෙළුම 47, කලාපය 03,**
**2025 මාර්තු**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව





23
**ජන සෙතට අය වැය**



17
**සාමයට අත දිගු කිරීම**




03
**46 වසක රාජ්‍යතාන්ත්‍රික මිතුදම**



36
**ඉන්ග්මාර් බර්ගමාන් නැවත කියවීම**

GovPay

11
**රජයට ගෙවන්න**



41
**සප්ත ලෝක වාර්තා**

## ඉහළ අගයක වැටුප් වැඩිවීමක්

රාජ්‍ය අංශය යනු රටක සංවර්ධනයේ ප්‍රධාන පාර්ශ්වකරුවා. පෞද්ගලික පාර්ශ්වය නියාමනය කරන්නේ සහ ඔවුන්ට පහසුකම් සලසන්නේ ද රාජ්‍ය අංශයෙන්. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 වාර්ෂික ආර්ථික විවරණය අනුව මෙරට රාජ්‍ය සේවක පිරිස මිලියන 1.35ක්. පවතින සමාජ ආර්ථික වටපිටාව අනුව ඔවුන්ට යහපත් ජීවන තත්ත්වයක් ලබාදීමත් රජයට දක්ෂ හා පුහුණු ශ්‍රමිකයන් ආකර්ෂණය කර ගැනීමත් ප්‍රමුඛ කාර්ය ලෙස සලකා රජය මෙවර අයවැයෙන් සිදු කර තිබෙන්නේ සුවිශේෂ වැටුප් වැඩි කිරීමක්. මේ සඳහා ඇස්තමේන්තුගත සමස්ත වියදම රුපියල් බිලියන 325ක් වන අතර 2025 වසරේදී යෝජිත වැටුප් වැඩිවීම සඳහා එයින් රුපියල් බිලියන 110ක් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා.

මේ වැටුප් වැඩිවීමේ විශේෂත්වය වන්නේ දශකයකට ආසන්න කාලයක් රාජ්‍ය සේවයේ මූලික වැටුප් සංශෝධනයක් සිදු වී නොමැති පසුබිමක නව රජය සිය මංගල අයවැයෙන් ම මේ තීරණය ගැනීම. එනම් අවසන් වරට සමස්ත රාජ්‍ය සේවක මූලික වැටුප් වැඩිවීමක් සිදු ව ඇත්තේ 2016 වසරේදී. ඒ අනුව මෙවර ජාතික අය වැය 2025 යටතේ රාජ්‍ය සේවයේ අවම මාසික මූලික වැටුප රුපියල් 24,250 සිට රුපියල් 40,000 දක්වා රුපියල් 15,750කින් වැඩි කිරීමට තීරණය කර තිබෙනවා. දැනට පවතින තාවකාලික අතුරු දීමනාව සහ විශේෂ දීමනාව මූලික වැටුපට ඒකාබද්ධ කිරීමත් රුපියල් 8,250ක ශුද්ධ වැඩිවීමක් මූලික අවම වැටුපට අදාළ ව සිදු කිරීමත් එහිදී සිදු වනු ඇති.

රාජ්‍ය සේවකයන්ගේ මේ වැටුප් වැඩිවීමට සමගාමී ව අධිකරණ සේවා, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන් සඳහා ද වැටුප් වැඩිවීමටයි නියමිත. එසේ ම වාර්ෂික වැටුප් වර්ධකයේ වටිනාකම 80%කින් ඉහළ නැංවෙනු ඇති අතර ඒ අනුව රුපියල් 250ක අවම වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 450 දක්වාත් ඉහළ රාජ්‍ය අංශයේ සියලු ම සේවකයන්ගේ වාර්ෂික වැටුප් වර්ධකය එම ප්‍රතිශතයට ගැළපීමටත් යෝජිත ව තිබෙනවා.

මේ වැටුප් වැඩිවීම සිදු වන්නේ අදියර 3කින්. ඒ, මුළු ශුද්ධ වැටුප් වැඩිවීමෙන් රුපියල් 5,000ක් සහ ඉතිරි මුදලින් 30%ක් 2025 වසරේ අප්‍රේල් මාසයේ සිටත් 2026 ජනවාරි සහ 2027 වසරේ ජනවාරි සිට සමාන කොටස් වශයෙන් ඉතිරි 70% ගෙවීමටත් ආදී වශයෙන්. රාජ්‍ය සේවකයන්ගේ ආපදා ණය සීමාව වැඩි කිරීමත් සුවිශේෂ කරුණක්. එය වැඩි වන්නේ දැනට පවතින රුපියල් 250,000 සීමාවේ සිට රුපියල් 400,000 දක්වා. එසේ ම 2025 වසරේ අප්‍රේල් මාසයේ සිට විශ්‍රාම යන නිලධාරීන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ නව වැටුප් ව්‍යුහය මත 2027 වසරේ වැඩි වන වැටුපට අදළ වන පරිදි ගණනය කිරීමටත් යෝජනා කර තිබෙනවා.

රාජ්‍ය අංශයේ මෙවැනි ව්‍යුහාත්මක වැටුප් සංශෝධනයක් ඇතිකිරීම සැබවින් ම රාජ්‍ය සේවකයන් සතුටට පත් වන කරුණක් වනු ඇති. ඒ සමග ම මෙහිදී වැදගත් වන්නේ එයින් ඔවුන් තුළ ඇති වන අභිප්‍රේරණය කාර්යක්ෂම මහජන සේවයක් උදෙසා දායක කර ගැනීම. බොහෝ විට රාජ්‍ය සේවාව පිළිබඳ පවතින සමාජ ආකල්පය එතරම් යහපත් නැහැ. අඩු වැටුප් තත්ත්ව මත ඔවුන් උදාසීන වීමත් ඊට හේතු වන්නට පුළුවන්. එම තත්ත්වය මග හරවා ගැනීමටත් ඔවුන් රාජ්‍ය සේවයේ රඳවා තබා ගැනීමටත් මේ ක්‍රියාමාර්ගය ඉතා වැදගත් වනු ඇති. මේ නිසා සමස්ත රාජ්‍ය සේවකයන්ට ම පැවරෙන අත්හළ නොහැකි වගකීම වන්නේ තම දැනුම, ආකල්ප හා කුසලතාවලින් මහජන හිතකාමී රාජ්‍ය යාන්ත්‍රණය පොහොසත් කිරීමට තම වගකීම හා යුතුකම ඉටු කිරීම.

මාලා මල්කාන්ති පරණගමගේ

- සංස්කාරක -

## නිවැරදි කිරීම

දෙසතිය පෙබරවාරි කලාපයේ 30 වැනි පිටුවේ රස බස මව් බස ලිපියේ උපාධ්‍යායනය යනුවෙන් යෙදී තිබුණේ මුද්‍රණ දෝෂයකි හේතුවෙනි. එය උපාර්ජනය යනුවෙන් නිවැරදි විය යුතුය.

# දෙසතිය
පුවත් සඟරාව

**සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)**

Name ..........................................

Address ..........................................

..........................................

..........................................

..........................................

..........................................

ID Number ....................... Tel / Mobile .......................

Signature ....................... Date .......................

**දෙසතිය සඟරා දායකත්වය**

වාර්ෂික දායකත්වය රු. 1500.00
අර්ධ වාර්ෂික දායකත්වය රු. 750.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 071-9303111 අංකයට Whatsapp කරන්න.

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759




# 46 වසක රාජ්‍යතාන්ත්‍රික මිතුදම

චන්දන මාරසිංහ


පාකිස්තාන අගමැති Muhammad Shehbaz Sharif සමග සාකච්ඡා පවත්වමින්

ශ්‍රී ලංකාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර සබඳතාවලට පවතින්නේ දීර්ඝ ඉතිහාසයක්. 1979 වසරේ ජූලි මාසයේදී ශ්‍රී ලංකා තානාපති කාර්යාලය එරට විවෘත කිරීමත් සමග දෙරට අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇරඹෙනවා.

ආනයන හා අපනයන ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීමේදී තේ, රබර්, පොල්තෙල්, කොප්පරා, කජු සහ මුහුදු ආහාර ආදිය ශ්‍රී ලංකාවෙන් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට අපනයනය කෙරෙනවා. ඉන්ධන, ගෑස්, යූරියා සහ යකඩ ආදිය ශ්‍රී ලංකාවට ආනයනය කෙරෙන භාණ්ඩ. සංචාරක කර්මාන්තය ද දෙරට අතර කැපී පෙනෙන ව්‍යාපාරික අවස්ථාවක්. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා 2008 වසරේදී ඩුබායි කාර්යාලයක් ද පිහිටුවා තිබෙනවා.

එරට සිටින ලක්ෂ 03 ඉක්මවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් සැලකිය යුතු පිරිසක් නිරත වන්නේ ඉහළ මට්ටමේ රැකියාවල. ඒ අනුව ලැබෙන විදෙස් ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කරන බලපෑම සුළුපටු නැහැ. ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය අතර සුහදතාව වර්ධනය කර ගැනීම මෙන් ම ආර්ථික කටයුතු දියුණු කර ගැනීම සඳහා ගිවිසුම් කිහිපයක් ද අත්සන් කර තිබෙනවා. මිනිස් බල බඳවා ගැනීම් ගිවිසුම ද ඒ අතර මූලික වන්නක්. 2014 වසරේදී පිහිටුවා ගත් ඒකාබද්ධ කොමිසම ද දෙරටට වැදගත් වනවා.

මෙවැනි විදෙස් සබඳතාවක් පවතින පසුබිමක 2025 පෙබරවාරි 10 දින සිට පෙබරවාරි 13 දින දක්වා ජනාධිපති අනුර කුමාර දිසානායක එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ නිල සංචාරයක නිරත වුණේ එරට ජනාධිපති Sheikh Mohamed bin Zayed Al Nahyanගේ ආරාධනයකට අනුව. එය වත්මන් ජනාධිපතිවරයා ලෙස පත්වීමෙන් පසු අනුර කුමාර දිසානායක සිදු කළ තෙවැනි විදෙස් නිල සංචාරය ලෙස ඉතිහාසයට එක් වනවා. එහිදී පසුබිම සැකසුණේ රටට වැදගත් වන වැඩපිළිවෙළ ගණනාවක තීරණ සඳහා එළඹීමට.

පෙබරවාරි 12 දින ශ්‍රී ලංකා ජනාධිපතිවරයා 2025 ලෝක රාජ්‍ය සමුළුව ඇමතුවේ අභියෝගවලට මුහුණ දීම සඳහා ගෝලීය පුරවැසියන් ලෙස සියලු දෙනාට පවතින වගකීම සිහිපත් කරමින්. මානව වර්ගයා සම්බන්ධයෙන් වැදගත් වන අංශවල අනාගත ගමන් මග සඳහා ද මේ සමුළුව වැදගත්. රටවල් 150ක පමණ නියෝජිතයන් 4000කට වැඩි පිරිසක් ඊට එක් ව සිටියා. මෙහිදී ජනාධිපතිවරයා පැවසුවේ "දේශසීමා ඉක්මවා යන අභියෝගවලට මුහුණදීම සඳහා අප ගෝලීය පුරවැසියන්

ලෙස එකට එක්විය යුතු බව මා යළිත් ඔබගේ අවධානයට යොමු කරනවා. මේ අභියෝගවලට මුහුණදීම සඳහා සාමූහික ගෝලීය ක්‍රියාමාර්ගයක් සහ ඒකාබද්ධ පෙරමුණක අවශ්‍යතාව තිබෙනවා." යනුවෙන්.

ගෝලීයකරණය වූ වර්තමාන ලෝකයේ කිසිදු රටකට හුදකලාව ජීවත් වීමේ හැකියාවක් නැහැ. විශේෂයෙන් ලෝකය විවිධ කලාප මෙන් ම න්‍යායපත්‍ර අනුව බෙදී වෙන් වී සිටිනවා. එවැනි වාතාවරණයක ඇතිවන පීඩනය හමුවේ වැඩි ම බලපෑමක් එල්ල වන්නේ දුප්පත් රටවලට. එවිට සියලු පාර්ශ්ව එක් ව ක්‍රියා කිරීම වැදගත්. විවිධ අරමුණු අනුව බෙදී සිටිය ද අභියෝග හමුවේ එක් ව ක්‍රියා කිරීමෙන් ගැටලු විසඳා ගැනීමේ හැකියාව පවතිනවා. සමාජ ආරක්ෂණය, නීතියේ ආධිපත්‍යය මෙන් ම ප්‍රමිතිගත රාජ්‍ය ක්‍රමයක් වර්තමාන ලෝකයට අවශ්‍ය වනවා. එක් ව ලෝකය ගොඩනැගිය හැකි වන්නේ අවංක ව ඊට කැපවුවහොත් පමණයි. ඒ අනුව ශ්‍රී ලංකා ජනාධිපතිවරයා පළ කළ එම අදහස් කාලෝචිත සහ අතිශය වැදගත්.




ශ්‍රී ලංකා විදේශ අමාත්‍ය විජිත හේරත් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මූල්‍ය කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය Mohamed Bin Hadi Al Hussaini ද්වීපාර්ශ්වික ගිවිසුමට අත්සන් තබමින්



බ්‍රිතාන්‍ය හිටපු අගමැති Tony Blair සමග අදහස් හුවමාරු කර ගනිමින්

2025 ලෝක රාජ්‍ය සමුළුවට (WGS) සහභාගි වීමට සමගාමී ව මේ සංචාරයේදී ද්වීපාර්ශ්වික සාකච්ඡා රැසක් පැවැත්වුණා. ජනාධිපති Sheikh Mohamed bin Zayed Al Nahyan සමග පැවැත් වූ සාකච්ඡාවලදී දෙරට අතර සහයෝගිතාව තවදුරටත් වර්ධනය කර ගැනීමට හැකි වුණා. ශ්‍රී ලංකාවට ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ, කෘත්‍රිම බුද්ධිය, බලශක්ති, සංචාරක, මූල්‍ය සහ ජනමාධ්‍ය යන අංශවල ප්‍රමුඛ පෙළේ ගෝලීය සමාගම්වල විධායක නිලධාරින් ගණනාවක් සමග ජනාධිපතිවරයා අදහස් හුවමාරු කර ගත්තා.

කුවේට් අග්‍රාමාත්‍ය Sheikh Ahmed Abdullah Al ahmad Al Sabah සමග පැවති සාකච්ඡාවලදී ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මෙරට පවතින අවස්ථා පිළිබඳ ශ්‍රී ලංකා ජනාධිපතිවරයා එහිදී කරුණු පැහැදිලි කළා. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ක්‍රියාවලියේදී විදෙස් ආයෝජන මෙන් ම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයටත් ප්‍රමුඛත්වය ලැබෙනවා. විශේෂයෙන් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමත් එහි ආදායම් වැඩි කර ගැනීමත් රජයේ සැලසුම්වලට ඇතුළත්. එමගින් නව ආදායම් උත්පාදනයට හැකියාව ලැබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය පහසුකම් ලබා ගැනීමේදී කුවේට් රාජ්‍යයෙන් ශ්‍රී ලංකාවට සහය හිමි වූ නිසා මිත්‍ර පාර්ශ්වයක් ලෙසට මේ සම්බන්ධතා වර්ධනය කර ගැනීම වැදගත්. ජනාධිපතිවරයා ඒ සම්බන්ධයෙන් අගමැතිවරයාට ස්තුතිය පළ කිරීමටත් අමතක කළේ නැහැ. විදෙස්ගත ශ්‍රමිකයන්ගෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලැබෙනවා. ඔවුන්ගෙන් විශාල පිරිසක් සේවය කරන්නේ මැදපෙරදිග කලාපයේ. කුවේට් රාජ්‍යයේ සිටින ශ්‍රී ලාංකික ශ්‍රමික පිරිස 150,000ක් පමණ. මේ නිසා මෙරටට ඇමරිකානු ඩොලර් මිලියන 700ක පමණ විදේශ ප්‍රේෂණ ලැබෙනවා. මේ තත්ත්වය ශ්‍රී ලංකා ආර්ථිකයට විශාල ශක්තියක්. විදෙස් ශ්‍රමික රැකියා අවස්ථා වැඩිකර ගැනීමටත් මෙවැනි ද්වීපාර්ශ්වික සහයෝගිතාව වැදගත් වනවා.

පාකිස්තාන අගමැති Muhammad Shehbaz Sharif සමග ද ජනාධිපති අනුර කුමාර දිසානායක සාකච්ඡා පැවැත්වූවා. එහිදී වත්මන් ආණ්ඩුව ලැබූ ජයග්‍රහණ පිළිබඳ පාකිස්තාන අගමැතිවරයා ප්‍රශංසාව පළ කිරීම සුවිශේෂත්වයක්. අසල්වැසි රටක් වශයෙන් ඉන්දියාව සමග මෙන් ම පාකිස්තානය සමගත් සම්බන්ධතා වර්ධනය කරගත යුතු වනවා. ශ්‍රී ලංකා-පාකිස්තාන වෙළෙඳාම ශක්තිමත් කිරීම, වෙළෙඳපොළ විවිධාංගීකරණය ගැනත් මෙහිදී අවධානය යොමු වුණා. මේ සාකච්ඡාවලදීත් මෙරට සංචාරක කර්මාන්තය සංවර්ධනය කරන ආකාරය ගැන විශේෂයෙන් කතාබහට ලක් ව තිබෙනවා.

බ්‍රිතාන්‍ය හිටපු අගමැති Tony Blair සමග අදහස් හුවමාරුවේදී ඔහු පෙන්වා දී ඇත්තේ විවිධ ක්ෂේත්‍රවලට එරට දැනුම හා පුහුණුව ලබාගත හැකි ආකාරය පිළිබඳ ව. කෘෂිකර්මාන්තය වැනි ක්ෂේත්‍රවලට අදාළ විශේෂඥ දැනුම හා පුහුණුව ලබා ගැනීම කෙරෙහි එහිදී විශේෂ අවධානය යොමුවුණා. එය ඵලදායී ආර්ථික වැඩපිළිවෙළක් හඳුන්වා දීමේදී ඉතා වැදගත්. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය,

වරාය සහ සංචාරක ක්ෂේත්‍රවල පවතින ආයෝජන අවස්ථා පිළිබඳවත් අදහස් පළ වී තිබෙනවා.

ජනාධිපතිවරයා තවත් වැදගත් සාකච්ඡාවක නිරත වුණේ ඔරකල් (Oracle) සමාගමේ විධායක උපසභාපති Mike Sicilia සමග. ඔරකල් යනු ලෝකයේ විශාලතම පරිගණක මෘදුකාංග සමාගමක්. ශ්‍රී ලංකාව මේ වන විට ඩිජිටල්කරණය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර අවසන්. එවැනි පසුබිමක ඇමරිකානු සමාගමක් වන ඔරකල් සමග කටයුතු කිරීමෙන් වාසි ගණනාවක් අත්කර ගැනීමේ හැකියාව පවතිනවා. ඒ, ආර්ථික මෙන් ම පාලන කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීම වෙනුවෙන්. ශ්‍රී ලංකාවේ ඩිජිටල් නව තාක්ෂණය උපයෝගී කර ගැනීමට ශ්‍රී ලංකාව පියවර ගනිමින් සිටිනවා. එවැනි අවස්ථාවක මෙවැනි සමාගමක දායකත්වය ලැබීම ඉතා වැදගත්. ඒ අනුව ඔරකල් සමාගමට ශ්‍රී ලංකාවේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කිරීමේ හැකියාව පවතිනවා.

මැදපෙරදිග කලාපයේ ශ්‍රී ලංකාවේ විශාලතම හා වැදගත් ම වෙළෙඳ හවුල්කරුවා ලෙස සැලකෙන්නේ එක්සත් අරාබි එමීර් රාජ්‍යය. දෙරට අතර අංශ ගණනාවක් ඔස්සේ විහිදෙන ද්විපාර්ශ්වික සම්බන්ධතාවල ආර්ථික ක්ෂේත්‍රය ප්‍රමුඛකොට සැලකෙනවා. එහිදී වඩාත් පුළුල් වී තිබෙන්නේ වෙළෙඳ හා

> ගෝලීයකරණය වූ වර්තමාන ලෝකයේ කිසිදු රටකට හුදකලාව ජීවත් වීමේ හැකියාවක් නැහැ. විශේෂයෙන් ලෝකය විවිධ කලාප මෙන් ම න්‍යායපත්‍ර අනුව බෙදී වෙන් වී සිටිනවා. එවැනි වාතාවරණයක ඇතිවන පීඩනය හමුවේ වැඩි ම බලපෑමක් එල්ල වන්නේ දුප්පත් රටවලට. එවිට සියලු පාර්ශ්ව එක් ව ක්‍රියා කිරීම වැදගත්. විවිධ අරමුණු අනුව බෙදී සිටිය ද අභියෝග හමුවේ එක් ව ක්‍රියා කිරීමෙන් ගැටලු විසඳා ගැනීමේ හැකියාව පවතිනවා. සමාජ ආරක්ෂණය, නීතියේ ආධිපත්‍යය මෙන් ම ප්‍රමිතිගත රාජ්‍ය ක්‍රමයක් වර්තමාන ලෝකයට අවශ්‍ය වනවා. එක් ව ලෝකය ගොඩනැගිය හැකි වන්නේ අවංක ව ඊට කැපවුවහොත් පමණයි. ඒ අනුව ශ්‍රී ලංකා ජනාධිපතිවරයා පළ කළ එම අදහස් කාලෝචිත සහ අතිශය වැදගත්.



කුවේට් අග්‍රාමාත්‍ය Sheikh Ahmed Abdullah Al ahmad Al Sabah සමග

පරිවර්තනය මෙන් ම ක්ලවුඩ් (Cloud) යටතට පහසුකම් ලබා ගැනීම පිළිබඳ ව අවධානය මෙහිදී යොමු වුණා. ඒ අනුව ඩිජිටල්කරණයට සහය වීමට ඔරකල් සමාගම කැමැත්ත පළ කර තිබෙන අතර මෙරට ක්‍රියාත්මක ඩිජිටල් ගෙවීම් පහසුකම් ඇති කිරීමේ වැඩසටහන ගැනත් සාකච්ඡා කර තිබෙනවා. කොළඹ වරාය නගරයේ ඩිජිටල්කරණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට ජනාධිපතිවරයා කළ ආරාධනයට තමන් දැඩි උනන්දුවක් දක්වන බවයි ඔරකල් විධායක උපසභාපතිවරයා සඳහන් කළේ. එය දකුණු ආසියා කෘත්‍රිම බුද්ධිය (AI) සහ වලාකුළු මධ්‍යස්ථානය (Cloud Hub) ලෙසටත් ක්‍රියා කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල වාසියක් ගෙනෙන ව්‍යාපෘතියක් වනු ඇති. පාලන කාර්යක්ෂමතාව, ආර්ථික සංවර්ධනය සහ ගෝලීය තරගකාරීත්වය සඳහා ආයෝජන අවස්ථා. ජනාධිපතිවරයාගේ මේ සංචාරය අතරතුර තවත් වැදගත් ගිවිසුමකට එළඹීමට හැකිවුණා. එක්සත් අරාබි එමීර් රාජ්‍යය සමග ආර්ථික හා ආයෝජන සබඳතා ශක්තිමත් කිරීම සඳහා ප්‍රවර්ධනය හා අන්‍යෝන්‍ය ආයෝජන ආරක්ෂණ ගිවිසුමකට එහිදී අත්සන් කර තිබෙනවා. ඊට අත්සන් කර තිබෙන්නේ ශ්‍රී ලංකාව වෙනුවෙන් විදේශ අමාත්‍ය විජිත හේරත් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙනුවෙන් එහි මූල්‍ය කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය Mohamed Bin Hadi Al Hussaini. මේ ද්විපාර්ශ්වික ගිවිසුමෙන් ගෝලීය වෙළෙඳපොළ ආයෝජන අවස්ථා පුළුල් කිරීමත් විදේශවල ආයෝජන ආරක්ෂා කිරීමත් වෙනුවෙන් ආරක්ෂිත නීතිමය රාමුවක් සපයනවා. ආයෝජකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත් එහි කාර්යයක්. ඕනෑ ම රටකට ආයෝජකයන් ආකර්ෂණය කරගත හැකි වන්නේ ඔවුන්ට පහසුකම් සැලසීමෙන් මෙන් ම ස්ථාවර සහ ආරක්ෂිත වටපිටාවක් ලබාදීමෙන්. ශ්‍රී ලංකාව විදේශ ආයෝජන දිරි ගැන්වීමේ වැඩසටහන්වලට වැඩි අවධානය යොමු කර තිබෙනවා. එවැනි අවස්ථාවක මෙවැනි ගිවිසුම්වලට එළඹීමෙන් ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු කරගැනීමේ හැකියාව පවතිනවා. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආයෝජකයන් දිරිගැන්වීමත් මෙහි අරමුණක්.

ද්විපාර්ශ්වික ආර්ථික සංවර්ධනය මෙන් ම මූල්‍ය ස්ථාවරත්වය රටකට අතිශයින් වැදගත් වනවා. ඇති කරගන්නා මෙවැනි ගිවිසුම්වලින් වන්නේ නීතිමය රාමුව ඔස්සේ එකිනෙකා කෙරෙහි විශ්වාසයෙන් යුතු ව ක්‍රියා කළ හැකි වීම. විනිවිද පෙනෙන ස්ථාවර පරිසරයක් සැකසීමට ද මෙවැනි ගිවිසුම් ඉවහල් වනවා. විශේෂයෙන් ඔරකල් වැනි සමාගම් ආකර්ෂණය කර ගැනීමටත් මේ විනිවිද බව හා ආරක්ෂණය ඉතා වැදගත්.



# පොලිස් වැඩ වෙනස් හැඩ

නුවන් කුමාර කටුගම්පල

රටේ නීතිය සහ සාමය ආරක්ෂා කිරීමේ මූලික වගකීම දරන්නා ශ්‍රී ලංකා පොලිසිය. ඒ වගකීම ඉටු කිරීමට පොලිසියේ සිදු විය යුතු ව්‍යුහාත්මක වෙනස්කම් කාලයක පටන් කතාබහට ලක්වන්නක්.

අපරාධ විධිවිධාන සංග්‍රහයේ දෙවැනි වගන්තියේ සඳහන් පරිදි ශ්‍රී ලංකා පොලිසියේ යම් පරිපාලනමය වෙනස්කමක් සිදු කරන විට ආරක්ෂක අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු බවත් එම නෛතික අවශ්‍යතා සම්පූර්ණ කරමින් ශ්‍රී ලංකා පොලිසියේ නව පරිපාලන ව්‍යුහයක් ස්ථාපිත කළ බවත් නොබෝදා මාධ්‍ය දැනුවත් කිරීමේ හමුවක් පවත්වමින් ප්‍රකාශ කළේ පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, නීතිවේදී බුද්ධික මනතුංග. මේ නව වෙනස්කම් සිදු කර ඇත්තේ ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයා ලෙස අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාගේ අනුමැතියට යටත් ව.

නව පරිපාලන ව්‍යුහය සකස් කිරීමේ අරමුණු වන්නේ මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CiD) සතු අතිවිශාල සංඛ්‍යාවක් වන විමර්ශන ගොනු, කාලය කළමනාකරණය කරගනිමින් කාර්යක්ෂම ව විමර්ශනය කර අවසන් කිරීමට පියවර ගැනීම. එසේ ම වඩාත් මහජන මිත්‍රශීලී පොලිස් සේවාවක් ස්ථාපිත කිරීම ද එහි අරමුණක්. නීතිය ඉෂ්ට වීම ප්‍රමාද වීම ද නීතිය ඉෂ්ට නොවී තිබීමට යම් සමානත්වයක් දක්වනවා. එබැවින් පහසුවෙන්, නිවැරදි ව ක්‍රමවත් ව සහ කාර්යක්ෂම ව ඉතා කෙටි කාලයකදී කඩිනමින් සාක්ෂි ඒකරාශී කරගෙන විමර්ශන ක්‍රියාවලි අවසන් කර සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමටත් ඔවුන් අතරින් වරදකරුවන් හඳුනාගෙන ඔවුන්ට නීතියෙන් දඬුවම් ලබා දීමටත් මේ විමධ්‍යගත කිරීමෙන් ශ්‍රී ලංකා පොලිසිය බලාපොරොත්තු වනවා.

මෙහිදී 'ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (අපරාධ පරීක්ෂණ සහ මූල්‍ය අපරාධ)' යනුවෙන් නව තනතුරක් ඇති කර තිබෙනවා. එයින්, මෙතෙක් කල් නියෝජ්‍ය පොලිස්පතිවරයකු යටතේ ක්‍රියාත්මක වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ද අධීක්ෂණයට ලක් වන අතර 'මූල්‍ය අපරාධ පරීක්ෂණ දිසාව' නමින් නව දිසාවක් ද පරිපාලනය වනවා. ඒ යටතේ කොට්ඨාස දෙකක් ද අලුතින් ක්‍රියාත්මක වන්නේ 'මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය' සහ 'නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය' යනුවෙන්. මෙතෙක්කල් මූල්‍ය අපරාධ පිළිබඳ විමර්ශන ක්‍රියාත්මක වූයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ. මින් ඉදිරියට එහි කාර්ය අලුතින් පිහිටුවන ලද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය දක්වා ද විමධ්‍යගත වනවා.

අපරාධ නඩු සඳහා විමර්ශන බලතල සහිත ව 'මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය' නමින් නව කාර්යාංශයක් ද පිහිටුවා තිබෙනවා. නීති විරෝධී වත්කම් විමර්ශනය, මනුෂ්‍ය ඝාතන සහ සංවිධානාත්මක අපරාධ විමර්ශනය, මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශනය, පරිගණක අපරාධ විමර්ශනය, තැනැත්තන් වෙළෙඳාම, ජාවාරම සහ සමුද්‍රීය අපරාධ විමර්ශනය හා අපරාධ, බුද්ධි හා බුද්ධි විශ්ලේෂණය යනුවෙන් අංශ 6ක් එම කාර්යාංශය යටතේ අලුතින් ක්‍රියාකාරී වනවා.

මෙතෙක්කල් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ එක ම සංවිධාන ව්‍යුහයකයි ශ්‍රී ලංකා පොලිසිය සියලු විමර්ශන ක්‍රියාත්මක කළේ. ඒ සියල්ල සඳහා වෙන වෙන ම විමර්ශන බලතල සහිත විශේෂ ඒකක පිහිටුවා තිබුණේ නැහැ. ඒ නිසා අපිළිවෙළ. ප්‍රමාදය, අතපසු වීම, වගකීමේ දුර්වලතා, අක්‍රමිකතා, අනවශ්‍ය අතපෙවීම් අතරතුර කල්මරමින් විමර්ශන සිදුවීම වැඩි ව තිබුණා. නව ක්‍රමය අනුව මේ එක් එක් විෂයට අනුබද්ධ ව විශේෂඥ දැනුම සහිත නිලධාරීන් යටතේ වෙන් වෙන් වශයෙන් විමර්ශන සිදු කිරීමට හැකියාව තිබෙනවා. ඉහත ක්ෂේත්‍ර යටතේ දැනට සක්‍රිය සේවයේ යෙදෙන නිලධාරීන් පුහුණු කිරීමටත් පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් තෝරා ගැනීමටත් නව බඳවා ගැනීම් සිදු කිරීමකදී ඒ ඒ විශේෂ විෂය කාණ්ඩ සඳහා විශේෂ සුදුසුකම් සහිත අය බඳවා ගැනීමටත් මේ ක්‍රමය පහසුවක්. එමගින් වඩාත් කාර්යක්ෂම ව අපරාධ විමර්ශනයට ඉඩ සැලසෙනවා. යම්කිසි අපරාධයක විමර්ශනයේ තිබෙන විශේෂ බරපතළ ස්වභාවය සලකා බලා එහි විමර්ශන කාර්ය සිදු කළ යුත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ද? මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශයෙන් ද? නැතිනම් මේ අංශ දෙක ඒකාබද්ධ ව ද? යන්න පැමිණිල්ලේ ස්වභාවය පාදක කරගෙන පොලිස්පතිවරයා විසිනුයි තීරණය කරනු ලබන්නේ.

මෙතෙක්කල් බස්නාහිර සහ දකුණු පළාත් පමණක් ආවරණය වන පරිදි පැවති පළාත් අපරාධ විමර්ශන කොට්ඨාස, රටේ සියලු පළාත් ආවරණය වන පරිදි පිහිටුවීමත් නව වෙනස්කමක්. මේවා ක්‍රියාත්මක වන්නේ අදාළ පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ. අදාළ පළාතේ අපරාධ සිදුවීම අවම කර ගැනීමටයි මෙයින් අපේක්ෂා කෙරෙන්නේ. මෙතෙක්කල් පොලිසියේ ක්‍රියාත්මක නොවුණු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (විශේෂ ආරක්ෂක දිසාව) නමින් නව තනතුරක් ඇති කර තිබෙනවා. ඔහුගේ සෘජු අධීක්ෂණය යටතට පැවරෙන්නේ නියෝජ්‍ය පොලිස්පති (ජනාධිපති ආරක්ෂක දිසාව), නියෝජ්‍ය පොලිස්පති (තානාපති ආරක්ෂක දිසාව), නියෝජ්‍ය පොලිස්පති (අධිකරණ ආරක්ෂණ ඒකක) යන අංශ.

මේ ව්‍යුහාත්මක වෙනස්කම් වඩාත් ම බලපානු ඇත්තේ පසුගිය කාල සීමාවේ සිදු වී ඇති සංවිධානාත්මක අපරාධ, මූල්‍යමය අපරාධ, රාජ්‍ය මුදල් සහ දේපළ අවභාවිත කිරීම්, මුදල් වංචා යනාදීයේ විමර්ශන ක්‍රියාවලිය වේගවත් සහ කාර්යක්ෂම වීමට. ඉදිරියේදී අපරාධ අඩු රටක ජීවත් වීමට මහජනතාවට අවකාශ ලැබීම සඳහා මේ නව වෙනස්කම් පිටිවහලක් වීමයි සිදු විය යුත්තේ. ශ්‍රී ලංකා පොලිසිය ප්‍රතිසංවිධානය කිරීම අපරාධ වර්ධනය වීමට අනුබල නොදෙන සහ අපරාධ අඩු කිරීම සඳහා කැපවන රජයේ නැඹුරුව පෙන්වන අවස්ථාවක්.

# සපිරි නිවසින් - සුපිරි වෙනසක්

**රංගිකා අබේසේකර**

'Smart Home-සපිරි නිවස' යනු ආකල්ප වෙනසකින් ගෘහ ඒකක සංවර්ධනයට ක්‍රියාත්මක නව ව්‍යාපෘතියක්. ගම්පහ දිස්ත්‍රික්කයෙන් නියමු ව්‍යාපෘතියක් ලෙස ඇරඹුණු මෙය 'ක්ලීන් ශ්‍රී ලංකා' (Clean Sri Lanka) වැඩසටහනට සමගාමී ව ක්‍රියාත්මක වන්නක්.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් ලලින්ද ගමගේගේ සංකල්පයක් මත ඇරඹුණු මේ ව්‍යාපෘතියේ අරමුණු වන්නේ 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' යන රාජ්‍ය ප්‍රතිපත්තිය මුල් කරගෙන ආකල්ප සංවර්ධනයෙන් අනාගත පරපුරට යහපත් සමාජ වටපිටාවක් ගොඩනැංවීම, ගෘහ ඒකකවල ඵලදායිතාව හා ජීවන තත්ත්වය ඉහළ නංවමින් සමාජීය පාරිසරික සහ සදාචාරාත්මක පුනර්ජීවනයක් ඇති කිරීම. අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක මෙහි පළමු වැනි අදියර 2025 ජනවාරි 08 දින ආරම්භ කර තිබෙනවා.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ඵලදායිතා ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභා හා නගර සභා, පොලිසිය, ගොවිජන සේවා මධ්‍යස්ථාන, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, රාජ්‍ය නොවන සංවිධාන හා ආගමික ස්ථාන යන පාර්ශ්ව මේ ව්‍යාපෘතියට දයක වනවා. රේඛීය අමාත්‍යාංශ හා පළාත් පාලන ආයතනවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින ක්ෂේත්‍ර නිලධාරින් මීට එක්වන්නේ තමන්ගේ රාජකාරී විෂය පථය යටතේ හා ව්‍යාපෘති නිර්ණායක ඔස්සේ අදාළ නිවාසවල ජීවන තත්ත්වය ඉහළ නැංවීමට.

'Smart Home-සපිරි නිවස' ව්‍යාපෘතියේ සමස්ත අධීක්ෂණය අදාළ ප්‍රාදේශීය ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකරනු ලබනවා. සෘජු අධීක්ෂණය කරනු ලබන්නේ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින්. වැඩසටහන් සම්බන්ධීකාරක වන්නේ ඵලදායිතා නිලධාරි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අදාළ වසමේ ග්‍රාම නිලධාරි, සංවර්ධන නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි,



කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර හා පවුල් සෞඛ්‍ය නිලධාරින් සිදු කරනවා.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් ලලින්ද ගමගේ සඳහන් කරන ආකාරයට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ සාමාජීය, ආර්ථික, සෞඛ්‍යමය, සදාචාරාත්මක හා සංස්කෘතිකමය ආදී ලෙස සෑම ක්ෂේත්‍රයක් ම ආවරණය වන පරිදි මූලික ක්ෂේත්‍ර 12ක් යටතේ. ඒ පිළිබඳ අදහස් දක්වන ඔහු; "2025 ජනවාරි 08 දින සිට මාර්තු 31 දක්වා 'Smart Home-සපිරි නිවස' ව්‍යාපෘතියේ පළමු වැනි අදියර ක්‍රියාත්මක කරනවා. මෙහි දෙවැනි අදියර ක්‍රියාත්මක කරන්නේ මේ වසරේ අප්‍රේල් මස 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා. පළමු වැනි අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13ක එක් කොට්ඨාසයකින් නිවාස 20 බැගින් නිවාස ඒකක 260ක් ආවරණය කිරීමට අපේක්ෂා කරනවා. 2025 වසරේ ආවරණය කිරීමට අපේක්ෂිත ගෘහ ඒකක ගණන 1437ක්. 2025 වසරේ ව්‍යාපෘතිය අත්කර ගන්නා ප්‍රගතිය අනුව එහි ප්‍රගතිශීලී දේ එක් කර ගනිමින්, දුර්වලතා අවම කරගනිමින් 2026 වසර වන විට මේ ව්‍යාපෘතිය පුළුල් කිරීමයි අපේ අභිප්‍රාය".

ඒ අනුව ජීවන තත්ත්වය ඉහළ මට්ටමක ඇති, සමාජීය පාරිසරික සහ සදාචාරාත්මක පුනර්ජීවනයක් ඇති, ආකල්පවලින් පොහොසත්, යහපත් අනාගත පරපුරක් නිර්මාණය වී 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' මෙරට ස්ථාපිත වනු දැකීමයි 'Smart Home-සපිරි නිවස' ව්‍යාපෘතියේ පරමාර්ථය.

### 'Smart Home-සපිරි නිවස' ව්‍යාපෘතියේ ප්‍රධාන ක්ෂේත්‍ර

- ගෙවතු සංවර්ධනය, ඉඩම් පරිහරණය, පරිසර අලංකරණය හා අපද්‍රව්‍ය කළමනාකරණය
- පෝෂණය හා ආහාර සුරක්ෂිතතා
- සෞඛ්‍ය හා සනීපාරක්ෂා
- ආරක්ෂාව, සුරක්ෂිතතාව හා රැකවරණ
- ආකල්ප සංවර්ධනය
- අරපිරිමැස්ම
- අධ්‍යාපනය
- ඵලදායීතා සංකල්ප භාවිතය
- සාමය (බාහිර හා අභ්‍යන්තර) හා සහජීවනය
- ඉතිරි කිරීම හා වියදම් කළමනාකරණය
- තාරුණ්‍යය බල ගැන්වීම හා වෘත්තීය මාර්ගෝපදේශකත්වය
- සැලසුම්, අනාගත ඉලක්ක හා සමාජ සබඳතා

# මත නැති කරන්න මත ඇති කරන්න







නුවන් කුමාර කටුගම්පල

මත්ද්‍රව්‍යවලට (Dangerous Drugs- අන්තරායකර ඖෂධවලට) බිය විය යුතු නැහැ. විය යුත්තේ ඒවා අපුල සහ අනවශ්‍ය දේවල් නිසා ප්‍රතික්ෂේප කිරීම. රටේ පාලකයන්, නීතිය හා සාමාන්‍ය සමාජය මත්ද්‍රව්‍ය ප්‍රතික්ෂේප කළහොත් වෙළෙන්දාටත් පාරිභෝගිකයා (මත්ද්‍රව්‍ය භාවිත කරන්නා)ටත් සිදු වන්නේ ඉන් ඉවත් වීමට. පාලකයන්, නීතිය සහ සාමාන්‍ය සමාජය ඊට නතු වූ විටත් බිය වූ විටත් සිදු වන්නේ මත්ද්‍රව්‍ය වෙළෙන්දාත් පාරිභෝගිකයාත් විසින් පාලකයන් ආවරණ පළිහ ලෙස යොදා ගනු ලබමින්, නීතිය මුදලට සහ හිතවත්කමට අවභාවිත කරමින්, සමාජ කණ්ඩායම් මගින් ප්‍රචාරණය කරමින් සහ බෙදාහරිමින් රිසි සේ මත්ද්‍රව්‍ය වෙළෙඳාම සහ පාවිච්චිය වර්ධනය කරගෙන සිය ඉලක්ක සපුරා ගැනීම. එබඳු හේතු නිසා කාලයක් තිස්සේ රටේ වර්ධනය වූ සහ පැතිරුණු මත්ද්‍රව්‍ය රකුසකුට, යක්ෂයකුට හෝ මාරයාට උපමා කර බිය වැද්දීමෙන් සහ පඹයකුට සම කර සමච්චලයට ලක් කිරීමෙන් ම මතින් තොර සමාජයක් බිහි කළ හැකි ද? මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ සද්භාවයෙන් යුත් ප්‍රචාරණ කාර්ය සහ මාධ්‍ය භාවිතාව නිසා අනවශ්‍ය ප්‍රවර්ධනයක් සිදුවීම ද මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සඳහා අනියම් පිටිවහලක් වන බව සාකච්ඡාවට බඳුන් වන කරුණක්.

> ළමයින් මත්ද්‍රව්‍ය ව්‍යාපාරය පිළිබඳ තොරතුරු සෙවීමට සහ ඔත්තු බැලීමට යොදා නොගැනීමට වගබලා ගත යුතුයි. දරුවන් ඊට සම්බන්ධ කරගෙන ඇති බව මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන් දැන ගතහොත් එය ළමයින්ගේ ආරක්ෂාවට තර්ජනයක්. යෞවනයන් යනු රහස්‍යභාවයට වඩා විවෘතභාවයට කැමති, මිතුරන් අතරේ පම්පෝරි ගසමින්, රස කර කර විවිධ අත්දැකීම් බෙදාහදා ගනිමින්, තමාගේ රහස්‍යභාවය තමා විසින් ම නැති කර ගන්නා පිරිසක්. ඔවුන්ගේ කතාබහ පිළිබඳ තොරතුරු මත්ද්‍රව්‍ය, පාතාලය, අපරාධ, අපචාර සමග සහසම්බන්ධ කණ්ඩායම්වලට සැලවීමෙන් ඒ ළමයින්ට ජීවිත තර්ජන පවා එල්ල වීමේ හැකියාව පවතිනවා. එය භයානක තත්ත්වයක්.

දැඩි විනයක්, ගරුත්වයක්, පුහුණු පිරිස් බලයක් සහ ශක්තියක් තිබෙන මෙරට පොලිස් සේවාව, ත්‍රිවිධ හමුදා සේවාව, සෞඛ්‍ය සේවාව, අධ්‍යාපන සේවාව, ජනමාධ්‍ය සේවාව සෘජුවමත් රටේ අනෙකුත් සියලු ක්ෂේත්‍ර වකුවත් ඔවුනොවුන් ඒකාබද්ධ ව සහ තනි තනිවත් මත්ද්‍රව්‍ය තුරන් කිරීමට දක්වන්නේ ඉහළ දායකත්වයක්. රටේ මත්ද්‍රව්‍ය වෙළෙඳාම සහ භාවිතය විසඳාගත නොහැකි අන්දමේ ප්‍රශ්නගත අඩියකට පත් ව ඇත්තේ තත්ත්වය එසේ පැවතියදී.

මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය වැඩි බවට සහ නව පෙති වර්ග, කුඩු වර්ග, බීම වර්ග, එන්නත් වර්ග යනාදී මත්ද්‍රව්‍ය වෙළෙඳපොළට පැමිණ ඇති බැවින් ප්‍රවේශම් විය යුතු බවට දැනුවත් කිරීමට යොදා ගන්නා සමාජ මාධ්‍ය පෝස්ටු ඇතුළු ප්‍රචාරණ වැඩසටහන් හේතුවෙන් ද අලුත් දේ අත්හදා බැලීම සඳහා නිතර කුතුහලයෙන් පසුවන නව යොවුන් කණ්ඩායම් අතර මත්ද්‍රව්‍ය පාවිච්චි කර බැලීමට පෙළඹුමක් ඇති වනවා. මේ බව සඳහන් කරන්නේ හෙල්දි ලංකා ආයතනයේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා අමදාපප මහා සභාවේ ලේකම්, මත්ද්‍රව්‍ය නිවාරණ සහ මනෝවිද්‍යා උපදේශක මහේන්ද්‍ර ජයසිංහ. ඔහු පවසන පරිදි අභියෝග භාර ගන්නට කැමති, දඟ, කඩිසර, බිය-සැක නැති, ක්‍රියාශීලී, නිතර කණ්ඩායම් වශයෙන් හැසිරෙන, නිදහස භුක්ති විඳින්නට කැමති යෞවන කණ්ඩායමක එක් අයකු මත්ද්‍රව්‍යවලට පෙළඹුණහොත් කණ්ඩායමේ තවත් අය අනුකරණය හෝ අත්හදාබැලීම ඔස්සේ ඒ වෙත යොමු වීමටයි අවදානමක් පවතින්නේ. පසුව අත්හදා බලන නවකයාට දැනෙන ද්‍රව්‍යයේ ආගන්තුක බවට අනෙක් අය විවිධ අර්ථකථන දෙනවා. කණ්ඩායමේ අය මේ භාවිතයට කෙරුම්කාර බවක්, වීරත්වයක් ආරෝපණය කරනවා. එම ආරෝපණය නිසා ද්‍රව්‍යයෙන් දැනෙන අපහසුව මැඩපවත්වාගෙන භාවිතයේ යෙදීම පහසු කරවනවා. එවිට එය පුරුද්දක් බවටත් පුරුද්ද ඇබ්බැහියක් බවටත් පත්වීමෙන් මත්ද්‍රව්‍ය නැතිව ම බැරි තත්ත්වයට කෙනකු පත්වන බවත් ඔහු ප්‍රකාශ කරනවා.

වැඩිහිටියන් සිදු කළ යුත්තේ එවැනි පෝස්ටු හෝ මාධ්‍ය ප්‍රචාර හෝ ප්‍රවෘත්ති ලද සැණින් සමාජ මාධ්‍ය සාමූහික අතර ඒවා බෙදා හැරීම නොව ඒ පිළිබඳ වගකිව යුතු අංශ දැනුවත් කිරීම. පාසලේ විදුහල්පති හෝ අධ්‍යාපන උසස් බලධාරින්, පොලිසිය ඇතුළු ආරක්ෂක අංශ, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය නිවාරණ සංවිධාන, ආගමික අංශ සහ අනෙකුත් වගකිව යුතු ආයතන හෝ පිළිගත් සමාජ ක්‍රියාකාරීන් එසේ දැනුම් දීමට යෝග්‍ය පාර්ශ්ව. එවිටයි, රහස්‍යභාවය රැකගෙන වින්දිතයා මුදා ගැනීමටත් වරදකරුවන් නීතියට හසුකර ගැනීමටත් ඒ ඒ අංශවලට පහසු වන්නේ.

මත්ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ළමයින්ට පවසමින් ඔවුන් ඉන් වැළැක්වීම සඳහා මිතුරු ඇසුරින් සහ සමාජානුයෝජනයෙන් ඉවත් කර තැබීම, එතෙක් නොපැවැති අලුත් දැඩි නියාමන පැනවීම, තද නීති රීති මගින් දරුවන්ගේ ක්‍රියාකාරීත්වය පාලනය වැනි ක්‍රියාමාර්ගවලින් ම මේ සඳහා විසඳුම් ලැබෙන්නේ නැහැ. දෙමව්පියන් සහ ගුරුවරුන් විසින් දරුවන් දැනුවත් කළ යුත්තේ මෙතෙක් තමන් භාවිත කර නැති නාඳුනන ආහාර පාන, බෙහෙත් වර්ග, ඇඟ ගල්වන සහ ධූමායන ද්‍රව්‍ය, ශක්තිජනක පාන, පරිගණක ක්‍රීඩා, ලිංගික අත්හදාබැලීම් යනාදිය නිසා විවිධ හානි පැමිණෙන බැවින් තනි ව හෝ කණ්ඩායම් වශයෙන් ඒවා භාවිත කර නොබලන ලෙස පමණයි. වෙළෙඳපොළේ පවතින මත්ද්‍රව්‍යවල හැඩ, රුව, මිල, පාවිච්චි කරන ප්‍රමාණ සහ ආකාර, සඟවා තිබෙන තැන්, විකුණන ස්ථාන සහ පුද්ගලයන්, බෙදා හරින විධි ක්‍රම, පාවිච්චි කරන වයස් කාණ්ඩ, ඒවා පාවිච්චි කළ විට දැනෙන හැඟීම්, සංවේදනා යනාදිය දරුවන්ට විස්තර කිරීමෙන් වන්නේ ඔවුන් මෙතෙක් නොදුටු සහ නොවිඳි අත්දැකීමක් සොයා යාමට වක්‍ර ව මනස උනන්දු කරවීමක්. මාධ්‍ය සාකච්ඡා, වැඩමුළු, සම්මන්ත්‍රණ, ලිපි ලේඛන, විශේෂාංග රචනා, චිත්‍රපට, ටෙලි නාට්‍ය, වේදිකා නාට්‍ය, නවකතා, කෙටි කතා යනාදියෙන් නිරූපණය වන මත්ද්‍රව්‍ය සම්බන්ධ අවස්ථා ද කුතුහලය සපිරි යෞවනයන්ගේ අවධානය ඒ වෙත යොමු කරවීමට සමත්. ඒ නිසා සෑම නිර්මාණකරුවකු ම සිදු කළ යුත්තේ ඍජු ව හෝ වක්‍රාකාර ව මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනයක් සිදු නොවන නිර්මාණ.

පාසලේ විදුහල්පති හෝ අධ්‍යාපන උසස් බලධාරින්, පොලිසිය ඇතුළු ආරක්ෂක අංශ, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, මත්ද්‍රව්‍ය නිවාරණ සංවිධාන, ආගමික අංශ සහ අනෙකුත් වගකිව යුතු ආයතන හෝ පිළිගත් සමාජ ක්‍රියාකාරීන් එසේ දැනුම් දීමට යෝග්‍ය පාර්ශ්ව. එවිටයි, රහස්‍යභාවය රැකගෙන වින්දිතයා මුදා ගැනීමටත් වරදකරුවන් නීතියට හසුකර ගැනීමටත් ඒ ඒ අංශවලට පහසු වන්නේ.



අදහස් දක්වන මනෝවිද්‍යා සහ මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශක මහේන්ද්‍ර ජයසිංහ: පසුගිය තෙවසරක පමණ කාලය සැසඳීමේදී දුම්වැටි භාවිතය වැඩිහිටි ජනගහනයෙන් 12% සිට 9% දක්වා අඩු වීම, මද්‍යසාර භාවිතය වර්ධනය නොවී 19.7% මට්ටමේ පැවතීම, කාන්තා මද්‍යසාර භාවිතය එයිනුත් 1.2%ක කුඩා අගයක පැවතීම, හෙරොයින් සහ අයිස් ඇතුළු මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රස්ථාරගත කළ විට වර්ධනයක් පෙන්නුම් නොකර සරල රේඛීය ව සමාන්තර ව පැවතීම වැනි යහපත් ප්‍රවණතා දක්නට ලැබෙනවා. මේ ප්‍රතිශත අගය තවදුරටත් අවම කළ යුතුයි. ඒ සඳහා පාසල් පද්ධතියේ සෑම ව්‍යුහයක් ම එක සේ මත්ද්‍රව්‍ය භාවිතය සහ වෙළෙඳාම අධෛර්යමත් කරන ආකාරයට ක්‍රියා කළ යුතුයි. විෂයබද්ධ නොවූවත් මත්ද්‍රව්‍යවලින් සිදු වන අවාසි, මේ ද්‍රව්‍ය ව්‍යාප්ත කරවන වෙළෙඳ උපක්‍රමවලට හසු නොවී සිටින විධික්‍රම, වයසට අදාළ වන වෙනස් ප්‍රායෝගික ක්‍රියාකාරකම් යනාදිය ගැන ගුරුවරුන් පංති කාමරයේදී දරුවන් සමග කතාබහ කළ යුතුයි. ඒ, දරුවන්ට මත්ද්‍රව්‍ය අත්හදාබලන්නටවත් ආසාවක් ඇති නොවන ආකාරයට සහ ඒවායේ ව්‍යාප්තියට බලනොපාන සීමාවලට යටත් ව. පාසල් සංවර්ධන සමිති, ශිෂ්‍ය සංගම්, ක්‍රීඩා සංගම්, ගුරු සංගම් යනාදියත් එබඳු අදහස් ව්‍යාප්ත කළ යුතුයි. විශ්වවිද්‍යාල, අනෙකුත් අධ්‍යාපන ආයතන සහ පදිංචි ප්‍රදේශවල ද එසේ සිදු කළ හැකියි.

ළමයින් මත්ද්‍රව්‍ය ව්‍යාපාරය පිළිබඳ තොරතුරු සෙවීමට සහ ඔත්තු බැලීමට යොදා නොගැනීමට ද වගබලා ගත යුතුයි. දරුවන් ඊට සම්බන්ධ කරගෙන ඇති බව මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන් දැන ගතහොත් එය ළමයින්ගේ ආරක්ෂාවට තර්ජනයක්. යෞවනයන් යනු රහස්‍යභාවයට වඩා විවෘතභාවයට කැමති, මිතුරන් අතරේ පම්පෝරි ගසමින්, රස කර කර විවිධ අත්දැකීම් බෙදාහදා ගනිමින්, තමාගේ රහස්‍යභාවය තමා විසින් ම නැති කර ගන්නා පිරිසක්. ඔවුන්ගේ කතාබහ පිළිබඳ තොරතුරු මත්ද්‍රව්‍ය, පාතාලය, අපරාධ, අපචාර සමග සහසම්බන්ධ කණ්ඩායම්වලට සැලවීමෙන් ඒ ළමයින්ට ජීවිත තර්ජන පවා එල්ල වීමේ හැකියාව පවතිනවා. එය භයානක තත්ත්වයක්.



# මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේදී වැඩි අවධානයක් යොමු විය යුතු කරුණු.

★ ළමයින්ට ස්වභාවයෙන් ම පවතින කුතුහලය නිසා මත්ද්‍රව්‍ය අත්හදා බැලීම ඇබ්බැහියක් නොවන බව

★ සමවයස් මිතුරන් අතරේදී සෑම කෙනකු ම එක ම දේ කිරීම අනිවාර්ය දෙයක් නොවන බව

★ අනෙක් යහළුවන් කරන දේ තමා ද නොකළහොත් මිත්‍ර කණ්ඩායමෙන් ප්‍රතික්ෂේප වීමට හෝ උසුළු-විසුළුවලට ලක්වීමට සිදුවනවා යන්න වැරදි ආකල්පයක් බව

★ පවුලේ දෙමාපියන් සහ වැඩිහිටියන් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්නේනම් තමන් ද පාවිච්චි කළාට වරදක් නැත යන්න මෝඩ අදහසක් බව

★ මත්ද්‍රව්‍ය භාවිතය නිරර්ථක, අලාභ-පාඩු සිදුවන, නිදහසට බාධා වන, කරදරකාරී, රැවටිලිකාරී, රූපය විරූපී වන, රෝගී වන, අඩපණ වන, විරුද්ධ ලිංගිකයන්ගෙන් ප්‍රතික්ෂේප වීමට බලපාන දෙයක් බව

★ තනිකම, පාළුව, වෙහෙස මහන්සිය, සමාජ ප්‍රශ්න, පුද්ගලික ගැටලු, ආතතිය, ශාරීරික හා මානසික වේදනා යනාදිය සමනය කර ගැනීමට මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් බැරි බව සහ එමගින් ඒවා වැඩි වන බව

★ 'දෙමව්පියන්, වැඩිහිටියන් ඇතුළු පවුලේ අය විසින් තමා පිළිබඳ නිතර සොයා බැලීම ආදරය නිසා සිදුකරන්නක් විනා එය සිය නිදහසට හෝ සතුටට බාධාවක් ය' යන වැටහීම වැරදි බව.

★ මත්ද්‍රව්‍යවලින් ශරීරයේ සහ මනසේ ඇතිවන වෙනස්කම් කවරේ ද? යන්න අධ්‍යාපනික සහ පර්යේෂණමය අවශ්‍යතා සඳහා අවබෝධාත්මක ව පාවිච්චි කර බැලීම ඇබ්බැහි වීමට බල නොපාන බව

★ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූවකුට ඉන් මිදීමට නොහැකිය යන්න ව්‍යාපාරිකයන් පතුරුවන මිත්‍යාවක් බව

★ 'මත්ද්‍රව්‍ය ගෙන්වීම, බෙදාහැරීම සහ විකිණීම පහසු සහ ඉක්මන් ධනෝපායන මාර්ගයක් ය' යන අදහස බොරුවක් බව

★ සියල්ල මුදල් මත රඳා නොපවතින බව

★ පෞරුෂය බිඳවැටුණු අයට තිබෙන විකල්පය මත්ද්‍රව්‍ය පාවිච්චි කර සහනය ළඟාකර ගැනීම නොවන බව

★ සිගරැට්, බියර් වැනි දෑ, වඩාත් අන්තරායකර මත්ද්‍රව්‍ය පාවිච්චියට පුරුදු වීම සඳහා දොරගුළු හැර දෙන 'දොරටු මත්ද්‍රව්‍ය' බැවින් ඒවාට තම සිතේ දොරටු විවර කර නොදිය යුතු බව

★ දැනුවත් කිරීම් සිදු කළ යුත්තේ අවවාද, අනුශාසනා, තරවටු, පාඩම්, සැසි, යනාදියෙන් පමණක් නොව දැක බලාගෙන, ගඳ සුවඳ විඳගෙන, පාවිච්චි කරන්නන්ගේ ගති ස්වභාවය නිරීක්ෂණය කර අවබෝධවීමට වගකීමෙන් යුතු ව ඉඩ හැරීමෙන් බව

★ දඬුවමට මෙහා උපදේශනය වැනි ක්‍රියාමාර්ගයකින් නිවැරදි කර ගැනීමට හැකියාව ඇති අත්හදාබලන්නකුට, ඇබ්බැහිවූවකුට සේ සලකා දඬුවම් පැමිණවීමෙන් ඔහු හෝ ඇය මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට හෝ දිගුකාලීන පාවිච්චියට සම්බන්ධ වීමටත් සමාජයේ පිළිකුලට සහ ප්‍රතික්ෂේප වීමට භාජනය වීමෙන් අපරාධකරුවන්ගේ සහචරයකු ලෙස සැඟවී සිටීමටත් ඉඩකඩ තිබෙන බව

★ මත්ද්‍රව්‍ය භාවිතයට, ළඟ තබා ගැනීමට සහ විකිණීමට යොමු වූ දරුවන් පිළිබඳ දැන ගත් විට ඔවුන්ගේ අනන්‍යතා තොරතුරු සමාජගත නොකළ යුතු බව

★ මත්ද්‍රව්‍ය අත්හදා බලන දරුවන් පිළිබඳ තොරතුරු සඟවා තැබීම ද මත්ද්‍රව්‍ය ව්‍යාප්තියට උදව් කිරීමක් වන බැවින් එය වරදක් බව

★ ඇබ්බැහි වූ එක් දරුවකුගෙන් මිතුරු කණ්ඩායම් රැසක් අතර වුව ද මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සිදු විය හැකි බව

★ රහස්‍යභාවය සහ අනන්‍යතාව රැකෙන පරිදි, මත්ලෝලීයැයි හඳුනාගන්නා දරුවන් සිය භාරකරුවන් සහ ගුරු දෙගුරුන් විසින් නීතිය, උපදේශනය සහ ප්‍රතිකාර වෙත යොමු කළ යුතු බව

★ නීතියත් සමාජයත් විසින් දරුවාගේ ආත්මගරුත්වය සහ ආරක්ෂාව ප්‍රථම සාධකය කොට පාසලේ හෝ පවුලේ කීර්තිය ද රක්ෂා වන පරිදි සෑම විට ම ක්‍රියා කළ යුතු බව

# රජයට ගෙවන්න GovPay

රංගිකා අබේසේකර

ලෝකය අදියරෙන් අදියර ඉදිරියට පැමිණියේ තාක්ෂණික ජයග්‍රහණ හේතුවෙන්. විද්‍යාව හා තාක්ෂණයේ නව සොයාගැනීම් මානව ශිෂ්ටාචාරය එක් අදියරක සිට තවත් තලයකට ඔසවා තබනවා. රටක් නව තලයකට ඔසවා තැබිය හැකි එක ම ක්ෂේත්‍රය වන්නේ ඩිජිටල්කරණය. ශ්‍රී ලංකාවේ ඩිජිටල් සාක්ෂරතාව 66%ක්.

ඩිජිටල් ආර්ථිකයක් කරා අපට යා හැකි අවකාශය ඉතා පුළුල් වුවක්. එහි පියවරක් වශයෙන් රජය නව ඩිජිටල් ප්‍රවේශ 03ක් නොබෝදා (පෙබරවාරි 07) හඳුන්වා දුන්නා. එම ප්‍රවේශ වන්නේ සියලු ම රජයේ ගෙවීම් ඩිජිටල්කරණය කිරීමේ Govpay පහසුකම දියත් කිරීම, 1978 වසරේ සිට මෙතෙක් කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් පමණක් සිදුවූ ජනාධිපති අරමුදලේ සේවා දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341 දක්වා ව්‍යාප්ත කිරීම සහ E-BMD පහසුකම යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවෙමින් මාර්ගගත ව විදේශගත ශ්‍රී ලාංකිකයන්ට තානාපති කාර්යාලවලින් උප්පැන්න, විවාහ හා මරණ සහතිකවල පිටපත් ලබාගැනීමට අවස්ථාව සලසා දීම.

ඩිජිටල්කරණය පිළිබඳ ලෝකයේ පර්යේෂණ හා අධ්‍යයනය කරන ආයතනවලට අනුව ඩිජිටල්කරණයකට යාම ම රටක ආර්ථිකය 1-5% දක්වා වර්ධනයකට යාමේ හැකියාවක් පෙන්වන බවයි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ උපදේශක සහ ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංජය කරුණාසේන ප්‍රකාශ කරන්නේ.

ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලිය යටතේ සයිබර් ආරක්ෂණ පනත (නව), ඩිජිටල් ආර්ථික අධිකාරී පනත (නව), කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ව ජාතික සභාව (National Council on Ai) හෝ සමාන ආයතනයක් පිහිටුවීමට අදාළ පනත්, 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත සඳහා යෝජිත පනත් හා සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. අනන්‍ය ඩිජිටල් හැඳුනුම (SLUD) හා e-NIC ව්‍යාපෘතිය, රජයේ මධ්‍යගත දත්ත හුවමාරුව (NDx), සයිබර් ආරක්ෂණ මධ්‍යගත ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC), රජයේ ගෙවීම් පද්ධතිය (Govpay), මධ්‍යගත ඩිජිටල් සේවාව (LGC, LGN, Gov Email), අංකිත සේවා යටතේ මෙරට රූපවාහිනී පද්ධතිය යථාවත් කිරීම (Digital Tv), තොරතුරු තාක්ෂණ කර්මාන්ත ක්ෂේත්‍රයේ ධාරිතා සංවර්ධනය (ICT Industry Capacity Building) ලෙස ප්‍රධාන ව්‍යාපෘති ඒකාබද්ධ කරමින් ඩිජිටල්කරණ ක්‍රියාවලිය සැලසුම්ගත ව ක්‍රියාත්මක වන බවයි සංජය කරුණාසේන ප්‍රකාශ කරන්නේ. 2025 වසරේ සමස්ත ඩිජිටල්කරණ වැඩසටහන වෙනුවෙන් වෙන් කර ඇති මුදල රුපියල් බිලියන 13ක්.

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන ඩිජිටල්කරණ ව්‍යාපෘති අතර රජයේ ගෙවීම් පද්ධතිය (Govpay) ප්‍රමුඛ වන්නක්. ගනුදෙනු සඳහා නෝට්ටු හා කාසි ලෙස මුදල් භාවිත කිරීමට වාර්ෂික ව දළ දේශීය නිෂ්පාදිතයෙන් ආසන්න වශයෙන් 1.5%ක් වැය වන බව ඇස්තමේන්තු කර තිබෙනවා. නෝට්ටු හා කාසි ලෙස මුදල් ගෙවීමේදී සිදු වන වංචා සහ දූෂණ, ගෙවීම් ක්‍රියාවලියෙහි අකාර්යක්ෂමතාව වැඩි කිරීමට හේතු වනවා. රාජ්‍ය අංශයේ සිදු වන මෙවැනි ගැටලු විසඳීම සඳහා රජයේ ආයතන වෙත කෙරෙන සියලු ම ගෙවීම් සඳහා රාජ්‍ය පද්ධතියේ ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහනක් ලෙස Govpay පහසුකම හඳුන්වා දී තිබෙනවා.

ගනුදෙනු සඳහා නෝට්ටු හා කාසි ලෙස මුදල් භාවිත කිරීමට වාර්ෂික ව දළ දේශීය නිෂ්පාදිතයෙන් ආසන්න වශයෙන් 1.5%ක් වැය වන බව ඇස්තමේන්තු කර තිබෙනවා. නෝට්ටු හා කාසි ලෙස මුදල් ගෙවීමේදී සිදු වන වංචා සහ දූෂණ, ගෙවීම් ක්‍රියාවලියෙහි අකාර්යක්ෂමතාව වැඩි කිරීමට හේතු වනවා. රාජ්‍ය අංශයේ සිදු වන මෙවැනි ගැටලු විසඳීම සඳහා රජයේ ආයතන වෙත කෙරෙන සියලු ම ගෙවීම් සඳහා රාජ්‍ය පද්ධතියේ ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහනක් ලෙස Govpay පහසුකම හඳුන්වා දී තිබෙනවා.

රජය වෙනුවෙන් සිදු කරන මාර්ගගත ගෙවීම් ද නිත්‍යානුකූල බව 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු

පනතේ විධිවිධාන අනුව පෙනී යන්නක්. Govpay යනු ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකයක් බිහිකිරීමේ රජයේ උත්සාහයේ මූලික පියවරක්. ඉන් බිහි වන්නේ මුදල් භාවිත නොකරන සමාජයක්. පුරවැසියන්ට විවිධ රාජ්‍ය සේවා සඳහා ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ගෙවීම් කිරීමට හැකියාව සලසා දීමයි මේ ඔස්සේ අපේක්ෂා කරන්නේ. ඒ, නාගරික සහ ග්‍රාමීය ජනතාවට සමාන ව ප්‍රතිලාභ ලබාදෙන අයුරින් රාජ්‍ය අංශයේ ආයතනවල කාර්යසාධන හැකියාව වැඩිදියුණු කිරීම, පරිපාලන පියවර අඩු කිරීම සහ රාජ්‍ය සේවා පුළුල් කිරීමෙන් ජනතාවට පහසුකම් සැලසීමේ රජයේ ප්‍රධාන උපායමාර්ගවලට අනුකූල වීම මෙහි විශේෂත්වයක්.

Govpay ඔස්සේ සම්ප්‍රදායික ගෙවීම් ක්‍රමවලට වඩා පහසු, ඵලදායී ඩිජිටල් විකල්පයක් ලබාදීමෙන් රජයේ සේවා




ලබා ගැනීම පහසු වනවා. මෙරට වැඩිහිටි පුරවැසියන්ගෙන් 80%ට වැඩි පිරිසක් බැංකු ගිණුම් සහිත බැවින් විවිධ මාර්ගගත හා දුරස්ථ ක්‍රමවලින් නිවසේ හෝ සේවා ස්ථානයේ සිට හෝ ගෙවීම් කළ හැකියි. දිගු පෝලිම් සහ විශාල වශයෙන් ලියකියවිලි භාවිතයෙන් මතු වන අපහසුතා රැසක් වැළැක්වීමට එහිදී අවකාශ ලැබෙනවා. මෙය රජයේ ගනුදෙනුවල විනිවිදභාවය වැඩි කිරීමටත් මූල්‍ය අන්තර්ගතභාවය (financial inclusion) ප්‍රවර්ධනය කරමින්, ග්‍රාමීය ජනතාව ද ඇතුළත් වන පරිදි සමස්ත ජනගහනයෙන් වැඩි පිරිසකට ඩිජිටල් ගෙවීම් පහසුකම් ලබා දීමේත් මූලික පියවරක්.

මේ වැඩසටහනේ පළමු අදියර යටතේ මූලික ව රජයේ ආයතන 20ක සේවා සඳහා ඩිජිටල් තාක්ෂණය ඔස්සේ ගෙවීමට පහසුකම් ලබා දෙනවා. ආයතන 60කට සහ මේ වසරේ අප්‍රේල් මාසය වනවිට තවත් ආයතන 30කට මෙය හඳුන්වා දීමට සැලසුම් කර තිබෙන බව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම් (වැ.බ) වරුණ ශ්‍රී ධනපාල සඳහන් කරන්නක්. මේ ක්‍රියාවලියේ අනෙක් පාර්ශ්වකරුවන් වන්නේ ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) සහ ශ්‍රී ලංකා මහ බැංකුවට අනුයුක්ත LankaPay ආයතනය. මේ ක්‍රමවේදයෙන් රජයේ විවිධ ස්ථරවල රාජ්‍ය ආදායම් තත්‍යකාලීන ව ගිණුම්ගතවීමෙන් (Realtime accounting) රාජ්‍ය මූල්‍ය පාලනය හා භාණ්ඩාගාර මෙහෙයුම් වඩාත් පහසු වනු ඇති.

අදහස් දක්වන සංජය කරුණාසේන; "GovPay අමතර ව රජය Lanka QR නම් QR කේතයක් මත පදනම් වූ ගෙවීම් පුළුල් ලෙස ප්‍රවර්ධනය කිරීමටත් සැලසුම් කර තිබෙනවා. පරිශීලක අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ප්‍රචාර සිදු කිරීමටත් ගනුදෙනු ගාස්තු ක්‍රමයෙන් අඩු කිරීම සහ මුදලින් ගෙවීමට වඩා ඩිජිටල් ගෙවීම් සඳහා අමතර ප්‍රතිලාභ ලබා දීමටත් අපේක්ෂා කරනවා.  මේ සියල්ලේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාව සඳහා වඩාත් විනිවිදභාවය සහිත, ඵලදායී මූල්‍ය පද්ධතියක් හා විශ්වසනීය ඩිජිටල් මාධ්‍ය ගනුදෙනු පරිසරයක් සකස් කිරීම."

මේ වැඩසටහනට සමගාමී ව රජයට සිදු කරන ගෙවීම් සනාථ කිරීමක් ලෙස කෙටි පණිවිඩ සේවාවක් (SMS) ක්‍රියාත්මක කිරීමටත් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සූදානම්. ඉ රාජ්‍යයෙහි ප්‍රධාන අවශ්‍යතාව වන කඩදාසි භාවිතයෙන් තොරවීම (Paperless), මුදල් නෝට්ටු භාවිතයෙන් තොරවීම (Cashless) හා පුද්ගලයන් පෙනී සිටීමේ අවශ්‍යතාව බැහැර කිරීම (Presenceless) යන ඉලක්ක එයින් සපුරා ගන්නට පුළුවන්. පෝලිම් ක්‍රම අවම කර ජනතාවගේ කාලය ඉතිරි කිරීමෙන් ආර්ථික කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් මේ වැඩසටහනේ අරමුණක්. මේ පිළිබඳ අදහස් දක්වන ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම් (වැ.බ) වරුණ ශ්‍රී ධනපාල; "වර්තමානයේ ජනතාව අදාළ ආයතන වෙත ගොස් ගෙවීම් සිදු කළ යුතුයි. එහිදී ඇතැම් ආයතන අංක ක්‍රමයක් යටතේ පෝලිම් ක්‍රමයට එම සේවා ක්‍රියාත්මක කරනවා. ඇතැම් ආයතන පෝලිම් ක්‍රමය පමණක් ඊට යොදා ගන්නවා. රජයේ ගෙවීම් ක්‍රම සිදු කරන ආකාරය රට අනුව වෙනස්. එහෙත් ඒවාට සාමාන්‍යයෙන් සුභ සාධන ප්‍රතිලාභ, විශ්‍රාම වැටුප්, වැටුප්, බදු ආපසු ගෙවීම් සහ වෙනත් පොදු අරමුදල් බෙදාහැරීමේ ක්‍රම ඇතුළත් වනවා."

ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ අන්තර්ජාල භාවිතය පහළ මට්ටමක පැවතීම, ඇතැම් ජනතාව ගෙවීම් සඳහා රිසිට්පත් බලාපොරොත්තු වීම, අන්තර්ජාල ගෙවීම් පද්ධති පිළිබඳ ඇති වැරදි ආකල්ප හා අවිශ්වාසය, කාඩ්පත් ගනුදෙනුවලදී වන මූල්‍ය වංචාවලට ඇති බිය යනාදී ප්‍රායෝගික ගැටලු ගණනාවක් ශ්‍රී ලංකාවේ මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී පැන නගින බව අමාත්‍යාංශ ලේකම්වරයා පෙන්වා දෙනවා.

ඩිජිටල්කරණයට සමස්ත පද්ධතියේ ම කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරන හෙයින් ඉන් රජයට අත්වනු ඇත්තේ ඉතා ඉහළ ප්‍රතිලාභ. එසේ ම ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමෙන් ශ්‍රමයෙහි අකාර්යක්ෂමතාව සහ ඇතැම් දූෂිත භාවිත ඉවත් කිරීම මෙන් ම ඉදිරියේදී මහජනතාවට වඩාත් පහසු සේවා සැපයීමක් ද සිදු කරනු ඇති.



# තැනුමට තිරසර හෙටක් සවිමත් ඇය වේ මඟක්

බිනූ දිලාරා ගමගේ

මවක, මිත්තණියක, සහෝදරියක, දියණියක, යෙහෙළියක ආදී වූ විවිධ සමාජ භූමිකා ඉටු කරන කාන්තාව නොමැති ව සමාජයේ පැවැත්මක් ද නැහැ. ඉතිහාසයේ විවිධ අවධි පසු කරන ලද මානවයා විසින් කාන්තාව කවුරුන්ද යන වග හඳුනා ගනු ලැබීමේ කාර්යය අද දක්වා ම අඛණ්ඩ ව සිදු කෙරෙනවා. එහි එක් සන්ධිස්ථානයක් වශයෙන් සෑම වසරක ම මාර්තු මස 08 දින සමරන 'ජාත්‍යන්තර කාන්තා දිනය' හඳුන්වා දීමට පුළුවන්. ඒ අනුව කාන්තාව වෙනුවෙන් දිනයක් වෙන් කරමින් ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවට ළඟා වීමට ඇති ශක්‍යතාව පිළිබඳ කතිකාව හා ඒ සඳහා වන වැඩපිළිවෙළ වසරක් පාසා විමසා බැලීමට ලෝකය වග බලා ගන්නවා.

මුල්කාලීන ව 'කම්කරු ජාත්‍යන්තර කාන්තා දිනය' යනුවෙන් හඳුන්වන ලද 'ජාත්‍යන්තර කාන්තා දිනය' නිර්මාණය වීමට පසුබිම සැකසෙන්නේ වසර සියයකට වඩා දුර ඉතිහාසයක සිට. ඒ, 1908 වසරේදී. ධනපතියන් විසින් කම්කරුවන්ට නියම කරන ලද දරුණු සේවා කොන්දේසි සහ කම්කරු ශ්‍රමය අධික ලෙස සූරාකෑමට එරෙහි ව සේවක පැය ගණන අඩු කිරීමටත් වඩා හොඳ වැටුපක් සහ තමන්ට ඡන්ද අයිතිය ඉල්ලා සිටීමටත් විරෝධතා පා ගමන් සඳහා කාන්තාවන් 15,000ක් පළමු වරට නිව්යෝර්ක්හි වීදි බැසීම සිදු වුණා. මෙවැනි පසුබිමක ඇමරිකාවේදී සමාජවාදී

> මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයේදී දකින්නට ලැබෙන සුවිශේෂ කරුණක් වශයෙන් තේමා ද්විත්වයක් මුල් කර ගැනීම පෙන්වා දීමට පුළුවන්. එසේ ම ජාත්‍යන්තර කාන්තා දිනය සැමරෙන මේ වර්ෂය සෙසු වසරවලට වඩා සුවිශේෂ වන්නේ රටවල් 189 අත්සන් කරමින් කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළ 1995 වසරේ බීජිං ප්‍රකාශනයේ 30 වැනි සංවත්සරය එළඹීමත් නිසා.

පක්ෂය වර්ජකයන්ට ගෞරවයක් ලෙසින් 'ජාතික කාන්තා දිනයක්' 1909දී ප්‍රකාශයට පත් කළා. පළමු ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම 1911දී යුරෝපයේ මිලියනයකට අධික පිරිසකගේ සහභාගිත්වයකින් සිදු ව ඇතත් මාර්තු මස 08 දිනය ජාත්‍යන්තර කාන්තා දිනය වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කිරීම සිදු ව ඇත්තේ 1977 වසරේදී.

2025 වසරේදී ජාත්‍යන්තර කාන්තා දිනය සමරන්නේ ලොව පුරා ජීවත්වන කාන්තාවන්ගේ ආගමික, ජනවාර්ගික, කුලය, වර්ණය, ලිංගික අනන්‍යතාව, ආබාධිතභාවය ආදී වූ සියලු ම විවිධත්ව අගයමින් "සියලු ම කාන්තාවන් සහ ගැහැනු දැරියන් සඳහාඃ අයිතිවාසිකම්, සමානත්වය, සවිමත් කිරීම" (For All Women and Girls: Right, Equality, Empowerment) යන තේමාව පදනම් කරගෙන. සාමය සහ නිදහස සඳහා වූ ජාත්‍යන්තර කාන්තා ලීගයට (WIPLF) අනුව මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයේ අපේක්ෂිත ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව අත්පත් කර ගැනීමට අනුගමනය කරන වැඩපිළිවෙළ වඩා වේගවත් කිරීම (#Accelerated Action) මුඛ්‍ය අරමුණක් වශයෙන් ගෙන අවධානය යොමු කර තිබෙනවා. ඔවුන් පවසන්නේ පවතින ප්‍රගතියේ වේගයෙන් ගමන් කරන්නේ නම් ඒ සඳහා 2158 වසර දක්වා බලා

සිටීමට සිදුවනු ඇති බව. එම නිසා මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයේදී දකින්නට ලැබෙන සුවිශේෂ කරුණක් වශයෙන් තේමා ද්විත්වයක් මුල් කර ගැනීම පෙන්වා දීමට පුළුවන්. එසේ ම ජාත්‍යන්තර කාන්තා දිනය සැමරෙන මේ වර්ෂය සෙසු වසරවලට වඩා සුවිශේෂ වන්නේ රටවල් 189 අත්සන් කරමින් කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළ 1995 වසරේ බීජිං ප්‍රකාශනයේ 30 වැනි සංවත්සරය එළඹීමත් නිසා.

ජාත්‍යන්තර කාන්තා දින සැමරුමට සමගාමී ව කාන්තාව සවිබල ගැන්වීම සඳහා වැඩි අවධානයක් යොමු කරමින් 'තැනුමට තිරසර හෙටක්, සවිමත් ඇය වේ මඟක්' යන්න තේමාවෙන් මෙවර 'ජාතික කාන්තා දිනය' ශ්‍රී ලාංකිකයන් සමරනවා. ඒ, කාන්තාවන් 200කට ආසන්න පිරිසක් සහභාගි කර ගනිමින් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් මාර්තු 07 දින සුහුරුපාය පරිශ්‍රයේදී. 2025 මාර්තු 02 - 08 වෙනිදා දක්වා මෙවර කාන්තා දිනය වෙනුවෙන් කාන්තා සතියක් ප්‍රකාශයට පත්කර ඒ ඒ දිනවලදී වෙනස් වූ තේමා යටතේ දීපව්‍යාප්ත විවිධ වැඩසටහන් පවත්වන බවත් ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පී.එල්. සුසන්ත ධර්මකීර්ති පවසනවා.

ගැහැනිය සහ පුරුෂයා සෑම ආකාරයෙන් ම එක හා සමාන බව පැවසිය නොහැකියි. ගැහැනිය පුරුෂයාට වඩා ජීව විද්‍යාත්මක ව සලකා බලන විට ශරීරයෙන්, මනස ක්‍රියාත්මක වන ආකාරයෙන්, චින්තන ධාරාව, අධ්‍යාත්මය, විවිධ ශක්‍යතාවලින් පවා එකිනෙකට වෙනස්. ගැහැනිය සහ පුරුෂයා නිරායාසයෙන් ම හසුවන සංස්කෘතික කලාපයක් ද පවතිනවා. කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන්තිකා ප්‍රියදර්ශනී, ප්‍රංශ ජාතික ස්ත්‍රීවාදිනියක් වන සිමෙන් ඩි බුවර්ගේ (Simon De Beauvoir) ස්ත්‍රිය පිළිබඳ අර්ථකථනය අනුමත කරමින් පවසන්නේ ස්ත්‍රිය ජීව විද්‍යාත්මක ශරීරය නිසා ම ස්ත්‍රියක් බවට පත් නොවූ බවත් ඇය ව සමාජය විසින් ස්ත්‍රියක් ලෙසින් නිෂ්පාදනය කරන ලද්දක් වන බවත්. පුරුෂ මූලික සමාජයක සමාජය විසින් පනවනු ලැබූ රාමුවක සිට තමන්ගේ ශ්‍රම දායකත්වය සැපයීමට කාන්තාවට අතීතයේ සිට ම සිදු වූ බවයි ඇයගේ අදහස. එම පුරුෂ මූලික දෘෂ්ටිකෝණය හුදෙක් පුරුෂයා ම පමණක් නොව එයින් පෝෂණය වූ ගැහැනිය විසින් ද මෙහෙයවනු ලබන්නක්. ගැහැනු දරුවා කුඩා කාලයේදී ම ඇයට බෝනික්කකු අතට දී හුරු කරන්නේ ම පුරුෂයා විසින් ඇයට කාන්තාවක් ලෙසින් පවරා දී තිබෙන දරුවන් බලා ගැනීම, ආහාර පිසීම ඇතුළු නිවසේ වැඩ සියල්ල බලා ගැනීමේ කාර්ය සඳහා. එබැවින් ඇය 'වැඩ ඇරී වැඩට යන' කාන්තාව. ධනවාදී සමාජයක කාන්තාවට බොහෝ නිම්වළලු අතික්‍රමණය කරමින් අධ්‍යාපනය ලැබීමට, මුදල් ඉපැයීමට, රැකියාවක නිරත වීමට, තාක්ෂණය භාවිත කිරීමට අවස්ථාව ලබා දුන්නත් කාන්තාවක් ලෙසින් ඇයට

ගැහැනු දරුවා කුඩා කාලයේදී ම ඇයට බෝනික්කකු අතට දී හුරු කරන්නේ ම පුරුෂයා විසින් ඇයට කාන්තාවක් ලෙසින් පවරා දී තිබෙන දරුවන් බලා ගැනීම, ආහාර පිසීම ඇතුළු නිවසේ වැඩ සියල්ල බලා ගැනීමේ කාර්ය සඳහා. එබැවින් ඇය 'වැඩ ඇරී වැඩට යන' කාන්තාව. ධනවාදී සමාජයක කාන්තාවට බොහෝ නිම්වළලු අතික්‍රමණය කරමින් අධ්‍යාපනය ලැබීමට, මුදල් ඉපැයීමට, රැකියාවක නිරත වීමට, තාක්ෂණය භාවිත කිරීමට අවස්ථාව ලබා දුන්නත් කාන්තාවක් ලෙසින් ඇයට නිවසේ ඉටු කිරීමට සිදු ව ඇති වැඩ රාජකාරි අඩු කරන්නට සමාජය සූදානම් නැහැ.

නිවසේ ඉටු කිරීමට සිදු ව ඇති වැඩ රාජකාරි අඩු කරන්නට සමාජය සූදානම් නැහැ. ඇය කෙතරම් වගකීම් සම්භාරයක් වෘත්තීය ජීවිතයේ ඉසිළුවත් නැවතත් නිවසට පැමිණ ඇයට හිමි නිවසේ කාර්ය සියල්ල ඉටු කිරීමටත් එම නිසා සිදුවනු ඇති. එබැවින් නිවසේ වැඩ 'ගැහැනු වැඩ' යනුවෙන් අද සමාජයේ අර්ථකථනය වීම වැළැක්විය නොහැකි බවයි ඇය පෙන්වා දෙන්නේ.

'කාන්තාව' යන්න පුරුෂයාගේ දෘෂ්ටිකෝණයෙන් අර්ථකථනය වීමට මූලික හේතුවක් වන්නේ විවිධ ක්ෂේත්‍ර සඳහා කාන්තාවගේ දායකත්වය සහ අදාළ ක්ෂේත්‍රවල විධායක තලයේ කාන්තාවට ඇති අවකාශය සීමා සහිත වීම. නිදසුනක් ලෙස සාහිත්‍යයේ කාන්තාව අර්ථකථනය වන්නේ පුරුෂයා අතින්. කාන්තාව සඳහා සමාජය විසින් ලබා දෙන්නා වූ බොහෝ අවස්ථා නිර්මාණය වීම සිදු ව තිබෙන්නේ ද යටපෙළෙහි සැඟවුණු පුරුෂමූලික අවශ්‍යතා නිසා වන බවයි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන්තිකා ප්‍රියදර්ශනී සඳහන් කරන්නේ. යටත්විජිත සමයේදී කාන්තාවන් සඳහා අධ්‍යාපනය ලබා දීම සාධනීය කාරණාවක් සේ පෙනී ගියත් එහි යටි අරමුණ වූයේ හුදෙක් කාන්තාවන් පරිපාලනය සඳහා දායක කර ගැනීම නොව ඒ වනවිට සමාජයේ නැඟී එමින් පැවති ඉහළ මධ්‍යම පන්තියේ පවුල් සඳහා හොඳ බිරින්දෑවරු පිරිසක් නිර්මාණය කරලීම. කාන්තාවක් වීම නිසා වර්තමානයේදී පවා ගැහැනිය අපහාසයට ලක් වීම්, චෝදනාවලට හේතු වීම්, විවිධ හිංසනවලට ගොදුරු වීම් දක්නට ලැබෙනවා. වෘත්තයීමය ක්ෂේත්‍රයේ ඉහළට යාමේදී 'ගැහැනියක් වීම' නිසා අනුමත නොකරන, පිළිනොගන්නා අවස්ථා සමාජයේ කොතෙකුත් හමු වනවා. එම නිසා කාන්තාවක් වශයෙන් විවිධ වෘත්තිවල නියැළීමේදී කාන්තාවක් වීම නිසා ම බොහෝ අභියෝගවලට මුහුණදීමට සිදු වනවා. සමාජය බොහෝ විට උත්සාහ ගන්නේ කටු කම්බි, ගඩොල්වලින් ගැහැනිය වටා සීමා අඳින්නට මිස කාන්තාවට ශක්තියක් වෙමින් ඔවුන් ව නඟා සිටුවීමට නොවෙයි. එම නිසා මෙවර කාන්තා දිනය වෙනුවෙන් කාන්තාව සවිබල ගැන්වීමට තේමා කර ගැනීම වඩාත් කාලීන බවයි ඇයගේ අවධාරණය.




මහාචාර්ය නීතිඥ
**ප්‍රතිභා මහනාම හේවා**
මණ්ඩපාධිපති
ශ්‍රීපාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය


# ස්වාධීන අභිචෝදක **අධ්‍යක්ෂවරයෙක්**

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් වන පරිදි ස්වාධීන අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කිරීමට අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය තීරණය කර තිබෙනවා. මේ, ඒ පිළිබඳ විද්වත් කතාබහක්.

ස්වාධීන අභිචෝදක කාර්යාලය ස්ථාපිත කිරීමෙන් පත් කෙරෙන 'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ තනතුර' අභිනවයෙන් ඇති කරන තනතුරක් නොවෙයි. 1970 සිට 1977 දක්වා කාලයේ 'රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ තනතුර' නොඑසේනම් 'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ තනතුර' පැවතුණේ අදට නීතිපතිවරයා යටතේ පවතින සියලු ම අපරාධ නඩු මෙහෙයවීමට. ශ්‍රී ලංකාවේ පමණක් නොවෙයි සියලු පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල මේ තනතුර තිබුණා. මින් පෙර එම තනතුර යටතේ කාර්ය මණ්ඩලයක් සිටියා. 'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ' මෙහෙයවන්නේ අපරාධ නඩු පමණයි. එහෙත් 1977දී බලයට පැමිණි ආණ්ඩුව එය අහෝසි කළා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මේ තනතුර ඇතුළු නොකර ඒ සියලු ම බලතල නීතිපතිවරයා වෙත පවරා දුන්නා. එහි යම් පමණකට දේශපාලනීකරණය වීමක් දක්නට ලැබුණා. සාමාන්‍යයෙන් නීතිපතිවරයා විසින් ඕනෑ ම රටක මෙහෙයවනු ලබන්නේ සිවිල් නඩු පමණයි. අපරාධ නඩු මෙහෙයවන්නේ නැහැ. නීතිපතිවරයා ස්වාධීන පුද්ගලයෙක්. නීතිපති පත්කෙරෙන්නේ ව්‍යවස්ථාදායක සභාවෙන් නිසා යම් තරමක ස්වාධීනත්වයක් ඔහු වෙත තිබෙනවා. දැන් නැවත 'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ' එහෙම නැත්නම් 'රජයේ අපරාධ නඩු අධ්‍යක්ෂ' තනතුර ඇති කරන්නට සූදානමක් තිබෙනවා. එය දේශපාලනීකරණය නොවිය යුතුයි.

මේ තනතුර ඇතිකිරීමට සහ ඒ යටතේ කාර්යාලයක් පිහිටුවීමට නම් පළමු ව පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් යොමු කළ යුතු වනවා. මෙය ව්‍යවස්ථාවත් සමග සම්බන්ධ වන කාරණයක් නිසා සම්මත කර ගත යුතුයි විශේෂ පනතක්.

> ස්වාධීන විය යුතු ස්වාධීන අභිචෝදක කාර්යාලයෙන් වෘත්තීයමය වශයෙන් ඉතා කාර්යක්ෂම නඩු පැවරීමේ කාර්යය ඉටු විය යුතුයි. ඒකාග්‍රතාව, විනිවිදභාවය, ඒ සියල්ලට ම ඉහළින් මහජන විශ්වාසය ගොඩනගා ගැනීම එහිදී අවශ්‍යයි. මේ කාර්යාලය පිහිටුවීම තව ම තිබෙන්නේ සාකච්ඡා මට්ටමේ. ඒ සඳහා යම් කාලයක් ගත වනවා. එය නිසි නෛතික ක්‍රමවේදය අනුව පිහිටු විය යුතුයි. රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය නිශ්චිත ව පරිපාලනය කරමින් මහජනතාව තුළ විශ්වාසයක් ගොඩනගන්නයි මේ අභිචෝදක කාර්යාලය ගෙන එන්නේ. මෙය නීතිපති දෙපාර්තමේන්තුව මෙන් අධ්‍යක්ෂවරයකු සිටින

ඇතැම් විට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන්න පුළුවන් 2/3ක බලයක් අවශ්‍ය බවත්. කුමනාකාරයෙන් පිහිටුවූවත් මේ කාර්යාලය ස්වාධීන ව මෙහෙයවීම වැදගත්.

මෙය පිහිටුවීමෙන් එක අංශයකින් සිවිල් නඩුත් තවත් අංශයකින් අපරාධ නඩුත් මෙහෙයවීම සිදු වනවා. 71 කැරැල්ල අවස්ථාවේ පවා නඩු මෙහෙයවූවේ ස්වාධීන අභිචෝදක කාර්යාලයෙන්. එහෙම නැත්නම් විශේෂ අපරාධ කොමිසමකින්. වර්තමානයේදීත් අභිචෝදක කාර්යාලය පිහිටුවීමෙන් පසුව ගොනු වන නඩු ස්වාධීන අභිචෝදක කාර්යාලයේ ම තබන්නත් පුළුවන්. නැත්නම් 71 කැරැල්ලේදී සිදු වූවාක් මෙන් විශේෂ කොමිෂන් සභාවක් පත්කරන්නත් පුළුවන්.

යෝජිත ස්වාධීන අභිචෝදක කාර්යාලය ස්ථාපිත කිරීමට නීතිපති හෝ ඔහු විසින් නම් කරන නියෝජිතයන්, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, අධිකරණ සේවයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයෙක්, ශ්‍රී ලංකා නීතිඥ සංගමය සම්බන්ධ විය යුතුයි. පනත් කෙටුම්පතක් ගෙන ආ යුතුයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන ලෙස. මේ බලය ලබා දිය යුත්තේ ප්‍රවේශමෙන්. ඒ නිසා එම බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ම හිමි වීම වැදගත්. එසේ නැත්නම් එම බලය මූලික වශයෙන් ම වෙන ම පනතක් යටතේ ලබා ගන්න පුළුවන්.

මේ කාර්යාලය පිහිටුවූවාට පසු 'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ' වෙත ලැබෙන්නේ නීතිපතිට තිබෙන අපරාධ නඩු මෙහෙයවීමේ බලය. ඔහුත් රජයට උපදෙස් දෙන නිලධාරියෙක්. නඩු පැවරීමට, සාක්ෂි නොමැතිනම් ඕනෑ ම අවස්ථාවක අපරාධ නඩුවක් ඉවත් කරගැනීමට 'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ'ට බලය තිබෙනවා. මෙහිදී නීතිපතිට ඇති අපරාධ නඩු පැවරීමේ බලය ඉවත් වනවා.

අවශ්‍යනම් 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තිබෙන නිසා රටට ම එක් අයකු වෙනුවට පළාත් 9ට ම ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂවරු පත් කරන්න පුළුවන්. එවිට ස්වාධීනත්වයත් රැකෙන්නට තිබෙන අවකාශය වැඩියි. වෙන රටවල එවැනි ක්‍රමයක් නැහැ. නමුත් මා මේ තර්කය ගෙනෙන්නේ ශ්‍රී ලංකාවේ පළාත් සභා තිබෙන නිසා. 'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ'ට අපරාධ නඩු පැවරීමේ, නඩු නැවැත්වීමේ, ඉල්ලා අස්කරගැනීමේ, නැවත ගෙනඒමේ බලතල ලැබෙනවා.

යම් යම් අවස්ථාවලදී මහජනතාවගේ, සිවිල් සංවිධානවල සහ ජනමාධ්‍යවේදීන්ගේ අවධානය යොමු වෙනවා 'අධිකරණ පද්ධතියෙන් සැමට යුක්තිය, සාධාරණත්වය ලැබිය යුතුයි' යන කාරණය සම්බන්ධයෙන්. අයුක්තියකදී, අසාධාරණයකදී පිහිටක් ලබා ගන්න ස්ථානයක් නැති සිවිල් ජනතාවට පවා මේ ස්වාධීන අභිචෝදක කාර්යාලයට පෙත්සමක් ඉදිරිපත් කරන්න පුළුවන්. රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු සම්බන්ධ ව පැමිණිල්ල මෙහෙයවීම මේ කාර්යාලයට සම්පූර්ණයෙන් ලැබෙන නිසා මගේ තර්කය වන්නේ මේ කාර්යාලය පිහිටුවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව සිදු විය යුතු බවයි. ඇතැම් රටවල මේ කාර්යාලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමග අනුකූල වීමක් නැහැ. මහා බ්‍රිතාන්‍යය එවැනි රටක්. එරට ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොමැති නිසා මෙය ක්‍රියාත්මක වන්නේ වෙන ම ක්‍රමවේදයකට.

ස්වාධීන විය යුතු මේ කාර්යාලයෙන් වෘත්තීයමය වශයෙන් ඉතා කාර්යක්ෂම නඩු පැවරීමේ කාර්යය ඉටු විය යුතුයි. ඒකාග්‍රතාව, විනිවිදභාවය, ඒ සියල්ලට ම ඉහළින් මහජන විශ්වාසය ගොඩනගා ගැනීම එහිදී අවශ්‍යයි. මේ කාර්යාලය පිහිටුවීම තව ම තිබෙන්නේ සාකච්ඡා මට්ටමේ. ඒ සඳහා යම් කාලයක් ගත වනවා. එය නිසි නෛතික ක්‍රමවේදය අනුව පිහිටු විය යුතුයි. රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය නිශ්චිත ව පරිපාලනය කරමින් මහජනතාව තුළ විශ්වාසයක් ගොඩනගන්නයි මේ අභිචෝදක කාර්යාලය ගෙන එන්නේ. මෙය නීතිපති දෙපාර්තමේන්තුව මෙන් අධ්‍යක්ෂවරයකු සිටින දෙපාර්තමේන්තුවක්.

අපරාධ සම්බන්ධයෙන් මූලික විමර්ශන කෙරෙන්නේ පොලිසියෙන් නිසා පිහිටුවීමට නියමිත ආයතනයට සමගාමී ව පොලිසියටත් විධිමත් පුහුණුවක් ලබා දිය යුතුයි. අපරාධ නඩුවකදී වින්දිතයන්ට යුක්තිය, සාධාරණත්වය ඉටු කිරීමටනම් විත්තිකරුවන්ට ඉතා ඉක්මනින් නඩු පැවරිය යුතුයි. බොහෝ රටවල මේ ආයතනය පවතින්නේ ඒ අභිලාෂයෙන්. මෙරට තිබෙන සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ ආයතනයේ සහයත් මේ සඳහා ලබා

'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ' වෙත දැනුමක් තිබීම අවශ්‍යයි ඩිජිටල් සහ පරිගණක සාක්ෂි පිළිබඳවත්. මේ කාර්යාලය පිහිටුවීම සඳහා මෙවර අයවැයෙන් මුදල් වෙන්කර නොමැති නිසා ඒ සඳහා මුදල් ලබා ගැනීමට සිදු වන්නේ විශේෂ ජනාධිපති නියෝගයකින්. එම කාර්යාලය පිහිටුවීමටත් ස්වාධීන ව ක්‍රියාත්මක කිරීමටත් ඊට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදිය යුතුයි. ඒ වෙනුවෙන් රජයේ ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ලබා දෙනවා නම් ගැටලුවක් නැහැ.

ගන්නට පුළුවන්. මෙහිදී නීති ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සාක්ෂි එකතු කිරීම, ආරක්ෂා කිරීම, ඩිජිටල් සාක්ෂි ලබා ගැනීම වැනි විශාල කාර්යභාරයක් පැවරෙනවා.

'ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ' වෙත දැනුමක් තිබීම අවශ්‍යයි ඩිජිටල් සහ පරිගණක සාක්ෂි පිළිබඳවත්. මේ කාර්යාලය පිහිටුවීම සඳහා මෙවර අයවැයෙන් මුදල් වෙන්කර නොමැති නිසා ඒ සඳහා මුදල් ලබා ගැනීමට සිදු වන්නේ විශේෂ ජනාධිපති නියෝගයකින්. එම කාර්යාලය පිහිටුවීමටත් ස්වාධීන ව ක්‍රියාත්මක කිරීමටත් ඊට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදිය යුතුයි. ඒ වෙනුවෙන් රජයේ ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ලබා දෙනවා නම් ගැටලුවක් නැහැ.

රටේ අපරාධ යුක්තිය නිවැරදි ව පරිපාලනය වෙනවා ද? යන්න සොයා බැලීමට මෙහි කාර්යපටිපාටිය අවශ්‍ය වනවා. 1979 අපරාධ නඩු විධාන සංග්‍රයේ තිබෙන කිසිවක් මේ සමග වෙනස් වන්නේ නැහැ. සිදු වන්නේ ස්වාධීන අභිචෝදක කාර්යාලය අලුතින් ස්ථාපිත කිරීම පමණයි. මෙහිදී ස්වාධීන අභිචෝදක අධ්‍යක්ෂ සහ ඔහුගේ කාර්යමණ්ඩලය අපරාධ නඩු සම්බන්ධයෙන් බොහෝවිට මහාධිකරණයට අධිචෝදනා ගොනු කරනවා. ඒවායේදී විත්ති පාර්ශ්වයෙන් අභියාචනා ඉදිරිපත් වුවහොත් අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය යන අධිකරණ දෙකෙහි ම 'අභිචෝදක' පෙනී සිටිය යුතුයි.

ස්වාධීන අභිචෝදකට දක්ෂ, අවංක, කාර්යක්ෂම විශේෂ කාර්ය මණ්ඩලයක් සිටිය යුතුයි. ස්වාධීන අභිචෝදක බොහෝවිට සිදු කරන්නේ නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම, රජයට සහ රජයේ ආයතනවලට අවශ්‍ය උපදෙස් ලබාදීම. අපරාධ නඩු සම්බන්ධයෙන් රජයේ ප්‍රධාන උපදේශකයා වශයෙන් මේ තනතුරට විශාල වගකීමක් තිබෙනවා. සැකකරුවන් හෝ අපරාධකරුවන් වෙනත් රටක සිටින විට ඔවුන් ගෙන්වා ගැනීමේදී විශාල කාර්යභාරයක් සිදු කරන්න පුළුවන් ස්වාධීන අභිචෝදකට. ඒ නිසා තනතුර සහ ස්වාධීන අභිචෝදක කාර්යාලය පිහිටුවීමේ වැදගත්කම අප හඳුනාගත යුතුයි.

**කාංචනා සිරිවර්ධන**



# සාමයට අත දිගු කිරීම

**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**

රුසියාව සහ යුක්රේනය අතර විනාශකාරී යුද්ධය නිමා කර සාමය ගෙන ඒම සඳහා ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඇරඹූ ව්‍යාපෘතිය කෙරෙහි ලෝකයේ ම අවධානය යොමු වුණා. රුසියාව විසින් යුක්රේනය ආක්‍රමණය කරනු ලැබීමේ තුන් වැනි සංවත්සරය ද සපුරා ඇති මොහොතේ සිදුවෙමින් පවතින්නේ මේ ව්‍යසනකාරී යුද්ධයේ අවසානයට මඟ පෑදිය හැකි දැවැන්ත වෙනසක්. මෙය හැඳින්විය හැක්කේ යුද්ධය දිගු කිරීම සඳහා මෙතෙක් ආයුධ සහ අරමුදල් සැපයූ ප්‍රධාන සැපයුම්කරුවකුගේ සිට යුද්ධය නවතන සාම දූතයකු දක්වා එක්සත් ජනපද භූමිකාවේ සිදු වූ තියුණු සහ ඇදහිය නොහැකි වෙස් පෙරළියක් හැටියට.

තමන් නැවත තේරී පත්වුවහොත් යුක්රේනයේ පීඩාකාරී යුද්ධය අවසන් කරන බවට ඩොනල්ඩ් ට්‍රම්ප් පොරොන්දු වූවා. මේ යුද්ධය ආරම්භ වූ දා සිට හිටපු ජනාධිපති ජෝ බයිඩන් ඒ පිළිබඳ කතා කිරීම පවා ප්‍රතික්ෂේප කර තිබුණා. එහෙත් ට්‍රම්ප් තමන් දුන් පොරොන්දුව ඉටු කිරීමට මුල් පියවර තැබුවේ රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් සමග පෙබරවාරි 12 දින විනාඩි 90ක දුරකතන කතාබහක යෙදීමෙන්. ඒ, සිය පත්වීමෙන් මසක් ගතවන්නටත් පෙර. ට්‍රම්ප් විසින් යුක්රේන ජනාධිපති වොලොඩිමියර් සෙලෙන්ස්කි අමතා සෙලෙන්ස්කි ඉල්ලා තිබූ ආකාරයේ "කල්පවත්නා සහ විශ්වාසදායක සාමයක්" සඳහා වන කොන්දේසි සාකච්ඡා කිරීමට පැයක් ගත කළා. අවසානයේ ලෝකයට එළිදරව් වූයේ සාම සාකච්ඡා 'වහා ම' ආරම්භ කිරීමට ඔවුන් දෙපාර්ශ්වය එකඟ වූ බව.



එක්සත් ජනපද නව ආරක්ෂක ලේකම් පීට් හෙග්සෙත් විසින් බ්‍රසල්ස්හි නේටෝ මූලස්ථානයේ පැවති යුක්රේන ආරක්ෂක සම්බන්ධතා කණ්ඩායමේ රැස්වීමකදී ට්‍රම්ප්ගේ නව ප්‍රතිපත්තිය වඩාත් විස්තරාත්මක ව එළිදක්වනු ලැබුවේ "ලේ වැගිරීම් නතර විය යුතුයි. මේ යුද්ධයත් අවසන් විය යුතුයි," යැයි පවසමින්. හෙග්සෙත් නිවේදනය කළ අයුරු ට්‍රම්ප්ගේ නව ප්‍රතිපත්තියේ කොටස් දෙකක් තිබුණා. ඒ, පළමු ව ට්‍රම්ප් 'රාජ්‍ය තාන්ත්‍රිකභාවයෙන් රුසියාව සහ යුක්රේනය සාකච්ඡා

මේසයට ගෙනඒමෙන් මේ යුද්ධය අවසන් කිරීම' සහ දෙවැනි ව 'යුක්රේනය සන්නද්ධ කිරීමේ සහ එහි අනාගත ආරක්ෂාව සහතික කිරීමේ ප්‍රධාන වගකීම එක්සත් ජනපදය වෙතින් නේටෝවේ යුරෝපීය සාමාජිකයන්ට භාර දීම' යනුවෙන්.

එහෙත් මේ කතා ඇරඹෙන්නට ආසන්න ව තිබියදී ට්‍රම්ප් විසින් යුක්රේනය ආක්‍රමණය කිරීම සම්බන්ධයෙන් රුසියාව හුදෙකලා කිරීමට ගත් වොෂින්ටනයේ මුල් උත්සාහය සහ යුක්රේනය හා රුසියාව පිළිබඳ මෙතෙක් පවත්වාගෙන ගිය එක්සත් ජනපද පසමිතුරු ප්‍රතිපත්තිය උඩු යටිකුරු කරනු ලැබුවා. ඔහු රුසියාවට ආවඩමින් යුද්ධය ඇරඹීමට ක්‍රියා කළ බවට යුක්රේනයට තරවටු කරමින් ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් කරන්නට ද වුණා. 'ජයගත නොහැකි යුද්ධයකට බව' ඩොනල්ඩ් ට්‍රම්ප් පළ කළ තවත් ආන්දෝලනාත්මක ප්‍රකාශයක්.

මේ තත්ත්වය නිසා 2025 පෙබරවාරි 18 දින අඟහරුවාදා රියාද්හිදී සෞදි අරාබියේ මැදිහත්වීමෙන් පැවැති සාකච්ඡා වටයට යුක්රේනය නොමැති ව එක්සත් ජනපද සහ රුසියානු නිලධාරීන් පමණක් එක් ව සිටියා. ඒ අනුව යුක්රේනයට සාමය ගෙන ඒම සඳහා වූ ට්‍රම්ප්ගේ මුල් ම සාකච්ඡාව රුසියාවට ඔවුන් පැතූ ජයග්‍රහණයක් ද යුක්රේනයට සුළු යුදමය සහනයක් ද නේටෝ ඇතුළු යුරෝපයට තවත් බරපතළ වගකීමක් ද ලබාදෙමින් අවසන් වුණා.

වසර තුනක ගැටුම පුරා ම යුක්රේන ජනාධිපති වොලොඩිමියර් සෙලෙන්ස්කිගේ සිහිනය වූයේ ක්‍රිමියාව ඇතුළු රුසියාව අල්ලා ගත් තම රටේ භූමියේ සම්පූර්ණ විමුක්තිය. නේටෝ සාමාජිකත්වය ලබා ගැනීම ද ඔහුගේ සෙලෙන්ස්කි විසින් තමන් හෝ සිය යුරෝපා හිතවතුන් හෝ රහිත ව සිදු කළ මේ කතාබහ සහ එහි තීන්දු තදින් ම ප්‍රතික්ෂේප කරනු ලැබුවා. මූලික සාකච්ඡා අවසන් වූ දිනයේ ම ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් යුක්රේන ජනාධිපති වොලොඩිමියර් සෙලෙන්ස්කි දැඩි ලෙස විවේචනය කරමින් ඔහු "මැතිවරණයකින් තොර ව රට ගෙන යන ඒකාධිපතියකු" ලෙස හෙළා දුටුවා. ඒ අතර සාමයක් ඇති කර ගැනීමටනම් ඔහු ඒ සඳහා වේගයෙන් පියවර ගැනීම වඩා හොඳ බවටත් එසේ නොමැතිනම් ඔහුට රටක් ඉතිරි නොවනු ඇති බවටත් ට්‍රම්ප් අනතුරු ඇඟවූවා.

යුක්රේනයේ යුද්ධය අවසන් කිරීමට මාර්ග සැලසුම සාකච්ඡා කිරීම සඳහා එක්සත් ජනපදය සහ රුසියාව ඉදිරියේදී ඉහළ මට්ටමේ සාකච්ඡා කණ්ඩායම් පත් කිරීමට සැරසෙන අතර රාජ්‍ය





අරමුදල් සැපයීමට එක්සත් ජනපදය රැවටිලිකාර ලෙස ඇඳා ගත් බව'ට සෙලෙන්ස්කිට ට්‍රම්ප් දෝෂාරෝපණය කළා. ඇමරිකාවට කිසිදු ප්‍රතිලාභයක් නොලැබෙන යුද්ධයකට යුරෝපයටත් වඩා ඩොලර් බිලියන 200ක් වියදම් කිරිමට ඇඳා ගත්තා මදිවාට දැන් ඒ ආධාරවලින් අඩක් ම අතුරුදන් ව ඇතැයි සෙලෙන්ස්කි කියන බව ට්‍රම්ප් ලියා තිබුණේ සිය X ගිණුමේ තැබූ සටහනක. 'යුක්රේනය යම් දිනක රුසියාවට අයත් විය හැකි ප්‍රබල සිහිනයක්. එහෙත් මූලික සාම කතාබහෙන් ම පහළ වී ඇත්තේ මේ සිහින දෙක ම බොඳවන ලකුණු.

විචාරකයන්ට අනුව මේ සාකච්ඡාව පැවැත්වීම පවා රුසියාවට ලැබුණු ප්‍රධාන ජයග්‍රහණයක්. මෙය 2022 වසරේදී මොස්කව් විසින් යුක්රේනයට පූර්ණ පරිමාණයේ ආක්‍රමණයක් දියත් කරනු ලැබීමෙන් පසු ඉහළ පෙළේ එක්සත් ජනපද සහ රුසියානු නිලධාරීන් මුහුණට මුහුණ හමුවූ පළමු අවස්ථාව.

තාන්ත්‍රික මාර්ග නැවත ස්ථාපිත කිරීමට ක්‍රියා කරමින් කරමින් සිටින බව කියෙව් නියෝජිතයන් රහිත ව සිදු කළ ප්‍රධාන සාකච්ඡාව අවසානයේ එක්සත් ජනපද රාජ්‍ය ලේකම් මාර්කෝ රූබියෝ පැවසුවා. එහිදී සෞදි අරාබියේ රියාද්හිදී රුසියාවේ විදේශ අමාත්‍ය සර්ජි ලැව්රොව් හමුවීමෙන් පසු වාර්තාකරුවන්ට අදහස් දක්වමින් රූබියෝ කියා සිටියේ ගැටුම අවසන් වීමටනම් 'සියලු පාර්ශ්ව' විසින් 'සහන' ලබා දිය යුතු බව.

රුබියෝ මෙන් ම එක්සත් ජනපද මැදපෙරදිග නියෝජිත ස්ටීව් විට්කොෆ් සහ ජාතික ආරක්ෂක උපදේශක මයික් වෝල්ට්ස් ඇතුළත් එක්සත් ජනපද දූත පිරිස යෝජනා කළේ යුද්ධය අවසන් කිරීම සඳහා වන කාර්ය මාලාවක පළමු අවස්ථාව මෙය වනු ඇතැයි යන්න. එහෙත් සෙලෙන්ස්කි නැවතත් ට්‍රම්ප් ඇරඹූ සාම කතාබහ විවේචනය කළේ 'යුක්රේනය නොමැති විට ඇති කර ගන්නා කිසිදු ගිවිසුමක් තමන් පිළිගන්නේ නැති බව' කියමින්.

යුක්රේනය තම භූමියේ විශාල කොටස්වල පාලනය අත්හැර නේටෝවට සම්බන්ධ වීමේ අභිලාෂය ද අත්හැරිය යුතු බවට රුසියාව මීට පෙර ඉල්ලා තිබුණා. රුසියාවට සෙලෙන්ස්කි ධුරයෙන් ඉවත් කිරීමට අවශ්‍ය බව ද ඉතා පැහැදිලි කාරණාවක්. සෙලෙන්ස්කි 'ස්වයං-



ප්‍රකාශිත යුක්රේන ජනාධිපති' ලෙස රුසියාව විසින් හඳුන්වනු ලබන අතර ඔහුගේ රජය හඳුන්වන්නේ 'සෙලෙන්ස්කි කල්ලිය' ලෙස. ඔවුන් පෙන්වා දෙන්නේ මේ දෙකට ම 'නව යුක්රේනයේ ඉටු කිරීමට භූමිකාවක්' නොමැති බව. ට්‍රම්ප් පවා සිටින්නේ 'යුක්රේනයේ නව මැතිවරණයක් පැවැත්වීම සඳහා බල කළ යුතු ය' යන ස්ථාවරයක.

සෙලෙන්ස්කි 2019 වසරේ ජනාධිපතිවරණයේ දෙවැනි වටයේදී ලබා තිබුණේ අතිවිශිෂ්ට ජයග්‍රහණයක්. ඔහුගේ ජනවරම පසුගිය මැයි මාසයේදී අවසන් විය යුතු ව තිබුණා. එහෙත් රුසියාව පූර්ණ පරිමාණ ආක්‍රමණයක් දියත් කළ දින සිට යුක්රේනය පවතින්නේ යුද නීතිය යටතේ. එම යුද නීතිය යටතේ මැතිවරණ පැවැත්වීම තහනම් කර තිබෙනවා. එබැවින් ඔහු තවමත් ධුරයේ රැඳී සිටිනවා. පෙබරවාරි මස මුලදී කියෙව් ජාත්‍යන්තර සමාජ විද්‍යා ආයතනයේ නවතම මත විමසුමට අනුව වාර්තා වී තිබෙන්නේ යුක්රේනියානුවන්ගෙන් 57%ක් තවමත් සෙලෙන්ස්කි ගැන විශ්වාසය තබා ඇති බව.

**වසර තුනක ගැටුම පුරා ම යුක්රේන ජනාධිපති වොලොඩිමියර් සෙලෙන්ස්කිගේ සිහිනය වූයේ ක්‍රිමියාව ඇතුළු රුසියාව අල්ලා ගත් තම රටේ භූමියේ සම්පූර්ණ විමුක්තිය. නේටෝ සාමාජිකත්වය ලබා ගැනීම ද ඔහුගේ ප්‍රබල සිහිනයක්. එහෙත් මූලික සාම කතාබහෙන් ම පහළ වී ඇත්තේ මේ සිහින දෙක ම බොඳවන ලකුණු.**

ඇමරිකාව මුල් වී ඇරඹි මේ සාම කතාබහ ගැන එළියට කාන්දු වී තිබූ නිල නොලත් රහස්‍ය වාර්තාවක දැක්වුණේ යුක්රේනය සඳහා එක්සත් ජනපද 'දින 100ක සාම සැලැස්මක්' පවතින බව. අන්තර්ජාල ප්‍රකාශනයක් වෙතින් කාන්දු වූ ඒ තොරතුරු විශ්වාස කරන්නේනම් අප්‍රේල් 20 වන විට යුක්රේනයේ සටන් විරාමයක් ක්‍රියාත්මක විය යුතුයි. එය නැගෙනහිර යුක්රේනයේ ඉදිරිපෙළ දිගේ යුද්ධය කැටි කරනු ඇති. රුසියානු කලාපයේ කුර්ස්ක් වෙතින් යුක්රේන හමුදා සම්පූර්ණයෙන් ඉවත් කර ගැනීම ද සිදු වනු ඇති.

යුක්රේන ජනාධිපති ව්ලොදිමීර් සෙලෙන්ස්කිට රුසියානුවන් අත්පත් කරගත් යුක්රේන ප්‍රදේශ කෙරෙහි රුසියානු ස්වෛරීභාවය පිළිගැනීමට බල කිරීම ද මේ සැලසුමේ අපේක්ෂාවක්. මේ වන විටත් සෙලෙන්ස්කි මේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර අවසන්. රටේ ස්වෛරීභාවය, ස්වාධිනත්වය, ආරක්ෂාව සැලසේනම් තමා ඉවත් වීමට වුවත් සූදානම් බවයි ඔහු කියා ඇත්තේ. කාන්දු වූ තොරතුරුවලට අනුව පුටින් සහ සෙලෙන්ස්කි අතර පළමු සෘජු සාකච්ඡා මාර්තු 01 දින පමණ සිදු වනු ඇති.

යුක්රේනය සහ රුසියාව පිළිබඳ තමන්ගේ ම සාම වැඩපිළිවෙළක සාකච්ඡා සඳහා එක්සත් රාජධානියේ අගමැති කීර් ස්ටාර්මර් ඇතුළු යුරෝපීය නායකයන් පිරිසක් පැරිසියේදී රැස් වුණා. ඇමරිකාව රහිත ව යුක්රේනය නැවත ආක්‍රමණයකට ලක්වීමෙන් වළක්වා ගැනීමේ තමන් වෙත පැවරෙන භාරදූර වගකීම මෙන් ම සිය රටවල ආරක්ෂාව ගැන ද මේ කතාබහට මූලික වුණා. රැස්වීම ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් විසින් කැඳවන ලද අතර එයට ඇතුළත් වූයේ ජර්මනිය, ඉතාලිය, පෝලන්තය, ස්පාඤ්ඤය, ඩෙන්මාර්කය සහ යුරෝපා සංගම් කවුන්සිලයේ නියෝජිතයන්.

මේ අතර යුරෝපීය කවුන්සිලයේ සභාපති ඇන්ටෝනියෝ කොස්තා, යුරෝපා සංගමයේ ආරක්ෂක උත්සාහය තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා යුරෝපා සංගම් රාජ්‍ය නායකයන්ගේ සමුළුවක් මාර්තු 06 දින කැඳවා තිබෙනවා. රුසියාව යුක්රේනය ආක්‍රමණය කිරීමේ තුන්වැනි සංවත්සරය පැවැති පෙබරවාරි 24 දින ට්‍රම්ප් හමුවන්නට ධවල මන්දිරයට ගිය ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් පැවසුවේ ඉදිරි සති කිහිපයේ සටන් විරාමයකට එකඟ විය හැකි බව තමා විශ්වාස කරන බවත් ඉන්පසුව සාකච්ඡාකරුවන් දිගුකාලීන සාමයක් සඳහා ක්‍රියා කරනු ඇති බවත්.

# මෝක්ෂය සොයා යාම

සඳුනි අරුමප්පෙරුමාච්චි

කුම්භ මේලා උත්සවය ලොව විශාලතම ජන සහභාගිත්වයක් ඇති ආගමික උත්සවයක්. හජ්ජි බැතිමතුන් මෙන් 200 ගුණයක බැතිමතුන් රැස්වන මේ උත්සවයේ විශේෂත්වය වන්නේ විශාල ජන සමූහයක් සාමකාමී ව එක තැනකට එකතු වන ආගමික උත්සවයක් වීම. එම නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යුනෙස්කෝව විසින් මානව වර්ගයාගේ අස්පර්ශ උරුමයක් ලෙස කුම්භ මේලා උත්සවය පිළිගෙන තිබෙනවා. ඉන්දියාවේ හින්දු ආගමික උත්සවයක් වන මෙය හරිද්වාර්, උජ්ජයින්, ප්‍රයාග්‍රාජ්, නාසික් ප්‍රදේශවල මාරුවෙන් මාරුවට පවත්වන අතර මෙවර අලහබාද් නැතිනම් ප්‍රයාග්‍රාජ් නම් උතුරු ඉන්දියානු ප්‍රදේශයේ එය පැවැත්වෙනවා. මෙය නම් කර තිබෙන්නේ 2025 මහා කුම්භ මේලා ප්‍රයාග්‍රාජ් ලෙස.

හින්දු, චන්ද්‍ර-සූර්ය දින දර්ශනය සහ බ්‍රහස්පති, සූර්යයා සහ චන්ද්‍රයාගේ සාපේක්ෂ ජ්‍යෝතිෂ්‍ය පිහිටීම් පදනම් ව සෑම වසර 12කට වරක් පැවැත්වෙන මෙය 2025 වසරට බලපාන තවත් විශේෂත්වයක් තිබෙනවා. ඒ, තාරකා විද්‍යාත්මක ගණනය කිරීම්වලට අනුව තාරකා මණ්ඩල පෙළගැස්ම සෑම වසර 144කට වරක් දක්නට ලැබීම. 2025 වසර අවුරුදු 144කට පසු උදාවෙන එවැනි සුබ දර්ශනයකට හිමිකම් කීම බැතිමතුන් දැඩි ව උත්සවය වැළඳගත් කරුණක්. කුම්භ මේලාව ජනවාරි දෙවැනි සතියේ සිට මාර්තු මාසය දක්වා පවත්වන අතර මේ වසරේදී එය දින 45ක් පැවැත්වෙනු ඇති. ඉන්දීය මාධ්‍ය වාර්තා අනුව කුම්භ මේලා සැමරීමට මිලියන සංඛ්‍යාවක බැතිමතුන් පැමිණීමෙන් මේ ප්‍රදේශයේ බැතිමතුන් අතර තෙරපීමක් පවතින අතර එම තෙරපීමෙන් බැතිමතුන් කිහිපදෙනකුගේ ජීවිත අනතුරට ලක් ව ඒ හේතුවෙන් මිය යාමත් අසන්නට ලැබෙනවා.

කුම්භ මේලා උත්සවයේ මූලික චාරිත්‍රය වන්නේ ස්නානය. උත්සවයට පැමිණෙන හින්දු සාධුවරයන් සහ සාන්තුවරුන් පළමු ව ස්නානය කරන අතර ඉන්පසු අනෙකුත් සමාන්‍ය හින්දු බැතිමතුන් ස්නානය කරනවා. මෙලෙස ස්නානය කරන්නේ ගංගා, යමුනා සහ සරස්වතී නම් ශුද්ධ වූ ගංගා එකට එක්වන ස්ථානවල. ඒවා සුබ ස්ථාන ලෙසත් එසේ ස්නානයෙන් තමන්ගේ පව් සේදෙන බවත් ඉපදීමෙන් සහ මරණයෙන් මිදී මෝක්ෂය උදාකර ගත හැකි බවත් ඔවුන් විශ්වාස කරනවා.

කුම්භ මේලා උත්සවයේ මූලික චාරිත්‍රය වන්නේ ස්නානය. උත්සවයට පැමිණෙන හින්දු සාධුවරයන් සහ සාන්තුවරුන් පළමු ව ස්නානය කරන අතර ඉන්පසු අනෙකුත් සමාන්‍ය හින්දු බැතිමතුන් ස්නානය කරනවා. මෙලෙස ස්නානය කරන්නේ ගංගා, යමුනා සහ සරස්වතී නම් ශුද්ධ වූ ගංගා එකට එක්වන ස්ථානවල. ඒවා සුබ ස්ථාන ලෙසත් එසේ ස්නානයෙන් තමන්ගේ පව් සේදෙන බවත් ඉපදීමෙන් සහ මරණයෙන් මිදී මෝක්ෂය උදාකර ගත හැකි බවත් ඔවුන් විශ්වාස කරනවා.

කුම්භ මේලා ඉතිහාසය පිරික්සීමේදී කුම්භ මේලා යනු පුරාණ මිථ්‍යාවලින් ඇරඹුණ වන්දනා චාරිත්‍රයක්. ජනප්‍රවාද අනුව මහා සාගරය කැළඹීමේදී අමෘත බඳුනක් මතු වී තිබෙනවා. එම අමෘත පානය කළ පුද්ගලයා පත් වන්නේ අමරණීයත්වයට. මේ හේතුවෙන් දෙවිවරුන් සහ අසුරයන් මේ බඳුන ලබා ගැනීමට එකිනෙකා සමග සටන් වැදුණා. මෙය විසඳීමට විෂ්ණු දෙවියන් වෙනත් වේශයකින් පැමිණ පැණි බඳුන රැගෙන ගියා. යන අතරතුර පැණි බිංදු කිහිපයක් හරිද්වාර්, අලහබාද්, නාසික් සහ උජ්ජයින් ස්ථානවල වැටුණු බව කියැවෙනවා. මේ පුරාවෘත්තය සැමරීමට එම ස්ථානවල හින්දු බැතිමතුන් කුම්භ මේලාව සිදු කරනවා. ප්‍රයාග්‍රාජ්වල පළමු වැනි කුම්භ මේලා උත්සවය ක්‍රි.ව. 1600දී සැමරූ බව සඳහන්. අනෙකුත් ස්ථානවල කුම්භ මේලා 14 වැනි සියවසේ මුල් භාගයේදී පවත්වා ඇති බවට සාධක හමු වී තිබෙනවා.

ඉන්දීය මාධ්‍ය වාර්තා කරන්නේ මෙවර කුම්භ මේලාව බාධාවකින් තොර ව පැවැත්වීමට රජයේ නිලධාරින් දහස් ගණනක් යොදවා ඇති බව. උත්සවයට සහභාගි වන බැතිමතුන්ට නවාතැන් සඳහා නදිය අසළ ඩෙල්ටාවේ කූඩාරම් රාශියක් ඉදි කර තිබෙනවා. බැතිමතුන්ට කූඩාරම් සැකසීම සඳහා ඉදිරිපත් ව සිටින්නේ ආගමික සහ සංස්කෘතික සංවිධාන 6000ක්. ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි රජීව් රායි පැවසුවේ කුම්භ මේලා උත්සවය වර්ග කිලෝ මීටර් 32ක පමණ විශාල භූමි ප්‍රමාණයක පැවැත්වෙන බව. බැතිමතුන්ට කූඩාරම්වල වාසය කිරීමේ සුන්දර අත්දැකීමක් විඳ ගැනීමට හැකිවීමත් රාත්‍රී තරු පිරුණු අහස දැකීමත් ලෝකෝත්තරය දැකීමක් වැනියි. හින්දු ශාස්ත්‍රීය සංගීතය, යාඥා, ආගමික දේශන, හින්දු ආගමිකයන්ට ආවේණික ආහාරපාන සහිත සංස්කෘතිකාංග සැණකෙළියක්. විශේෂයෙන් තමන්ගේ ආධ්‍යාත්මික සුවය වෙනුවෙන් ආගමික චර්යාවට අවනත ව මනුෂ්‍යත්වය සාමූහිකත්වය පෙන්නුම් කරන උත්සවයක්.

නිහාල් පීරිස්


# අභ්‍යවකාශ ආමුත්තා



තාරකා විද්‍යාඥයන්ට යම් බියක්, ආතතියක් ඇති කළ සිදුවීමක් නොබෝද වාර්තා වුණා. ඒ, තව වසර කිහිපයකින් පෘථිවියේ ගැටී, විශාල විනාශයක් සිදු කිරීමට ඉඩ ඇතැයි සැලකුණු, තරමක් විශාල ප්‍රමාණයේ ග්‍රහකයක් සොයා ගැනීම. ග්‍රහක (Asteroids) යනුවෙන් හැඳින්වෙන්නේ අභ්‍යවකාශයේ පාවෙමින් ඇති, ග්‍රහලෝක තරම් විශාල නොවන වස්තූන් කොට්ඨාසයක්. ඈත අතීතයේ මිහි මත ජීවත් වූ ඩයිනසෝරයන් වැනි සත්ත්වයන් වඳ වී ගියේ ද යෝධ ග්‍රහකයක් පෘථිවියේ ගැටීමෙන් ඇති වූ බලපෑම නිසා බව පිළිගැනෙන්නක්.

මේ ග්‍රහකය හැඳින්වුණේ 2024 YR4 යන නමින්. එය මුලින් ම තාරකා විද්‍යාඥයන්ගේ ඇස ගැටුණේ 2024 වසරේ දෙසැම්බර් මාසයේ චිලියේ පිහිටා ඇති දුරේක්ෂ පද්ධතියක් ඔස්සේ. විද්‍යාඥයන් විසින් ඒ වනවිට කරන ලද ගණනය කිරීම්වල හැටියට මෙය තව වසර 7කින්, එනම් 2032 වසරේ දෙසැම්බර් මාසයේ පෘථිවියේ ගැටෙන්නට ඉඩ ඇති බවක් අනුමාන කෙරුණා.

මීටර 40-90 අතර විෂ්කම්භයකින් යුතු මේ ග්‍රහකය ඉතා විශාල නොවුණත් මේ ප්‍රමාණයේ ග්‍රහකයක් ගැටීමෙන් වුවත් සැලකිය යුතු විනාශයක් සිදු වන්නට පුළුවන්. යම් හෙයකින් 2024



YR4 ග්‍රහකය ජනාකීර්ණ ගොඩබිම් ප්‍රදේශයකට වැටුණහොත් නගර පිටින් මුළුමනින් විනාශ වී යනු ඇතැයි පැවසුණා. එයින් නික්මෙන ශක්තිය දෙවැනි ලෝක යුද්ධය සමයේ ජපානයේ හිරෝෂිමාවට හෙළන ලද පරමාණු බෝම්බයෙන් නික්මුණු ශක්තිය මෙන් 500 ගුණයක් පමණ වනු ඇතැයි ද සඳහන්. මේ ග්‍රහකය පෘථිවියේ ගැටෙන්නේනම් ඒ ගැටෙන වේගය පැයට කි.මී. 60,000ක් තරම් වනු ඇති බව ද ගණන් බලා තිබෙනවා.


මුලින් ම විද්‍යාඥයන්ට පෙනී ගියේ 2024 YR4 ග්‍රහකය පෘථිවියේ ගැටෙන්නට සියයට 1.2ක පමණ සම්භාවිතාවක් ඇති බව. එහෙත් පසුව තවදුරටත් නිරීක්ෂණය කිරීමේදී මේ ග්‍රහකය පෘථිවියේ ගැටීම සඳහා ඊට වඩා වැඩි ඉඩක් ඇති බවක් විද්‍යාඥයන්ට පෙනී ගියා. එහිදී ඔවුන් පැවසුවේ සියයට 1.2ක සම්භාවිතාව සියයට 2.6ක් පමණ වන බව. දිගින් දිගට ම ග්‍රහකයේ ගමන් මග නිරීක්ෂණය කරනවිට මේ සම්භාවිතාව තවදුරටත් ඉහළ ගිය අතර පෙබරවාරි 18 දින නාසා ආයතනය ප්‍රකාශ කළේ 2024 YR4 ග්‍රහකය පෘථිවියේ ගැටෙන්නට සියයට 3.1ක පමණ සම්භාවිතාවක් ඇති බව. මේ සම්භාවිතාව මෙලෙස ඉහළ යාම තරමක් බිය උපදවන්නක් වුණා. ග්‍රහකයේ ගමන් මග පිළිබඳ ව වඩාත් සමීප ව අධ්‍යයනය කිරීමේදී මේ සම්භාවිතාව පහත වැටෙන්නට ඉඩ ඇති බවට අදහසක් ද විද්‍යාඥයන්ට තිබුණා.

මේ නිරීක්ෂණ කරමින් සිටියදී ග්‍රහකය තිබුණේ පෘථිවියෙන් ඉවතට ගමන් කරමින්. එය ඉක්මනින් ම දුරේක්ෂවල දර්ශන පථයෙන් මැකී යාමට නියමිත ව තිබුණා. එසේ නොපෙනී යාමෙන් පසු ග්‍රහකය නැවත දර්ශනය වීමට නියමිත ව තිබෙන්නේ 2028 වසරේ. ග්‍රහකය නිසැක ව ම පෘථිවියේ ගැටෙයි ද යන්න නිගමනය කිරීමට එතෙක්කල් බලා සිටීම ප්‍රමාද වැඩි වන්නට ඉඩ තිබුණු නිසා විද්‍යාඥයන්ට අවශ්‍ය වූයේ ග්‍රහකය

දර්ශන පථයෙන් මැකී යාමට පෙර ඒ පිළිබඳ නිගමනයකට එළැඹෙන්නට.

ඒ අනුව අඛණ්ඩ නිරීක්ෂණ සිදු කිරීමෙන් පසු නාසා ඇතුළු අභ්‍යවකාශ ආයතන පසුගියදා සතුටුදායක නිගමනයක් ප්‍රකාශයට පත් කර තිබුණා. ඔවුන් සඳහන් කර ඇත්තේ 2024 YR4 ග්‍රහකය 2032 වසරේ පෘථිවියෙහි ගැටෙන්නට ඇති සම්භාවිතාව සියයට 0.001ක් දක්වා අඩු වී ඇති බව. එයින් කියැවෙන්නේ මෙය බොහෝදුරට පෘථිවියේ නොගැටෙන්නට ඉඩ ඇති බව. ග්‍රහකය සඳෙහි ගැටෙන්නට ඊට වැඩි ඉඩක් ඇති බව විද්‍යාඥයන් සඳහන් කර තිබුණා.

2024 YR4 ග්‍රහකයෙන් පෘථිවියට මෑත අනාගතයේ අනතුරක් නැතත් මෙවැනි ග්‍රහක ගැන විශාල කතාබහක්, උනන්දුවක් ජනිත කරන්නට මේ සිදුවීමට හැකි වුණා. යම් හෙයකින්






මේ ග්‍රහකය ස්ථිර වශයෙන් ම පෘථිවිය හා ගැටෙන ගමන් මාර්ගයක එන බව නිරීක්ෂණය වූයේනම් සිදු වන්නේ කුමක් ද? මෙවැනි තත්ත්වයක් යටතේ ගත හැකි පියවර පිළිබඳ ව පසුගිය කාලයේ ඇමරිකාවේ නාසා ආයතනය විශාල වශයෙන් පර්යේෂණ කළා. ග්‍රහකයක ගමන් මග වෙනස් කළ හැකි ක්‍රම පිළිබඳ ව ද ඔවුන් අත්හදාබැලීම් කළා. වසර කිහිපයකට පෙර නාසා ආයතනය ඉතා වැදගත් අත්හදාබැලීමක් කළ අතර එම මෙහෙයුම හැඳින්වුණේ DART (Double Asteroid Redirection Test) යන නමින්. මෙහිදී විද්‍යාඥයන් කළේ අභ්‍යවකාශ යානයක් ග්‍රහකයක වේගයෙන් ගැටෙන්නට සැලැස්වීමෙන් ග්‍රහකයේ ගමන්මග වෙනස් කළ හැකිදැයි සොයා බැලීම. මේ මෙහෙයුමේදී විද්‍යාඥයන්ගේ ඉලක්කය වූයේ ඩයිමෝෆස් නමින් හැඳින්වුණු ග්‍රහකයක්. මෙය DART මෙහෙයුමේ ඉලක්කය වුවත් එයින් පෘථිවියට තර්ජනයක් තිබුණේ නැහැ.
2021 නොවැම්බර් 24 දින පෘථිවියෙන් පිටත් වූ DART යානය ඩයිමෝෆස් ග්‍රහකයේ ගැටුණේ 2022 සැප්තැම්බර් 26 දින. ඒ, පෘථිවියේ සිට කි. මී. මිලියන 11ක් පමණ ඈත අභ්‍යවකාශයේදී. මේ අත්හදාබැලීම ඉතා සාර්ථක වූ අතර විද්‍යාඥයන් අපේක්ෂා කළාටත් වඩා වැඩි ප්‍රමාණයකින් ග්‍රහකයේ ගමන් මග වෙනස් කිරීමට එයට හැකි වුණා.

2024 YR4 ග්‍රහකය පෘථිවියේ ගැටෙන්නට එන බව නිශ්චිත ව අනාවරණය වී නම් එහි ගමන් මග වෙනස් කර පෘථිවිය බේරා ගැනීම සඳහා විද්‍යාඥයන් මේ ක්‍රමය භාවිත කිරීමට ඉඩ තිබුණා. එහෙත් ග්‍රහකය පෘථිවියේ ගැටෙනවා ද යන්න කල්වේලා ඇති ව හඳුනාගැනීම මෙහිදී ඉතා වැදගත්. මන්දයත් DART මෙහෙයුමේදී මෙන් යානයක් ඒ වෙත යැවීමට යම් කාලයක් ගත වන බැවින්. 2024 YR4 ග්‍රහකය පෘථිවියේ ගැටේවි ද නැද්ද යන්න හැකි ඉක්මනින් නිගමනය කිරීමට විද්‍යාඥයන් උත්සුක වූයේ මේ හේතුවෙන්. වාසනාවට මෙන් එය පෘථිවියෙහි නොගැටෙන බව අනාවරණය  වුණා.

ග්‍රහකයක ගමන් මග වෙනස් කළ හැකි තාක්ෂණය මේ වනවිට අත්හදාබලා තිබුණත් එය හැම විට ම සාර්ථක නොවීමට ද ඉඩ ඇති බව විද්‍යාඥයන් පවසනවා. ඒ නිසා මෙවැනි ග්‍රහකවලින් පෘථිවියට එල්ල වන අනතුර සම්පූර්ණයෙන් පහ ව ගොස් නැහැ.

නාසා ආයතනය කළ අත්හදාබැලීමේදී ඉලක්ක කළ ඩයිමෝෆස් ග්‍රහකය මීටර 177ක පමණ විශ්කම්භය ඇති ග්‍රහකයක් වුවත් මෙයට වඩා බොහෝ විශාල ග්‍රහක අභ්‍යවකාශයේ පාවෙමින් තිබෙනවා. මෙයට වසර මිලියන 66කට පමණ පෙර ඩයිනසෝරයන් ඇතුළු ජීවීන් වඳ කර දමමින් පෘථිවියේ ගැටුණේ කිලෝ මීටර 10-15 අතර විශ්කම්භයක් තිබූ ග්‍රහකයක් බව විශ්වාස කෙරෙනවා. මේ තරම් විශාල ග්‍රහකයක් පෘථිවියේ ගැටෙන මාර්ගයක පැමිණියහොත් DART ක්‍රමය සාර්ථක වන්නේ නැහැ. කෙසේ වෙතත් තාරකා විද්‍යාඥයන් පවසන්නේ මෑත අනාගතයේ මෙවැනි යෝධ ග්‍රහකයක් පෘථිවියේ ගැටෙන්නට ඉඩක් නොමැති බව.

# ජන සෙතට අය වැය



දීප්ත කුමාර බටගොඩ

**මුදල් අමාත්‍යවරයා ලෙස ජනාධිපති අනුර කුමාර දිසානායක විසින් 2025 වර්ෂයේ අය වැය ලේඛනය නොබෝදා (පෙබරවාරි 17) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද්දේ ශ්‍රී ලංකා රජයේ 79 වැනි අය වැය ලේඛනය ලෙස. මෙවර අය වැය ලේඛනය පිළිබඳ සමාජයේ විවිධ කතාබහ, අදහස් ඉදිරිපත් වන පසුබිමක දෙසතිය මාර්තු මස කලාපයේ කවරයේ කතාබහ ද සිදු වන්නේ ඒ පිළිබඳ විද්වත් මත සමග විමසුමක යෙදෙමින්.**

යම් නිශ්චිත කාලයක රාජ්‍ය මූල්‍ය පිළිබඳ සැලසුම රාජ්‍ය අය වැය ලේඛනය යනුවෙන් හඳුන්වනවා. රජය ආර්ථිකය තුළ වියදම් කරන ආකාරය සහ ඒ සඳහා ආදායම් උත්පාදනය කරන ආකාරය එයට ඇතුළත්. සාමාන්‍යයෙන් මෙය ඉදිරි මුදල් වර්ෂය සඳහායි ඇස්තමේන්තු කරන්නේ. රජයේ අය වැය ලේඛනයක ප්‍රධාන පරමාර්ථය වන්නේ රටේ සාර්ව ආර්ථක අරමුණු හා අනෙකුත් සමාජ ආර්ථික අරමුණු ළඟා කර ගැනීම හා ප්‍රවර්ධනය කිරීම, රටේ ජාතික සංවර්ධන සැලසුම වාර්ෂික අය වැයට ඇතුළත් කර ගැනීමෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සංවර්ධනය සඳහා වූ නිවැරදි දිශානතියකට යොමු කිරීම. මේ සඳහා පවතින රාජ්‍ය වියදම් ආර්ථිකය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම සඳහා කරන වර්තන වියදම් හා රාජ්‍ය ප්‍රතිපත්ති අනුව ඉදිරි සංවර්ධන කටයුතු සඳහා පවත්වාගෙන යන ප්‍රාග්ධන වියදම් ලෙස දෙයාකාර වනවා.

## පසුබිම හා පදනම

ජාතික ජනබලවේග ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශනය හා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2025 වර්ෂයේ අය වැය සඳහා පදනම් කරගත් බව මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සඳහන් කරනවා. වර්තමානයේ පවතින ආර්ථිකයේ ස්වභාවය සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇතිකරගත් එකඟතා ද 2025 අය වැය සම්පාදනයේදී පදනම් කරගෙන ඇති බව පැහැදිලි වන්නක්.

## ප්‍රධාන අරමුණු හා ප්‍රතිපත්ති

අය වැය කතාව අනුව අය වැය පදනම් වූ මූලධර්ම පැහැදිලි වනවා. ආර්ථිකයේ ඉල්ලුම් හා සැපයුම් අංශවල අරමුණු හා එම අරමුණු ඉටු කර ගැනීමේ යාන්ත්‍රණය පිළිබඳ ව එහි සඳහන්. මහජනතාවගේ සක්‍රීය දායකත්වය සහිත ව නිෂ්පාදනය වර්ධනය කිරීම හා නිෂ්පාදන ප්‍රතිලාභ සාධාරණ ලෙස සමාජයේ ව්‍යාප්ත කිරීමත් සාධාරණ මිලකට ගුණාත්මක භාණ්ඩ සේවාවක් සැපයීම හා අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා හිගයකින් තොර ව සැපයීම සහතික කිරීමත් ආර්ථිකයේ ඉල්ලුම් හා සැපයුම් අංශයේ අරමුණු අතර වැදගත් වනවා. රටේ නිෂ්පාදනය වර්ධනය කිරීමේදී තරගකාරී වෙළෙඳපොළ ක්‍රමයකට තවදුරටත් අවස්ථාව ලබා දීමත් රජය වෙළෙඳපොළ නියාමනය කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී නිෂ්පාදනය සංවිධානය කිරීමත් මෙහි යාන්ත්‍රණය බව අය වැය කතාවේ අවධාරණය කර තිබෙනවා.

මෙවර අය වැයෙන් රජය මැදිකාලීන ව ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සියයට 5ක පමණ අගයක වර්ධනයකින් යුතු ව පවත්වා ගැනීමටත් උද්ධමනය අඩු සහ ස්ථාවර අගයකින් පවත්වා

> මෙවර අය වැයෙන් රජය මැදිකාලීන ව ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය සියයට 5ක පමණ අගයක වර්ධනයකින් යුතු ව පවත්වා ගැනීමටත් උද්ධමනය අඩු සහ ස්ථාවර අගයකින් පවත්වා ගැනීමටත් ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ස්ථාවර ශේෂයක් පවත්වාගෙන යාමෙන් විනිමය අනුපාතය ස්ථාවර අගයක පවත්වා ගැනීමටත් අපේක්ෂා කරනවා. මෙමගින් දේශීය ව්‍යාපාරිකයන්ට සහ අපයනකරුවන්ට තම ව්‍යාපාර පිළිබඳ නිවැරදි පුරෝකථන සිදු කර ගැනීමේ හැකියාව ඇතිවීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර ස්ථාවර ව පවත්වා ගැනීමේ හැකියාව ලැබේ යැයි විශ්වාස කළ හැකියි.

ගැනීමටත් ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ස්ථාවර ශේෂයක් පවත්වාගෙන යාමෙන් විනිමය අනුපාතය ස්ථාවර අගයක පවත්වා ගැනීමටත් අපේක්ෂා කරනවා. මෙමගින් දේශීය ව්‍යාපාරිකයන්ට සහ අපයනකරුවන්ට තම ව්‍යාපාර පිළිබඳ නිවැරදි පුරෝකථන සිදු කර ගැනීමේ හැකියාව ඇතිවීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර ස්ථාවර ව පවත්වා ගැනීමේ හැකියාව ලැබේ යැයි විශ්වාස කළ හැකියි. ඒ අනුව 2025 වර්ෂයේදී අපනයන ආදායම ඩොලර් බිලියන 19ක් දක්වා ඉහළ නැංවීමටයි රජය බලාපොරොත්තු වන්නේ. ආර්ථිකයේ වර්ධනයත් අපනයන ආදායමේ ඉහළ යාමත් සහ අය වැය ප්‍රාථමික ශේෂය සියයට 2.3ක අතිරික්තයක් පවත්වා ගැනීමෙන් 2028 වර්ෂයේ ඉහළ යන ණය සේවාකරණය සඳහා පෙර සූදානමක් ඇති කර ගැනීමටත් මෙහිදී අපේක්ෂා කෙරෙනවා.

සංචාරකයන් පැමිණීමේ සංඛ්‍යාව පමණක් නොව ඔවුන් උත්පාදනය කරන වටිනාකම් පිළිබඳ ව ද අවධානය යොමු කරමින් සංචාරක ක්ෂේත්‍රය තව තවත් පුළුල් කිරීමට යටිතල පහසුකම් හා ඒකාබද්ධ නගර නාමකරණය සහ ප්‍රවර්ධන ව්‍යාපාරයකින් සහාය වීමට රජය රුපියල් මිලියන 500ක මුදලක් මෙවර අය වැයෙන් කර තිබෙනවා.



මෙවර අය වැය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අය වැයක් බව, පෙර පැවති අය වැය ක්‍රමයේ ම දිගුවක් බව, පවතින ආණ්ඩුව වාමාංශික ව්‍යාපාරයක් වුවත් මෙවර අය වැයෙහි වාමාංශික ව්‍යාපාරයක ලක්ෂණ දැකිය නොහැකි බව ඇතමුන් පවසනවා. එහෙත් මේ සඳහා ප්‍රතිචාර දක්වන විද්වතුන් ප්‍රකාශ කරන්නේ ලෝකයේ ධනවාදී හෝ සමාජවාදී ආර්ථික මේ වන විට දැකිය නොහැකි බවත් ඒ වෙනුවට ඇත්තේ ආර්ථික නිදහස් කරන ප්‍රතිපත්තියක් බවත්. මහචාර්ය වසන්ත අතුකෝරළට අනුව මෙය ජනතාවාදී අය වැයක්.

## නිෂ්පාදන ප්‍රවර්ධනය හා යටිතල පහසුකම්

ගෝලීය ආර්ථිකයකදී රටක සමස්ත ජනතාවගේ ජීවන තත්ත්වය රඳා පවතින ප්‍රධාන සාධකයක් වන්නේ අපනයන ක්ෂේත්‍රය. ශ්‍රී ලංකාවේ මෑත ආර්ථික ඉතිහාසය නිරීක්ෂණය කරන විට පෙනී යන ප්‍රධාන කරුණක් වන්නේ ආනයන මත යැපීමත් එයට අනුගාමී ව අපනයන ක්ෂේත්‍රයේ වර්ධනය අවම වීමත් නිසා ණය මත පෙළඹීමට සිදු වීම. මේ නිසා ශ්‍රී ලංකාව විශාල ණය බරකින් යුක්ත රටක් බවට පත් ව තිබෙනවා. ඉදිරියේදී විදේශීය ණය සේවාකරණය තීරණය වන්නේ ලබා ගන්නා අපනයන ආදායම මත බව නොරහසක්. එබැවින් අපනයන ක්ෂේත්‍රයේ වර්ධනය හා ආදායම් වර්ධනය අත්‍යාවශ්‍ය කාරණයක්. මේ නිසයි 2025 අය වැය ඩොලර් බිලයන 19ක පමණ ආදායමක් අපේක්ෂා කරන්නේ. ඒ අනුව අපනයන ක්ෂේත්‍රය ආවරණය කරන්නා වූ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා ද යෝජනා රාශියක් 2025 අයවැයෙහි ඇතුළත්.

අපනයන ප්‍රවර්ධනය සඳහා ජාතික අපනයන සංවර්ධන සැලැස්මක් සකස් කිරීම, ජාතික තීරුබදු ප්‍රතිපත්තියක් අනුව තීරු බදු නිර්ණය කිරීම, නිදහස් වෙළෙඳ ගිවිසුම් ජාලය පුළුල් කිරීම, අපනයනකරුවන් ලියාපදිංචිය ස්වයංක්‍රීයකරණය හා ඩිජිටල්කරණය කිරීමට ජාතික තනි වෙළෙඳ කවුළුව ක්‍රියාත්මක කිරීම, පැරණි රේගු පනත වෙනුවට නව රේගු පනතක් හඳුන්වා දීම, ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් පුළුල් කිරීම හා ඉහළ ආයෝජන විභවතාවයක් ඇති රටවලට ප්‍රමුඛතාව ලබා දීම අපනයන අංශ්‍ය ප්‍රවර්ධනයට ඉදිරිපත් කර ඇති අය වැය යෝජනා. මෙමගින් අපනයන අංශය සැලසුමකට අනුව විධිමත් ලෙසින් හා පුළුල් ක්ෂේත්‍රයක් ඔස්සේ ගමන් කිරීමටත් ක්ෂුද්‍ර, සුළු, මධ්‍ය පරිමාණ අංශයේ ව්‍යාපාරිකයන්ට අපනයන ක්ෂේත්‍රය හා සම්බන්ධ වීමට ඉඩ ප්‍රස්ථාවත් ලැබෙනු ඇති. රජය භාවිත නොකළ ඉඩම් ඵලදායි ආර්ථික කටයුතු සඳහා බදු දීම, ආයෝජනවලට ගැළපෙන පරිදි ආර්ථික පරිවර්තන පනත සංශෝධනය, ආයෝජන ආරක්ෂණ පනතක් සම්මත කර ගැනීම, රාජ්‍ය සේවය ඩිජිටල්කරණය, රටේ භූගෝලීය පිහිටීම උපක්‍රමික ව භාවිත කිරීම ආදී කරුණු රාශියක් ද මෙහි ඇතුළත්. මේ සියලු අරමුණු ඉටු කර ගැනීම සඳහා නිශ්චිත කාලවකවානු සහිත ව අවශ්‍ය කරන නීති සම්පාදනය කිරීම අය වැය කතාවේදී ජනාධිපතිවරයා අවධාරණය කළා.

සංචාරකයන් පැමිණීමේ සංඛ්‍යාව පමණක් නොව ඔවුන් උත්පාදනය කරන වටිනාකම් පිළිබඳ ව ද අවධානය යොමු කරමින් සංචාරක ක්ෂේත්‍රය තව තවත් පුළුල් කිරීමට යටිතල පහසුකම් හා ඒකාබද්ධ නගර නාමකරණය සහ ප්‍රවර්ධන ව්‍යාපාරයකින් සහාය වීමට රජය රුපියල් මිලියන 500ක මුදලක් මෙවර අය වැයෙන් කර තිබෙනවා.

ශ්‍රී ලංකාව නිෂ්පාදන ආර්ථිකයක් කරා යන ගමනට අය වැයෙන් පදනම සකස් කර ඇති බවයි බොහෝ ආර්ථික විශ්ලේෂකයන්ගේ අදහස. මෑතකාලීන ව රට ආර්ථික, සමාජ හා දේශපාලනික වශයෙන් අර්බුදයක් කරා ඇද දමනු ලැබුවේ ආදායමට වඩා පරිභෝජනය කරන රටක් වශයෙන් ඉතා විශාල ණය කන්දක් ද ඉතුරු කරමින්. මේ නිසා උපයමින් පරිභෝජනය

කිරීමේ අවස්ථාව එළැඹ තිබෙනවා. ඒ සඳහා රටේ නිෂ්පාදනය ඉහළ නැංවිය යුතුයි. මෙවර අයවැයෙහි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් රටේ ආර්ථික සංවර්ධනයේ කොඳු නාරටිය ලෙස සලකා ඔවුන්ට මූල්‍ය ප්‍රවේශ්‍ය සඳහා අහිමි වූ අවස්ථා උදා කර දීමට ඇපකර නොමැති මූල්‍ය ප්‍රවේශ්‍ය සඳහා අවස්ථාව ලබා දී තිබෙනවා. ඒ සඳහා සංවර්ධන බැංකුවක් පිහිටුවමින් තිබෙන බවත් පළමු පියවර වශයෙන් දැනට පවතින රාජ්‍ය බැංකු ඔස්සේ ජාතික ණය ඇපකර ආයතනය මගින් මේ සඳහා පහසුකම් සලසා තිබෙනවා. මෙමගින් ඇප නොමැති වීම නිසා ව්‍යාපාර සඳහා අවස්ථාව අහිමි වූ ග්‍රාමීය අංශයේ ව්‍යවසායකයන්ට අවස්ථාව හිමි කර දී තිබීමෙන් පැහැදිලි වන්නේ ආර්ථිකයේ සෑම කොටසකට ම නිෂ්පාදන කාර්යය සඳහා දායක වීමේ අවස්ථාව උදා කර දීමෙන් නිෂ්පාදනය ඉහළ දැමීමත් එහි ප්‍රතිලාභ සමස්තයක් වශයෙන් රටේ සෑම ප්‍රදේශකට ම හා සෑම පුද්ගලයකුට ම ලබා දීමේ සාධාරණ ප්‍රවේශය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමත් සමග රටේ ප්‍රධාන ආර්ථික අංශ තුනේ (කෘෂි කාර්මික, කාර්මික හා සේවා අංශ) වර්ධනයක් ඇති කිරීමට අවධානය යොමු ව තිබීම මෙවර අය වැයෙහි දැකිය හැකි ලක්ෂණයක්. නිෂ්පාදන ආර්ථිකයක් කරා යන ගමනකදී එය අත්‍යාවශ්‍ය සාධකයක් ද වනවා. ඒ අනුව ග්‍රාමීය හා වතු අංශයේ සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම, වසංගත සඳහා සූදානම, සැමට අධ්‍යාපන අවස්ථා ලබා දීම යටතේ පෙර පාසල් ළමයින්ගේ පෝෂණය හා පාසල් අධ්‍යාපනය නව්‍යකරණය, ශිෂ්‍යාධාර මුදල් ඉහළ නැංවීම, යාපනය පුස්තකාලය සංවර්ධනය කිරීම සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉදිරිපත් ව ඇති වැදගත් යෝජනා.

පොහොර සහනාධාරය අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 35000ක්, රජය විසින් සහතික මිලකට වී මිල දී ගැනීමට 2024/25 සඳහා රුපියල් මිලියන 5000ක්, වී හැර අනෙකුත් බෝග වගා ප්‍රවර්ධනය හා එමගින් ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ද රුපියල් මිලියන 500ක්, ඌණ උපයෝජිත ඉඩම් හඳුනා ගැනීමත් ඒවා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ආයෝජන සඳහා ලබා දීමට රුපියල් මිලියන 250ක් මෙවර අය වැයෙන් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා. කෘෂිකාර්මික අංශයේ පුරෝකථන හා කාලීන තීරණ ගැනීම සඳහා දත්ත පද්ධතියක අවශ්‍යතාව හඳුනාගෙන තිබීමත් ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහ ලෝක බැංකුවේ සහයෝගය ලබා ගැනීමට තීරණය කර තිබීමත් ආහාර සුරක්ෂිතතාව සඳහා ඉදිරිපත් වී ඇති වැදගත් යෝජනාවක්.

**මධ්‍ය කාලීන සාර්ව ආර්ථික - මූල්‍ය රාමුව 2023-2028** — ද.දේ.නි.යෙන් %ක් ලෙස

| දර්ශකය | 2023 (සත්‍ය) | 2024 (තාවකාලික) | පුරෝකතන 2025 | 2026 | 2027 | 2028 |
|---|---|---|---|---|---|---|
| සමස්ත ආදායම හා ප්‍රදාන | 11.1 | 13.6 | 15.1 | 15.1 | 15.2 | 15.3 |
| සමස්ත ආදායම | 11.0 | 13.4 | 15.0 | 15.0 | 15.1 | 15.2 |
| බදු ආදායම | 9.8 | 12.3 | 13.9 | 13.9 | 13.9 | 14.2 |
| බදු නොවන ආදායම | 1.2 | 1.1 | 1.1 | 1.1 | 1.1 | 1.1 |
| සමස්ත වියදම | 19.4 | 20.4 | 21.8 | 19.6 | 19.1 | 19.0 |
| පුනරාවර්තන වියදම | 17.0 | 17.8 | 17.8 | 15.5 | 15.0 | 14.8 |
| ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් | 2.4 | 2.6 | 4.0 | 4.1 | 4.1 | 4.2 |
| ජංගම ගිණුම් ශේෂය | -6.0 | -4.4 | -2.8 | -0.5 | 0.1 | 0.4 |
| ප්‍රාථමික ශේෂය | 0.6 | 2.2 | 2.3 | 2.3 | 2.3 | 2.4 |
| අයවැය හිඟය | -8.3 | -6.8 | -6.7 | -4.5 | -4.0 | -3.7 |

මූලාශ්‍රය - පුරවැසි අයවැය, මුදල්,ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

> ශ්‍රී ලංකාව නිෂ්පාදන ආර්ථිකයක් කරා යන ගමනට අය වැයෙන් පදනම සකස් කර ඇති බවයි බොහෝ ආර්ථික විශ්ලේෂකයන්ගේ අදහස. මෑතකාලීන ව රට ආර්ථික, සමාජ හා දේශපාලනික වශයෙන් අර්බුදයක් කරා ඇද දමනු ලැබුවේ ආදායමට වඩා පරිභෝජනය කරන රටක් වශයෙන් ඉතා විශාල ණය කන්දක් ද ඉතුරු කරමින්. මේ නිසා උපයමින් පරිභෝජනය කිරීමේ අවස්ථාව එළැඹ තිබෙනවා. ඒ සඳහා රටේ නිෂ්පාදනය ඉහළ නැංවිය යුතුයි.

තරුණ ව්‍යවසායකයන් සඳහා නිෂ්පාදන සමුපකාර ක්‍රමය හඳුන්වා දෙමින් විකල්ප නිෂ්පාදන ප්‍රවේශ අනුගමනය කිරීමට අවස්ථාව සලසා දී තිබීමත් ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය දිශානතියේ ස්වරූපය පෙන්වන්නක්. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමට 2025-2026 වර්ෂ සඳහා රුපියල් මිලියන 2500ක් ආයෝජනය කිරීමට ද මෙවර අය වැයෙන් යෝජනා කර තිබෙනවා. පොල් නිෂ්පාදනය ඇතුළු අනෙකුත් සුළු අපනයන බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම, ධීවර හා ජලජීවී වගාව ප්‍රවර්ධනය ද මෙහිදී අවධානය යොමු වූ ක්ෂේත්‍ර.

නිෂ්පාදන ආර්ථිකයක් කරා යන ගමනකදී ඒ සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යාවශ්‍ය කාරණයක්. කෘෂි කර්මාන්තයේ දියුණුවට බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ වාරිමාර්ග පද්ධතිය නිසා 2025 වසරේ වාරිමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමට රුපියල් මිලියන

78000ක් ආයෝජනය කිරීමට රජය යෝජනා කර තිබෙනවා.

ආර්ථිකයේ සෑම අංශයක ම දියුණුවට බලපාන ප්‍රධානතම සාධකයක් වන්නේ රටේ ප්‍රවාහන පද්ධතිය. එය නිෂ්පාදනයේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නංවනවා පමණක් නොව මානසික තෘප්තිමත්භාවයට ද හේතු වන්නක්. දුර්වල පොදු ප්‍රවාහන පද්ධතියක් භාවිත කිරීම නිසා සම්පත් නාස්තිය මෙන් ම ජීවිත හානි සහ දේපළ හානි ද බහුල වනවා. ප්‍රවාහන ක්ෂේත්‍රය හා බලශක්ති ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමෙන් ආර්ථිකයේ නිෂ්පාදනය වේගවත් වනු ඇතැයි අපේක්ෂා කරන්න පුළුවන්. ඒ අනුව පොදු ප්‍රවාහනය නවීකරණය කිරීම සඳහා 2025 අයවැයෙහි යෝජනා කිහිපයක් ම ඇතුළත්. මෙට්‍රො බස් සමාගම නමින් නව බස් සමාගමක් යටතේ ක්‍රියාත්මක වන බස් රථ සේවාවක් ආරම්භ වනු ඇති අතර ඒ සඳහා සුඛෝපභෝගී බස් රථ 100ක් හා මගීන්ට පහසුවෙන් ගමන් කළ හැකි වෙනත් බස් රථ 200ක් ගමනාගමන මණ්ඩලයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වනු ඇති. එය ඩිජිටල්කරණය වූ බස් රථ සේවාවක් ලෙස ක්‍රියාත්මක වීමට යෝජනා කර තිබීම ද විශේෂත්වයක්. දුම්රිය ප්‍රවාහන සේවය පිළිබඳ ව ද මෙවර අය වැයෙන් අවධානය යොමු ව තිබෙනවා. පැරණි දුම්රිය මැදිරි අලුත්වැඩියාව මෙන් ම නව දුම්රිය මැදිරි ඉදි කිරීමත් අපේක්ෂාවක්. මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ග්‍රාමීය අංශයේ මාර්ග හා පාලම් වැඩිදියුණු කිරීම පිළිබඳ අවධානය යොමු කිරීමෙන් පෙනී යන්නේ ආර්ථිකය නගරයෙන් ඔබ්බට ගොස් ග්‍රාමීය වශයෙන් ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාව. ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් ත්‍රිකුණාමලය තෙල් ටැංකි පිළිගත් ජාත්‍යන්තර ආයතන සමග ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙසින් පවත්වාගෙන යාමට ද යෝජනා කර තිබෙනවා.

කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයේ දියුණුව ඕනෑ ම රටක සංවර්ධන ගමන් මාර්ගයේ කැපී පෙනෙන ලක්ෂණයක්. ඒ අනුව කාර්මික නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතු ව පරන්තන්හි රසායනික කර්මාන්ත සඳහා වෙන් වූ කාර්මික කලාපයක් පිහිටුවීම, මෝටර් රථ හා රබර් නිෂ්පාදනය සඳහා ම වෙන් වූ කාර්මික ජනපදයක් පිහිටුවීම මේ යටතේ වැදගත් යෝජනා.

> ආබාධ සහිත පුද්ගලයන් සඳහා සහායක උපකරණ දේශීය ව නිෂ්පාදනය කිරීම, තරුණ තරුණියන්ගේ මානසික සෞඛ්‍ය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ආබාධිත පුද්ගලයන් හා අනාථ දරුවන් සඳහා අවධානය යොමු කිරීම, අභ්‍යන්තර අවතැන්වූවන් ජනමාධ්‍යවේදීන් හා කලාකරුවන් සඳහා නිවාස ලබා දීමේ වැඩසටහන් වැනි ක්ෂේත්‍ර ගණනාවක් ද 2025 අය වැය යෝජනාවල ඇතුළත්.

## සමාජ ආරක්ෂණය හා ජනතා සහන

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයෙන් පසුව දරිද්‍රතාව දෙගුණයකින් පමණ ඉහළ ගොස් ඇතැයි වරෙක ලෝක බැංකුව පැවැසුවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවත් අවදානම් කලාපයේ පසුවන පිරිසත් ඉහළ මට්ටමකට පවතිනවා. අය වැය කතාවේ පැවසූ පරිදි ම අර්බුද සමයේ සියයට 70ක තරම් ඉහළ ගිය උද්ධමනයට සාපේක්ෂ ව ඔවුන්ගේ ආදායම් ඉහළ ගියේ නැහැ. මේ නිසා අවදානමට ලක්විය හැකි ජනතාවට දැඩි බලපෑමක් එල්ල කර තිබෙනවා. අඩු ආදායම්ලාභී පුද්ගලයන්, වැඩිහිටියන්, කාන්තාවන් සහ ළමයින්, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් හා දිගුකාලීන රෝගවලට ගොදුරුවූවන් මේ යටතේ අවදානමට ලක්විය හැකි පිරිස්. රටේ ආර්ථිකයේ වර්ධනය සමග ප්‍රතිලාභ ගලායාම තහවුරු වන තුරු ඔවුන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම රජයක වගකීමක්. මේ නිසා රජය ක්‍රියාත්මක කරන්නේ නිශ්චිත සමාජ ආරක්ෂණ වැඩසටහන්. මෙරට අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කරලීම සඳහා ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන වන 'අස්වැසුම' යටතේ ඔවුන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීමට එහි ප්‍රතිලාභ ඉහළ නැංවීමටත් අස්වැසුම ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් රජය යෝජනා කර තිබෙනවා. යැපුම් මානසිකත්වයෙන් ඔබ්බට ගොස් ආත්ම විශ්වාසයකින් යුතු ව රටේ නිෂ්පාදන කාර්යයට යොමු



වීමට අස්වැසුම ප්‍රතිලාභීන්ට මේ නිසා අවස්ථාව ලැබෙනවා. පාසල් සිසුන් සඳහා අධ්‍යාපනික උපකරණ මිල දී ගැනීම සඳහා රුපියල් 6000ක දීමනාවක් ලබා දීම, ළමා නිවාසවල වාසය කරන ළමයින්ගේ සුභ සාධනය සහ ආරක්ෂාව තහවුරු කිරීම, අනාථ දරුවන් හා තරුණයන්ගේ සමාජ සුභ සාධනය ඉහළ නැංවීම හා ඒ සඳහා මාසික ව රුපියල් 5000ක මුදලක් ලබා දීම, ආබාධ සහිත පුද්ගලයන්ගේ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, ආපදා වන්දි මුදල රුපියල් 250000 සිට රුපියල් ලක්ෂ 10 දක්වා ඉහළ නැංවීම වෙන් කිරීමට යෝජිත ප්‍රතිපාදන. ආබාධ සහිත පුද්ගලයන් සඳහා සහායක උපකරණ දේශීය ව නිෂ්පාදනය කිරීම, තරුණ තරුණියන්ගේ මානසික සෞඛ්‍ය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ආබාධිත පුද්ගලයන් හා අනාථ දරුවන් සඳහා අවධානය යොමු කිරීම, අභ්‍යන්තර අවතැන්වූවන් ජනමාධ්‍යවේදීන් හා කලාකරුවන් සඳහා නිවාස ලබා දීමේ වැඩසටහන් වැනි ක්ෂේත්‍ර ගණනාවක් ද 2025 අය වැය යෝජනාවල ඇතුළත්.

රාජ්‍ය සේවකයන්ගේ අවම මූලික වැටුප ද රුපියල් 24250 සිට රුපියල් 40000 දක්වා ඉහළ දමා තිබෙනවා. එයට සමගාමී ව විශ්‍රාමික වැටුප් ද ඉහළ දමා ඇති අතර පෞද්ගලික අංශයේ අවම වැටුප රුපියල් 21000 සිට 30000 දක්වා ඉහළ නැංවීමටයි සේවා යෝජකයන්ගේ සංගමය එකඟ වී ඇත්තේ. වතු ජනතාවගේ වැටුප් පිළිබඳවත් නැවත සලකා බැලීමට මෙවර අය වැයෙන් යෝජනා කර තිබෙනවා.




## රාජ්‍ය අය වැය කළමනාකරණය

රජයේ අයවැය කළමනාකරණය මූලික වශයෙන් ම 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට යටත්වයි සකස් කර තිබෙන්නේ. ඒ අනුව රජයේ වියදම් සීමා මෙන් ම ආදායම් සීමා ද පවතිනවා. රජයේ වියදම් හා ආදායම් කළමනාකරණය පිළිබඳ ව අයවැය කථාවේ සඳහන්. 2025 ශ්‍රී ලංකා රජයේ අය වැයෙහි සමස්ත වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 21.8ක් (රුපියල් බිලියන 8835) වන අතර රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.1ක් (රුපියල් බිලියන 4990). ඒ අනුව සමස්ත අයවැය හිඟය සියයට 6.7 ක්. රාජ්‍ය වියදමින් රුපියල් බිලියන 4550ක් ණය සේවාකරණය සඳහා වෙන් කර තිබෙනවා.

සමස්ත රාජ්‍ය වියදම් කළමනාකරණයේදී පවතින ආණ්ඩුව ආදර්ශයක් ලෙස ක්‍රියා කරමින් අමාත්‍ය මණ්ඩලය 21 දක්වා සීමා කිරීම, ජනාධිපති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය වෙනුවෙන් වෙන් කර ඇති අත්‍යාවශ්‍ය නොවන පොදු සම්පත් මහජනතාව වෙනුවෙන් ඵලදායී ලෙස භාවිත කිරීමට නිර්දේශ කමිටුවක් පත් කිරීම, මැති ඇමතිවරුන්ගේ අධික ලෙස නඩත්තු වියදම් දැරීමට සිදු වන වාහන වෙන්දේසි කිරීම හා එමගින් රාජ්‍ය අංශයේ වාහන සඳහා යන අධික වියදම් අවම කිරීමේ ආදර්ශයක් ලබා දීම අයවැයෙහි කැපී පෙනෙන කාරණා.

රාජ්‍ය ආයතන විධිමත් කිරීම හා කාර්යක්ෂම සේවාවක් සැපයීමට ක්‍රියා කරමින් ඒවායේ අරමුණු හා ඵලදායිත්වය සමාලෝචනය කිරීමට කමිටුවක් පත් කිරීමටත් එමගින් තවදුරටත් පවත්වාගත යුතු, ඒකාබද්ධ කළ යුතු, අරමුණු වෙනස්

කළ යුතු හා වසා දැමිය යුතු රාජ්‍ය ආයතන පිළිබඳ තීරණය කිරීමට අය වැයෙන් අවධානය යොමු කර තිබෙනවා. වඩාත් ප්‍රශස්ථ මට්ටමමේ වියදමකින් යුතු කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් සැපයීමට අවශ්‍ය ආයතනික පද්ධතිය සකස් කිරීමට ඉන් හැකි වනු ඇති. රජය සතු ව්‍යවසායවල ආයතනික පාලනය සඳහා රාජ්‍ය හිමිකාරිත්වය සහ පාලනය සහිත පරිපාලන සමාගමක් ස්ථාපිත කිරීමත් අය වැය යෝජනාවක්.

රාජ්‍ය ආදායම් කළමනාකරණය සඳහා අපේක්ෂිත ආදායම් ලබා ගැනීමේදී බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.9ක් වන අතර සමස්ත ආදායම් හා ප්‍රදාන සියයට 15.1ක්. බදු ආදායම රැස් කිරීමේදී වාහන ආනයනයෙන් සැලකිය යුතු බදු ප්‍රමාණයක් අපේක්ෂා කරන බව අයවැය කතාව අනුව පැහැදිලි වනවා. කෙසේ වුවත් ආදායම් බදු රහිත සීමා ඉහළ දැමීම, බදු ගැලීප් සිදු කිරීම හා බදු ඉවත් කිරීම නිසා රජයට අහිමි වන අදායම් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ ඩිජිටල් සේවා සඳහා අගය එකතු කළ බදු හඳුන්වා දීම හා අපනයන සේවා සඳහා සංස්ථාපිත බදු පැනවීමෙන්. එයට සමගාමී ව බදු පරිපාලනය හා අනුකූලතාව වැඩිදියුණු කිරීම හා වාහන ආනයනයේදී අධීක්ෂණය කිරීමෙන් ඒ ඒ ක්ෂේත්‍රවලින් අපේක්ෂිත ආදායම ලබා ගැනීමට අපේක්ෂා කර තිබෙනවා.

## අභියෝග

රටේ ආර්ථික, සමාජ, දේශපාලන වැනි බොහෝ ක්ෂේත්‍රවල මෙන් ම මෙතෙක් අවධානය යොමු නොවූ ක්ෂේත්‍ර පිළිබඳවත් 2025 අය වැයෙන් අවධානය යොමු කර තිබෙනවා. ආර්ථිකයේ වර්ධනය මෙන් ම වර්ධනයට හිතකර පරිසරයක් සකස් කිරීමේ සිට වර්ධනයට අවශ්‍ය බාධක අවම කිරීම දක්වා පුළුල් ක්ෂේත්‍රයක අය වැය යෝජනා ව්‍යාප්ත වී තිබෙනවා. මෙහිදී අය වැයෙන් අපේක්ෂිත සියලු අරමුණු ඉටු කර ගැනීම සඳහා, අපේක්ෂා කළ ආකාරයෙන් ම වියදම් හා ආදායම් ළඟා කර ගැනීමත් ඒ අයුරින් ම ක්‍රියාත්මක වීමත් සිදු විය යුතු ව තිබෙනවා. ශ්‍රී ලංකාවේ පූර්ව තත්ත්ව හා සලකා බැලීමේදී ඇතැම් විට ඇතැම් ව්‍යාපෘති අපේක්ෂිත ආකාරයෙන් ම අපේක්ෂිත කාලවකවානුවලදී ඉටු කර ගැනීමේ හැකියාවක් ලැබී නැහැ. මේ නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කරන ලද අරමුණු ඉටු වූයේ ද නැහැ. ඇතැම් අවස්ථාවලදී ව්‍යාපෘති සඳහා අපේක්ෂා කරන ලද වියදම ඇස්තමේන්තු අගය ඉක්මවා යන අවස්ථා ද දක්නට ලැබුණා. 2023 වර්ෂයේ රජයේ අය වැය යෝජනා හා ඇතැම් ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු පවා ලබා දීමට රජය අපොහොසත් වූ බව වෙරිටේ රිසර්ච් ආයතනය වාර්තා කර තිබුණා.

මෙවර අය වැයෙන් ආර්ථිකයේ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන ව්‍යාපෘති යෝජනා පැවතුණත් අතීතයේ පැවති ගැටලු තවමත් පවතිනවානම් රජය අපේක්ෂා කරන ආකාරයෙන් ම එම අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වනු ඇති. මෙවැනි ගැටලු සඳහා ද විසඳුම් වශයෙන් අයවැයෙහි යම් යම් යෝජනා ඇතුළත් වුවත් ඒවා ක්‍රියාත්මක කිරීමේදී නිශ්චිත කාලවකවානුවකදී එම යෝජනා ක්‍රියාත්මක කිරීමේ අවදානම පිළිබඳ නැවත සලකා බැලිය යුතු වෙනවා. මේ සඳහා රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව සහ ඒ සඳහා වන ඉලක්ක පැනවීම හා ක්‍රියාත්මක වීමේදී පැන නගින ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබා දීම වැදගත් වනු ඇති. එහිදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ඇතුළු සමස්ත රාජ්‍ය අංශයේ ම වගකීම සුළුපටු නොවන බව අවබෝධ කර ගැනීම වැදගත්. අය වැය ප්‍රගතිය පිළිබඳ ව දැඩි ව අධීක්ෂණය කිරීම, අයවැය යෝජනා හා ඒවා ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුවත් වීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීමෙන් යම් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ කාර්යක්ෂම බව යම් ආකාරයකින් ඉහළ නැංවීමේ හැකියාව තිබෙනවා. මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් එස්. ඩී. ජේ. නිලුක්ෂාන් ප්‍රකාශ කර සිටියේ "අප මේ වන විටත් පුරවැසි අය වැය නමින් පොත් පිංචක් නිර්මාණය කර තිබෙනවා. එය සරල ව හා කෙටියෙන් දක්වා ඇත්තේ මහජනතාවගේ දැනුවත් වීම සඳහා. ඉදිරියේදී අය වැය යෝජනාවලට පිළිබඳ ව අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම පිළිබඳ ව අදළ ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීමට ද එවැනි වැඩපිළිවෙළක් තිබෙනවා" යනුවෙන්.
රාජ්‍ය ආදායම් අපේක්ෂිත ප්‍රමාණය අපේක්ෂිත ආකාරයෙන් ම ලබා ගැනීමේදී පෞද්ගලික අංශයේ ද කාර්යභාරය ඉතා වැදගත්. විශේෂයෙන් බදු ආදායම් රැස් කිරීමේදී දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව ඇතුළු රජය වෙනුවෙන් ආදායම් රැස් කරන ආයතනවල වගකීම හා කාර්යභාරය අවශ්‍ය වනවා. අය වැය කතාව ඉදිරිපත් කරමින් ජනාධිපතිවරයා ද ප්‍රකාශ කර සිටියේ ආදායම් බදු රැස් කිරීමේදී බදු රැස් කරන නිලධාරියාට මෙන් ම බදු ගණකාධිකාරීවරුන්ට, විගණන සමාගම් සහ අනෙකුත් පාර්ශ්වලට ද රජයට හිමිවිය යුතු බදු රැස් කර දීමේ වගකීම පැවරෙන බව.

මේ අනුව සමස්ත අය වැය යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම යනු රටේ සෑම පුරවැසියකුගේ ම සාමූහික ක්‍රියාවලියක ප්‍රතිඵලයක්.





**එස්. ඩී. ජේ. නිලුක්ෂාන්**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අය වැය දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# බදු පරිපාලනය විධිමත් විය යුතුයි

රජයේ අය වැය යනුවෙන් අදහස් වන්නේ කිසියම් මුදල් වර්ෂයක රජයේ ඉදිරි සැලැස්ම. ශ්‍රී ලංකාවේ අය වැය සෑම වර්ෂයක ම පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව නීතිමය වශයෙන් බලාත්මක වන ලියවිල්ලක්. විසර්ජන පනත ලෙසින් ද මෙය හඳුන්වනවා. සාමාන්‍යයෙන් විසර්ජන පනතක ඇති සුවිශේෂ ලක්ෂණය වන්නේ යම් කිසි වර්ෂයක අවසානයේ (දෙසැම්බර් 31 දිනට) එහි නීතිමය වලංගුභාවය අවසන් වීම. මේ නිසා සෑම වර්ෂයක ම විසර්ජන පනත පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන නීතියක් බවට පත් කර ගැනීම අවශ්‍ය වනවා. ඉන්පසුවයි රාජ්‍ය ආදායම් හා වියදම් සඳහා බලය ලැබෙන්නේ. එය රාජ්‍ය අය හා වැය පිළිබඳ ව ඉදිරි ප්‍රකාශනයක් වුවත් මෙමගින් රජයේ ප්‍රතිපත්ති සහ ඒ අනුව තීරණය වන ආර්ථිකයේ දිශානතිය ද පෙන්නුම් කරන රජයේ සැලැස්ම ද වනවා.

සාමාන්‍යයෙන් අයවැය සම්පාදන ක්‍රියාවලිය ඇරඹෙන්නේ වර්ෂයක මැයි මාසයේ පමණ. එම වර්ෂයේ ජූලි මාසය පමණ වන විට භාණ්ඩාගාර ලේකම් විසින් අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කරනු ලබනවා. ඉන්පසුව ඔක්තෝබර් මාසයේ පමණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර එය විවාදයට බඳුන් කිරීමෙන් අනතුරු ව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන පනතක් බවට පත්කර ගන්නවා. ඉදිරි වර්ෂය සඳහා රජයේ සැලැස්ම නොහොත් විසර්ජන පනත (අය වැය) වන එය ඉදිරි වර්ෂය සඳහා නීතිමය වශයෙන් බලාත්මකයි. කථානායකගේ අත්සනින් බල ගැන් වූ විසර්ජන පනතින් පසුව මුදල් අමාත්‍යවරයා විසින් භාණ්ඩාගාර ලේකම්වරයාට වොරන්ට් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව, භාණ්ඩාගාරය විසින් වියදම් දැරීමට බලය ලබාදෙන චක්‍රලේඛය නිකුත් කරනවා. ඒ අනුවයි අදාළ වර්ෂය සඳහා අමාත්‍යාංශ තම වියදම් දරන්නේ.

අය වැයක ප්‍රධාන වශයෙන් වියදම් වර්ග දෙකක් පවතිනවා. ඉන් පළමුවැන්න කුමන ආණ්ඩුවක් පැවතිය ද වියදම් කිරීමට සිදු වන අනිවාර්ය වියදම් කොටස. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවීම්, ණය හා පොලී හා නඩත්තු වියදම් ඇතුළු සාමාන්‍ය වියදම් මේ යටතට ගැනෙනවා. රජය විසින් රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ඉදිරි සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම වෙනුවෙන් දරනු ලබන වියදම් කොටසයි දෙවැනි වියදම් වර්ගය.

2025 වර්ෂයේ අය වැයේ විශේෂ ලක්ෂණයක් නම් මුදල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් අයවැය සාකච්ඡා සිදු කිරීමත් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට යටත් ව අය වැය සම්පාදන ක්‍රියාවලිය සිදු වීමත්. එකී පනතට අනුව රජයේ වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක මට්ටමේ පවත්වා ගත යුතු ව තිබුණා. එයිනුත් සියයට 4ක් ප්‍රාග්ධන වියදම් ලෙසින් පවත්වා ගත යුතු අතර රජයේ අනපේක්ෂිත වියදම් (වාර්ෂික අය වැය සංචිතය) මුළු ප්‍රාථමික වියදම්වලින් සියයට 2ක් පවත්වා ගැනීම කළ යුතු වුණා. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් මූලික එකඟතා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ ද අන්තර්ගත වන බැවින් එම කොන්දේසි ද මේ පනතින් ආවරණය වනවා. මෙයට අමතර ව නව රජයේ 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අන්තර්ගත කරුණු ද මූලික කරගත් බව අය වැය කථාවේ වියදම් යෝජනා 54 නිරීක්ෂණය කරන විට පෙනී යනවා.


නිෂ්පාදනය ආර්ථිකයක් බිහි කිරීම හා ඒ සඳහා ග්‍රාමීය අංශයේ දායකත්වය ලබා ගැනීම, ආර්ථික ප්‍රතිලාභ සමස්ත මහජනතාවට බෙදා හැරීම 2025 අය වැයේ ප්‍රධාන හා මූලික අරමුණු අතර වැදගත්. එයට අමතර ව රජය නිදහස් වෙළෙඳපොළ ආරක්ෂා කරන අතරතුර ම රජයේ යම් මැදිහත්වීමක් ද පවත්වාගෙන යාමට ක්‍රියා කර තිබෙනවා. ඒ අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් (නිෂ්පාදකයන්) ශක්තිමත් කිරීමටත් ව්‍යාපාර සඳහා නිදහස් පරිසරයක් ඇති කිරීමටත් මේ අය වැයේ යෝජනා ඇතුළත්. ඊට අමතර ව අපනයනය ඉලක්ක කරගත් යෝජනා, ආර්ථිකයට පහසුවෙන් ගලා යා හැකි වන පරිදි රජය ආරම්භ කරන ලද කඩිනම් සංවර්ධන යෝජනා ද මෙහි අන්තර්ගත වනවා. ශ්‍රී ලංකාව ලබාගෙන ඇති ණය 2028 වර්ෂයේ පටන් ගෙවීමට සිදු වන බව කවුරුත් දන්නා සත්‍යයක්. සමස්තයක් ලෙසින් ගත් විට 2025 අය වැය සකස් වී ඇත්තේ ඒ සඳහා පෙර සූදානමක් ඇති කර ගැනීමට සහ රට පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට අවශ්‍ය පදනම සකස් කර ගැනීමට. මේ සඳහා අවශ්‍ය නීතිමය පරිසරය සකස් කිරීමට නව නීති 11ක් සම්පාදනය කර යුතු බව අය වැය කථාවේ සඳහන්. මේ සියලු කාරණා පදනම් කරගෙන 2025 වර්ෂයේදී සියයට 5ක පමණ ආර්ථික වර්ධනයක් රජය බලාපොරොත්තු වනවා.

බොහෝ අය පෙන්වා දෙන පරිදි ශ්‍රී ලංකාවේ මෙයට පෙර අය වැය සහ එය ප්‍රායෝගික ව ක්‍රියාත්මක වීමේදී අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි වූ බව සත්‍යයක්. බොහෝ විට පුනරාවර්තන වියදම් එලෙසින් ම වියදම් කර තිබුණත් ප්‍රාග්ධන වියදම් අපේක්ෂිත මට්ටමින් වියදම් කර නැහැ. මේ සඳහා හේතු දෙකක් මා දකිනවා. අපේක්ෂිත ආකාරයෙන් ආදායම් නොලැබුණු අවස්ථාවකදී එය ප්‍රාග්ධන වියදම්වලින් කපා හැරීම සිදු වීමත් යම් යම් ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේදී පැවති දුර්වලතාවනුත්

මේ සඳහා හේතු වන්නට පුළුවන්. මෙවර අය වැයෙහි එය සිදු නොවීමටනම් අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ඇති කරගන්නා ඉලක්ක කරා යන ගමන් මාර්ගයේදී මතු වන ගැටලු කඩිනමින් විසඳා ගැනීමට ක්‍රියා කළ යුතු වනවා. 2025 අය වැයෙහි පවතින යෝජනා අනුවත් ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවේ මැදිහත්වීම මේ සඳහා නොඅඩුව ලැබෙන නිසාත් දූෂණ හා අක්‍රමිකතාවලින් තොර ආණ්ඩුවක් පිළිබඳ පවතින මහජන විශ්වාසය නිසාත් මේ ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වේයැයි මා විශ්වාස කරනවා. රාජ්‍ය සේවය කාර්යක්ෂම සේවාවක් කිරීම සඳහා යෝජනා ද මෙවර අය වැයට ඇතුළත් කර තිබෙනවා. නවක රජයේ නිලධාරින් 30,000ක් බඳවා ගැනීම, රාජ්‍ය නිලධාරින්ගේ මූලික වැටුප ඉහළ දැමීම, නව නීති හඳුන්වා දීම වැනි යෝජනා ද මේ අතරට අයත්. එහෙත් මේ සඳහා ඉතා වැදගත් වන්නේ රාජ්‍ය සේවයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයකුත් කඩිනම් තීරණ ගැනීමේ අවශ්‍යතාවත්.

මෙවර රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.1ක පමණ ප්‍රමාණයක් රජය බලාපොරොත්තු වනවා. සැබවින් ම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15ක් යනු රජයකට හොඳ ආදායම් තත්ත්වයක්. පසුගිය වර්ෂයේදීත් අපේක්ෂිත ආදායමේ ආසන්න මට්ටමක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වුණා. ඒ නිසා මෙවර අය වැයෙනුත් අපේක්ෂිත ආදායම අත්පත් කර ගැනීම කළ හැකි වේයැයි උපකල්පනය කිරීමේ හැකියාව පවතිනවා. එහෙත් 2025 අයවැයෙහි මෙය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා රජයට හිමි විය යුතු ආදායම් රැස් කිරීමේ ක්‍රියාමාර්ග පහසුකරණය සඳහා බදු පරිපාලනයේ සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳ ව ජනාධිපතිවරයා අයවැය කතාවේදී පැවසුවා. කෙසේ වුවත් බදු පරිපාලනයේ යම් යම් ගැටලු පවතින බවයි මගේ පෞද්ගලික අදහස. ඒ සඳහා හේතු සොයා බලා කඩිනම් විසඳුම් ලබා දීමෙන් රජය බලාපොරොත්තු වන අපේක්ෂිත ආදායම අත්පත් කර ගැනීම අපහසු කාර්යයක් නොවනු ඇති. රටේ ශ්‍රම බලකාය මිලියන 9ක් පමණ සිටිනවා. ඒ අතුරින් මිලියන 3ක් පමණ විධිමත් අංශයේ රැකියා කරන පුද්ගලයන්. මේ විධිමත් අංශය හෝ ඉලක්ක කරගෙන රාජ්‍ය ආදායම් රැස් කර ගැනීම කළ හැකිනම් එය මූලික වශයෙන් වඩා යහපත් තත්ත්වයක් වේවි.

සියලු පුරවැසියන්ට ආර්ථික ක්‍රියාවලියට සහභාගි විය හැකි පරිදි අවස්ථා වැඩිදියුණු කර, එහි ප්‍රතිඵල සමාජයේ සෑම ස්ථරයකට ම සාධාරණ ලෙස ලබා ගත හැකි අයුරින් ආර්ථික වර්ධනය සිදු විය යුතු බව ජනාධිපතිවරයා තම අය වැය කතාවේදී ප්‍රකාශ කළා. එය 2025 අය වැය කථාවේ හරය ලෙසිනුයි මා දකින්නේ. පවතින ආණ්ඩුව බලයට ඒමට පෙර සමාජයේ බොහෝ පිරිස් විවිධ මත පළ කළ බවත් පෞද්ගලික දේපළ ක්‍රමය අහිමි කිරීමක් පවා සිදු විය හැකි යැයි ඔවුන් පැවසු බවත් ජනාධිපතිවරයා තම අය වැය කතාවේදී අවධාරණය කළා. කෙසේ වුවත් 2025 අය වැයෙහි තරගකාරී වෙළෙඳපොළ ක්‍රමය පවත්වාගෙන යන අතරතුර රජය යම් ආකාරයක මැදිහත්වීමක් සිදු කරන බව ප්‍රකාශ වීමෙන් සහ ඒ සඳහා යෝජනා ඉදිරිපත් වීමෙන් ජාතික හා ජාත්‍යන්තර ප්‍රජාවගේ විශ්වාසය හා පැසසුමට මෙවර අය වැය පාත්‍ර වූ බව විවිධ ජනමාධ්‍ය ඔස්සේ ප්‍රකාශ වී තිබුණා. රාජ්‍ය මූල්‍ය විනය, ආර්ථික ස්ථායිතාව තහවුරු කිරීම, ගැඹුරු හා සංකීර්ණ ආර්ථික අර්බුදයෙන් රට ක්‍රමික ව ගොඩගැනීම සඳහා පැහැදිලි දිශානතියක් සැපයීම සම්බන්ධයෙන් 2025 අය වැයෙහි ඇති දායකත්වය ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය, ශ්‍රී ලංකා බැංකු සංගමය, Ceylon Chamber of Commerce, Chamber of Young Lankan Entrepreneurs (COYLE), Federation of Chambers of Commerce and Industry of Sri Lanka (FCC¸SL), Joint Apparel Association Forum, Federation of Chambers of Commerce and Industry of Sri Lanka (FCC¸SL) වැනි සංසද හා සංගම් විවිධ අවස්ථාවලදී අවධාරණය කර තිබුණා. වෘත්තීය හා ව්‍යාපාර පිළිබඳ මුල් මට්ටමේ ආර්ථිකය හසුරුවන්නන් වන ඔවුන්ගේ විශ්වාසය හා අය වැය පිළිබඳ ධනාත්මක කරුණු දැක්වීම අය වැයෙහි දක්වා ඇති යෝජනා හුදු ප්‍රතිපත්ති ප්‍රකාශනවලින් ඔබ්බට ගිය, සාක්ෂාත් කරගත හැකි ප්‍රායෝගික යථාර්ථයක් ලෙස විවිධ ක්ෂේත්‍ර පිළිගෙන ඇති බවට වන සංඥාවක් ලෙසයි මා දකින්නේ.



# ජනතාවාදී මුහුණුවරක්

ශ්‍රී ලංකාවේ 2025 රාජ්‍ය අයවැය ලේඛනය සකස් කෙරුණේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇතිකර ගෙන තිබූ එකඟතාවලට අනුකූල ව. ජාත්‍යන්තර අරමුදලෙන් ලැබුණු ණය මුදලේ සිව් වැනි වාරිකය ලබා ගැනීමටනම් එම කොන්දේසිවලට එකඟ විය යුතු වුණා. එහි කිසිදු ගැටලුවක් නැහැ. මේ නිසා 2025 අයවැය ලේඛනය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඉලක්ක සමග සමගාමී විය යුතු ව තිබුණා. රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 15ක මට්ටමට ගෙන ඒම, රාජ්‍ය වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 21ක මට්ටමක පවත්වා ගැනීම, ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 2.3කට ගෙන ඒම, අයවැය හිගය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 5.2ක මට්ටමට ගෙන ඒම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවට දෙනු ලැබූ ප්‍රධාන ඉලක්ක.
මේ ඉලක්කවලින් රාජ්‍ය වියදම හැර අනෙකුත් ඉලක්ක ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට සමගාමී ව ශ්‍රී ලංකා රජය ද අපේක්ෂා කරනවා. නමුත් රාජ්‍ය වියදම ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 6.7ක සාපේක්ෂ ඉහළ අගයකුයි ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරන්නේ. මේ අනුව අපිට පෙනී යනවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාර්ව ආර්ථික ඉලක්ක සමග යම්කිසි ආකාරයක සමගාමී තත්ත්වයක් මේ අයවැයෙහි පවත්වාගෙන යන බව.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලබා දී තිබෙන්නේ සාර්ව ආර්ථිකය සම්බන්ධයෙන් වූ ඉලක්ක. ඉන් ඔබ්බට ගොස් ආර්ථිකය හසුරුවන වැඩපිළිවෙළකුයි අයවැයෙන් ඉදිරිපත් කෙරෙන්නේ. ජාත්‍යන්තර අරමුදල ලබා දුන් ඉලක්ක සපුරා ගනිමින් රටට අවශ්‍ය සහ රටට ගැළපෙන ආකාරයේ ඉලක්ක ඇති කර ගැනීමයි 2025 රජයේ අයවැයෙන් සිදු කළ යුතු වන්නේ. ඒ පිළිබඳ අවධානය යොමු කරන විට අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කර ගැනීම, බදු ක්‍රමය සරල කිරීම, රජයේ භාවිත නොකරන ඉඩම් බදු දීම, නිදහස් වෙළෙඳ ගිවිසුම් සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩි දියුණු කිරීම වැනි පාර්ශ්ව රාශියක් කෙරෙහි රජයේ අවධානය යොමු ව තිබෙනවා.




මහාචාර්ය
**වසන්ත අතුකෝරළ**
ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන විද්‍යා අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය


**2025 වර්ෂයේ රජයේ අය වැය තුළ ඇති ප්‍රධාන ඉලක්ක අතර ආර්ථික වර්ධනය සියයට 5ක මට්ටම දක්වා වර්ධනය කර ගැනීම, දරිද්‍රතාව අවම කර ගැනීම, කාලයක් තිස්සේ පවත්නා ආර්ථිකයේ පවතින ව්‍යුහාත්මක ගැටලු සඳහා විසඳුම් ලබා දීම ආදිය දැක්විය හැකියි. ඩිජිටල් ආර්ථිකයක් ඇති කිරීම මෙහිදී කැපී පෙනෙන කාරණයක්. එනම් රජයේ අපේක්ෂාව වන්නේ සමාජ ආරක්ෂණය පවත්වා ගනිමින් ඩිජිටල් ආර්ථිකයක වර්ධනයක් ඇති කර ගැනීම. එහිදී අනාගත ලෝකයට ගැළපෙන ආකාරයේ ඩිජිටල් ආර්ථිකයක් සඳහා එළැඹුක් පැවතීම හා එමගින් ගනුදෙනු පිරිවැය අවම කිරීමේ උත්සාහය දකින්න පුළුවන්.**

අධ්‍යාපනය, සෞඛ්‍ය, තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම, සංචාරක ව්‍යාපාරය, ප්‍රවාහනය වැනි ක්ෂේත්‍ර කෙරෙහි ඉතා ඉහළ අවධානයක් යොමු කර තිබීමත් මේ අයවැයෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයක්.

ශ්‍රී ලංකා රජයේ 2025 අයවැය කෙරෙහි න්‍යායාත්මක අවධානය යොමු කරන විට විවිධ පාර්ශ්ව විසින් විවිධ නිර්වචන ඉදිරිපත් කර තිබෙනවා. එසේ වුවත් ගෝලීය ආර්ථික දෙස අවධානය යොමු කරන විට අපට පෙනී යනවා ධනවාදය හෝ සමාජවාදය වැනි ආර්ථික මොඩල මේ වන විට ලෝකයේ දැකිය නොහැකි බව. ලෝක ආර්ථිකයේ දැකිය හැක්කේ නිදහස් ලිබරල් ආර්ථිකයකට ගමන් කළ හැකි ආකාරයේ, අදාළ රටට ගැළපෙන ආකාරයේ ආර්ථික මොඩලයක් භාවිත කිරීමක්. සත්‍ය වශයෙන් ම ශ්‍රී ලංකාවේ ආර්ථික නිදහසක් නොමැති බවයි මගේ පිළිගැනීම. උදාහරණයක් ලෙස ඉඩම් නිදහස්කරණයේදී අයිතිය තහවුරු කෙරෙන ලියවිල්ලක් හෝ ඔප්පුවක් නොමැති වීම, මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රාග්ධන පහසුකම් සපයා ගැනීමට අවශ්‍ය වෙලාවට ණය මුදලක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති වීම දක්වන්න පුළුවන්. නමුත් ආර්ථිකය නිදහස් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ සඳහා වන නීති පද්ධතිය දියුණු කිරීමත් ප්‍රාග්ධන වෙළෙඳපොළ, ඉඩම් වෙළෙඳපොළ හා ශ්‍රම වෙළෙඳපොළ මීට වඩා නිදහස් වීමත් සිදු විය යුතුයි. එවැන්නක් මේ අය වැයෙහි මා දකින්නේ නැහැ. එයින් අදහස් වන්නේ ඇතැමුන් ප්‍රකාශ කරන අය වැයෙහි පවතින ලිබරල් දර්ශනය මෙහි නොමැති බව. ඒ වෙනුවට රජය ආර්ථිකයේ ක්‍රියාත්මක වී තිබෙන බවක් මේ අය වැයෙහි මා දකිනවා. උදාහරණයක් ලෙස කොළඹ නගරයට සුඛෝපභෝගී බස් රථ 100ක් ලබා දීමට රුපියල් බිලියන 3ක් පමණ වෙන් කර තිබෙනවා. ලිබරල් ක්‍රමයකට රජය යනවානම් රජයට හැකියාව තිබෙනවා මේ සඳහා පෞද්ගලික අංශය යොදවා ගැනීමට. එමගින් රජයට බදු ආදායමක් ද ලැබෙනවා. රජයේ වියදම ද රුපියල් බිලියන 3කින් අඩු වීමක් සිදු වනවා. ලිබරල් ක්‍රමයකදී සිදු වන්නේ එවැන්නක්. මේ නිසා මා දකින්නේ 2025 අය වැය ලිබරල් ක්‍රමයේ අය වැයක් ලෙසින්

නොව රජය යම් ආකාරයක ආර්ථිකය මෙහෙයවන ස්වරූපයක්. සමස්තයක් ලෙස ගත් විට මෙවර අය වැයෙහි ආර්ථිකයේ සෑම ක්ෂේත්‍රයක් ම ආවරණය වී තිබීම ඉතා යහපත් තත්ත්වයක්. පෙර පාසල් ළමයින් සහ අනාථ දරුවන් කෙරෙහි අවධානය යොමු කිරීම මීට පෙර සිදු වී නැහැ. එවැනි ක්ෂේත්‍ර රාශියක් කෙරෙහි මෙවර අය වැයෙන් අවධානය යොමු කර තිබෙනවා. එම නිසා මෙය ලිබරල් අය වැයක් නොව ජනතාවාදී අය වැයක් ලෙසයි මා දකින්නේ.

ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක ආර්ථික ස්ථායිතාව හා වර්ධනය ඇති කර ගැනීම, දේශපාලන ස්ථාවරත්වය ඇති කර ගැනීම යන ද්විත්ව අරමුණු ඉටු කර ගැනීම පරස්පර වූ තත්ත්වයක් කරා ගමන් කිරීමක්. එයින් අදහස් වන්නේ එක් අරමුණක් ඉටු කර ගැනීමට දරන උත්සාහයකදී ඇතැම් විටෙක අනෙක් අරමුණ බිඳ වැටීමට යම් සම්භාවිතාවක් ඇති බව. දේශපාලන ස්ථාවරත්වය පවත්වාගෙන යාමටනම් මහජන කැමැත්ත අඛණ්ඩ ව පවත්වාගත යුතුයි. ඒ සඳහා මහජනතාවගේ ඉල්ලීම් ඉටු කිරීමට ආණ්ඩුවකට සිදු වනවා. මහජන ඉල්ලීම ඉටු කිරීමේදී රාජ්‍ය වියදම් විශාල ලෙස ඉහළ යාමේ හැකියාවක් තිබෙන නිසා රජයට ණය මත පෙළඹීමට සිදු විය හැකියි. මෙහි අවසන් ප්‍රතිඵලය ආර්ථිකයේ අස්ථාවර බවක් ඇති වීම. 2025 අයවැය නිරීක්ෂණය කරන විට මා දකින්නේ 'ආර්ථික ස්ථායිතාව' යන අරමුණ යම් මට්ටමක පවත්වා ගනිමින් ජනතා කැමැත්ත පවත්වා ගැනීමට ද රජය ක්‍රියා කර ඇති බවක්. සහනාධාර ඉහළ දැමීම, වැටුප් මට්ටම ඉහළ දැමීම, බදු ක්‍රමයේ සංශෝධන ඇති කිරීම යනාදිය ඊට උදාහරණ. ඒ අනුව 2025 අය වැය සාපේක්ෂ වශයෙන් දේශපාලන ස්ථාවරත්වය පවත්වා ගෙන යාම සඳහා අවධානය යොමු කරන ලද අය වැයක් ලෙස දකින්න පුළුවන්. මේ අය වැයෙහි ආර්ථික ස්ථායිතාව සඳහා අවධානය යොමු කර නැතැයි යන්න එයින් කිසි විටෙකත් ගම්‍ය වන්නේ නැහැ. එය සාපෙක්ෂ කාරණයක් පමණයි.

ඇතැමුන් 2025 අය වැය පවතින ආණ්ඩුවේ 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' යන ප්‍රතිපත්ති ප්‍රකාශනය සමග නොගැළපෙන බවක් ප්‍රකාශ කරනවා. නමුත් ඕනෑ ම දෙයක් විශ්ලේෂණය කරන විට පවතින තත්ත්වය පදනම් කර ගනිමින් එය කළ යුතුයි. මේ ආණ්ඩුව බලයට පත්වන විට විශාල ණය කන්දක් ඇතුළු ආර්ථිකයේ සැඟවුණු ගැටලු රාශියක් තිබුණා. 2024 වර්ෂයේ ණය සඳහා පොලී ගෙවීමට රුපියල් බිලියන 2690ක් වැය කර තිබුණා. මේ වසරේදී රුපියල් බිලියන 2950ක් ඒ සඳහා වැය කළ යුතු වනවා. ඒ අනුව බදු ආදායමෙන් සියයට 64ක් වැය වන්නේ ණය සඳහා පොලී ගෙවීමට. මේ ආකාරයට පොලී ගෙවීමට සිදු වූයේ පසුගිය ආණ්ඩුව භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර සියයට 30 හා 35 ආදී ලෙස මිල දී ගැනීම නිසා. මේවායේ පොලිය ඉතාමත් ඉහළ අගයක්. මෙවැනි හේතු නිසා රජයට ස්වාධීන ව අය වැය සකස් කිරීමට හැකියාව නැහැ. ඒ නිසා 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' යන්න ක්‍රියාත්මක කිරීම සඳහා වූ පූර්ණ අය වැයක් ලෙස මා මෙය දකින්නේ නැති වුවත් රජය ජනතාවගේ පාර්ශ්වයෙන් සැලකිය යුතු මට්ටමකින් ක්‍රියා කර තිබෙන බව පෙනෙනවා. එවැනි රටක් ගොඩ නැගීමටනම් රටේ ආර්ථිකයේ හා සමාජයේ කාලයක් තිස්සේ පවතින බාධක ඉවත් කර ගැනීම සහ ආර්ථික නිදහස්කරණය ඇති විය යුතුයි. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම කළ යුතුයි.

2025 වර්ෂයේ රජයේ අය වැය තුළ ඇති ප්‍රධාන ඉලක්ක අතර ආර්ථික වර්ධනය සියයට 5ක මට්ටම දක්වා වර්ධනය කර ගැනීම, දරිද්‍රතාව අවම කර ගැනීම, කාලයක් තිස්සේ පවත්නා ආර්ථිකයේ පවතින ව්‍යුහාත්මක ගැටලු සඳහා විසඳුම් ලබා දීම ආදිය දැක්විය හැකියි. ඩිජිටල් ආර්ථිකයක් ඇති කිරීම මෙහිදී කැපී පෙනෙන කාරණයක්. එනම් රජයේ අපේක්ෂාව වන්නේ සමාජ ආරක්ෂණය පවත්වා ගනිමින් ඩිජිටල් ආර්ථිකයක වර්ධනයක් ඇති කර ගැනීම. එහිදී අනාගත ලෝකයට ගැළපෙන ආකාරයේ ඩිජිටල් ආර්ථිකයක් සඳහා එළැඹුක් පැවතීම හා එමගින් ගනුදෙනු පිරිවැය අවම කිරීමේ උත්සාහය දකින්න පුළුවන්.

එම අරමුණු ඉටු කර ගැනීමටනම් පවත්නා නීතිරීති සංශෝධනය කිරීම හා නීති පද්ධතිය වෙනස් කිරීම, ආයතනවල නව නිලධාරීන් පත් කිරීම, විවිධ ආයතන මෙහෙයවීම සඳහා දක්ෂ හා පුහුණු නිලධාරින් පත් කිරීම, ඉතා දුර්වල මට්ටමක පවතින රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, නාස්තිය දූෂණය වංචාව තුරන් කිරීම ආදිය කළ යුතු වනවා. දේශපාලන තන්ත්‍රය වෙනස් වුවත් රාජ්‍ය සේවයේ තවමත් සිටින්නේ සාම්ප්‍රදායික නිලධාරි පිරිසක්. ඒ නිසා රාජ්‍ය අංශයේ කාර්යක්ෂතාව ඇති කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් පමණයි රජයට ඔවුන් අපේක්ෂා කරන ගමන යා හැකි වන්නේ. මා දකින්නේ මේ සියලු කාරණා රජයට ඉදිරියේදී මුහුණදිය හැකි අභියෝග හැටියට.



# අපනයන ප්‍රවර්ධනයට අත හිත



**ධනනාත් ප්‍රනාන්දු**
ආර්ථික විශ්ලේෂක

මා දකින ආකාරයට ශ්‍රී ලංකා රජයේ 2025 අය වැය, පැතිකඩ තුනක් සමබර කර ගැනීමට සැකසුණු අය වැයක්. එම පැතිකඩ වන්නේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති පිළිබඳ දිශානතිය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇතිකර ගත් එකඟතා, රජයේ ආදායම සහ වියදම අතර තුලිතතාව. සාමාන්‍යයෙන් සෑම අය වැයක ම ආණ්ඩුවක ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ අදහසක් ලබා ගත හැකි වුවත් මෙවර අය වැයෙහි එහි විශේෂත්වයක් පවතිනවා. නව දේශපාලන සංස්කෘතියක ආරම්භයත් සමග ජනතාවගේත් ව්‍යාපාරික ලෝකයේත් ඉහළ අවධානයක් යොමු වී තිබුණේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ ව. ජනාධිපතිවරයාත් අය වැය කතාවේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ ව ඉස්මතු කළා. ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික ගමන් මාර්ගයේ 2025 අය වැය සුළුවෙන් තැකිය නොහැකියි. එසේ ම එය සුවිශේෂ ලක්ෂණ රාශියක් අන්තර්ගත වුණු අය වැයක්. ණය ප්‍රතිව්‍යුහගතකරණය බොහෝදුරට අවසන් ව තිබෙන අවස්ථාවක ඉදිරිපත් වීමත් 2028 වර්ෂයේදී නැවත ණය ගෙවීම සිදු කිරීමේ හැකියාව පිළිබඳ විශ්වාසයක් ඇති කර




ගැනීමත් නව ආණ්ඩුවේ ප්‍රථම අය වැය වීමත් මෙහි ඇති එම සුවිශේෂ ලක්ෂණ.

මෙවර අය වැය ඉදිරිපත් වූ ආර්ථික, සමාජ හා දේශපාලන පසුබිම අනුව පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩඒමට තරම් වූ අරමුණු සහ ඉලක්ක රාශියකුත් ඒවා ඉටු කර ගැනීම සඳහා වන සාධනීය තත්ත්වයකුත් රටට ඇති බව මා විශ්වාස කරනවා. පළමුවෙන් ම අයවැයෙහි අපනයන ප්‍රවර්ධනය සඳහා වන යෝජනා පිළිබඳ අවධානය යොමු කළහොත් ඇතැම් යෝජනා අලුත් යෝජනා නොවුණත් එය නව ආණ්ඩුවේ දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කිරීම වැදගත්. එයට හේතුව බොහෝ පිරිස් අවධානයෙන් සිටි ආණ්ඩුවේ ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ ඉඟියක් එමගින් සැපයෙන නිසා. බැඳීම් නොමැති ස්වභාවයත් වංචා දූෂණ අක්‍රමිකතාවලින් තොර පාලනයක විශ්වාසය තිබූ නිසාත් රටේ ආර්ථිකය නවතම පිරිසකට මනාව ක්‍රියාත්මක කළ හැකි වේයැයි මහජනතාවට විශ්වාසයක් ද පැවතුණා. නව රේගු පනතක් ගෙන ඒමෙන් අපනයන ප්‍රවර්ධනයට තිබූ බාධා අවම වීමක් සිදු වේයැයි අපේක්ෂා කරන්න පුළුවන්. පවතින රේගු පනත වසර සියයකට වඩා පැරණි පනතක්. එම පනතින් අප අපේක්ෂා කරන අපනයන ආර්ථිකය ළඟා කර ගැනීමට හැකියාවක් නැහැ. නව තීරු බදු ක්‍රමය සරල කිරීම, අපනයන ආනයන ක්‍රියාවලිය ඒකාබද්ධ කිරීම හා ඩිජිටල්කරණය (National Single Window), රටවල් සමග ආනයන අපනයන ආර්ථිකයේ තරගකාරී ව ක්‍රියාත්මක වීමට වෙළෙඳ ගිවිසුම් පිළිබඳ සලකා බැලීම, බුන්වත් වීමේ නීති, රජයට අයත් ව්‍යාපාර රජයේ අයිතිය සහිත ව එක ම ආයතනයක් යටතට පත් කිරීම හා ඒවා කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීම යනාදී යෝජනා ඉතාමත් සුබවාදී සහ ධනාත්මක යෝජනා. මේ යෝජනාවලින් ආර්ථිකයේ ප්‍රවර්ධනයට අවශ්‍ය නීති සම්පාදනයත් පහසු ගමන් මගකට අවශ්‍ය ලිහිසිකාරක සැපයීමත් ආර්ථිකයේ ප්‍රවර්ධනයට මෙතෙක් පැවති යම් යම් බාධාකාරී තත්ත්ව ඉවත් වීමත් සිදු ව තිබෙනවා.

අපනයන සංවර්ධනය සඳහා පෞද්ගලික අංශය සමග එක් වීම හා ඉඩම් ලබා දීම, කෘෂිකර්මාන්තය හා අනෙකුත් කර්මාන්ත සඳහා අවශ්‍ය ඉඩම් වෙළෙඳ කලාප (Industrμal Zone) නිර්මාණය කිරීම, කොළඹ වරාය බටහිර පර්යන්තය 2 හා උතුරු වරාය පෞද්ගලික අංශය සමග ඒකාබද්ධ ව සංවර්ධනය කිරීම 2025 අය වැය යෝජනා අතරට අයත්. මේ සියලු යෝජනාවලින් සහ ප්‍රතිපත්තිමය තීරණවලින් අපනයන ප්‍රවර්ධනයට ලබා දී තිබෙන්නේ විශාල බලයක්.

ජාත්‍යන්තර ආයෝජකයන් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීම සඳහා පරිසරය සකස් කිරීමෙන් ඔවුන්ට අත දිගු කිරීමක් මෙවර අය වැයේ දකින්නට පුළුවන්. ජාත්‍යන්තර ප්‍රජාවගේ විශ්වාසය දිනා ගැනීමට එයින් හැකියාව ලැබෙනවා. එය රටේ ආයෝජන ඉහළ යාමටත් ආර්ථිකයේ වර්ධනයටත් අත්‍යාවශ්‍ය සාධකයක්.

මේ යෝජනාවලටත් වඩා වැදගත් වන්නේ මේවා අපේක්ෂා කරන ආකාරයෙන් ම ක්‍රියාත්මක කිරීම. 2025 අය වැයේ දැනටමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එකඟතාවක් වන ආදායම හා වියදම අතර පරතරය ඉක්මවා ගොස් තිබෙනවා. කෙසේ වෙතත් ආදායම් රැස් කිරීමේදීත් රාජ්‍ය වියදම්වලදීත් අය වැයෙහි පවතින යෝජනා ඉතා කෙටි කාලයකින් අත්පත් කරගත යුතු වනවා. එය අභියෝගාත්මකයි. එහෙත් කළ යුතුයි. එය සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේ ම වගකීමක් හා යුතුකමක්.

# සිනමා කෘති ප්‍රදර්ශනය අභියෝගයක්










**ප්‍රශ්නය;** කලාව සහ සමාජයේ විවිධ භූමිකා ඔස්සේ ක්‍රියාකාරී පුද්ගලයකු වන ඔබ නිර්මාණකරණයේ යෙදෙන්නේ හුදු විනෝදාස්වාදයට ද? සමාජ මෙහෙවරකට ද?

**පිළිතුර;** මා කලාවේ නිරත වන්නේ සමාජ මෙහෙවරක් විදිහටවත් විනෝදාස්වාදයටවත් නොවෙයි ආත්ම ප්‍රකාශනයට. ඒ ප්‍රකාශනවලින් යම් සමාජ මෙහෙවරක් වෙන්න පුළුවන්. මගේ නිර්මාණවලින් විනෝදාස්වාදයක් දකින්නත් පුළුවන්.

**ප්‍රශ්නය;** ඔබේ බොහෝ නිර්මාණ දේශපාලනික වන්නා සේ ම ස්ත්‍රීත්වය, ලිංගිකත්වය තේමා කර ගන්නවා නේද?

**පිළිතුර;** සමාජයේ ස්ත්‍රීත්වයට හිමි වන තැන කුමක්ද? ඒ ගැන කතා කිරීමත් දේශපාලනිකයි. ලිංගිකත්වය වුණත් දේශපාලනිකයි. කිසියම් මොහොතක, කිසියම් තත්ත්වයක එම මතවාදය පෝෂණය කරන්නේ දේශපාලනය. අප කුඩා අවධියේදී ස්ත්‍රීන්ට තිබුණු තත්ත්වයට සාපේක්ෂ ව කිසියම් නිදහසක් අද සමාජයේ ස්ත්‍රීන් භුක්ති විඳිනවා. අද විශ්වවිද්‍යාලවලට ඇතුළු වන වැඩි ප්‍රතිශතය ස්ත්‍රීන්. ඒ කාලයට වඩා අද ඔවුන් පෙරමුණේ සිටිනවා. මේ සාධනීය දේවල් යම් ප්‍රමාණයකින් හෝ ඉටු වී තිබෙන්නේ කාලාන්තරයක් ගෙන ගිය දේශපාලන අරගලවල ප්‍රතිඵල මත. ලිංගිකත්වයත් එහෙමයි. ලිංගික නිදහස, ලිංගික ආකල්ප ගැන එදා තිබුණාට වඩා නිදහසක් අද අත්විඳිනවා. ලිංගිකත්වය හා ස්ත්‍රීත්වය යන මාතෘකා තිබෙන්නේ දේශපාලනය ඇතුළත. උදාහරණයක් ලෙස 'තනි තටුවෙන් පියාඹන්න' චිත්‍රපටයේ තමන්ගේ විමුක්තිය වෙනුවෙන් නිර්මාණය කර ගන්නා හුදෙකලා කැරැල්ල පරාජය වුණත් එය දේශපාලනිකයි.

**ප්‍රශ්නය;** ඔබේ අනෙකුත් සිනමා නිර්මාණවලින් 'රාණි' වෙනස් වන්නේ කෙසේ ද?



**අශෝක හඳගම**
සිනමා, වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය අධ්‍යක්ෂ

**පිළිතුර;** 'ඇල්බරෝදා' නිර්මාණයේදී මට තිබුණු පරිකල්පන නිදහස වැඩියි. ඊට හේතුව වසර 100කටත් වැඩි ඉතිහාසයක් ඇති කතාවක් නිසාත් එහි චරිත අප කිසිවකු දැක නොතිබීම නිසාත් දුටුවකු අද ජීවත් නොවීමත් නිසාත්. එහෙත් රිචඩ් ද සොයිසාගේ සිදුවීම ඊට වෙනස්. මේ සිදුවීමට සම්බන්ධ ඇතැම් පුද්ගලයන්, රිචඩ් ඇසුරු කළ මිතුරු මිතුරියන්, හිතවතුන් ජීවතුන් අතර සිටිනවා, ඒ වගේ ම මේ සිද්ධිය ගැන බොහෝදෙනා දන්නවා. මේ නිසා ඒවා කළමනාකරණය, මගේ පරිකල්පනයේදී සීමා වනවා. ඒ සීමාවල සිට 'රාණි' නිර්මාණය කිරීමයි මා මුහුණදුන් ප්‍රධාන අභියෝගය.

**ප්‍රශ්නය;** ඔබත් මුහුණදුන් භීෂණ වටපිටාවක සිදුවුණු රිචඩ් ද සොයිසා ඝාතන අත්දැකීම පදනම් ව සිනමා නිර්මාණයක් කරන්න ප්‍රමාද වුණේ ඇයි ?

**පිළිතුර;** රිචඩ් ද සොයිසාගේ මරණින් පසු ඊට හේතු වූ දේශපාලන කාරණා සම්පූර්ණයෙන් ම මර්දනය කළා. ඒ පිළිබඳ දේශපාලන කතාබහ යටපත් වුණා. රිචඩ් ඝාතනයට කලින් 1989 නොවැම්බර් මාසයේ විජේවීර ඝාතනයත් සමග තරුණ පරම්පරාවේ දේශපාලන බලාපොරොත්තු සෝදාපාළුවට ගියා. ජනතා අරගලය නැත්නම් විකල්ප දේශපාලනය වෙනත් මුහුණුවරකින් නැවත හිස ඔසවන්න පටන් ගත්තේ 90 දශකයේ අගභාගයේ සහ 2000 වසරේ මුල්භාගයේ. ඒ වන විට මුහුණදුන් දරුණු තත්ත්වයක් උතුරේ තිබුණු අරගලය. අප ඒ දේශපාලන පසුබිම් පිළිබඳ ව කතා කළා 'මේ මගේ සඳයි', 'සින්තටික් සිහිනය', වැනි නිර්මාණවලින්.

'මේ පාරෙන් එන්න', 'නැගෙනහිර වෙරළෙන් ඇසෙන' වැනි ටෙලි නිර්මාණ හා 'ඉනිඅවන්' සිනමා නිර්මාණයෙන් පශ්චාත් යුද අත්දැකීම් ගැන කතා කළා. එලෙසින් අපේ අවධානය වෙනත් දිශාවකට යොමු වුණා.

මේ යුගයෙදී නැවත වතාවක් අතීතය ගැන සන්සුන් ව හිතන්න, ආපසු හැරී බලන්න පුළුවන්කමක් ලැබී තිබෙනවා. 'රානි' නිර්මාණයට අවස්ථාව ලැබෙන්නේ අහඹුවක් විදිහට. රිචඩ් මරා දැමීම පමණක් නොවෙයි ඒ කාලේ සිදුවීම් ඉතිහාසයෙන් අප අමතක නොකළ යුතුයි. මගේ නිර්මාණවල ඉතිහාසය අඩු වැඩි වශයෙන් සාකච්ඡා කර තිබෙනවා. නමුත් මෙය එක්තරා හිඩැසක්. ඒ හිඩැස පුරවන්න අවස්ථාව ලැබුණු අවස්ථාවේ මා එය ප්‍රයෝජනයට ගත්තා.

පසුගිය වකවානුවේ අපේ අවධානය යොමු වී තිබුණේ යුද්ධයට. රෝහණ විජේවීර ගැන කියවෙන 'ගින්නෙන් උපන් සීතල' සිනමාපටය නිර්මාණය වුණෙත් මෑතකාලීන ව. 88 /89 යුගය ගැන 1996දී මා 'දඩයම' නිර්මාණයෙන් කිසියම්දුරකට කතාබහ කළා. නමුත් එය තාක්ෂණික හේතු නිසා ප්‍රදර්ශනය කළේ නැහැ.










### ප්‍රශ්නය; පැවති යුද්ධය පසුබිම් වූ ඔබේ නිර්මාණ මෙන් ම අනෙකුත් නිර්මාණ කෙරෙහිත් නොයෙකුත් වාරණ, තර්ජන, අපවාද එල්ල වුණා. ඒවා ඔබේ නිර්මාණවලට ශක්තියක් වුණා ද ? නැත්නම් ඒ නිසා ඔබේ දේශපාලනික හා සමාජ මතවාද වෙනස් වුණා ද?

පිළිතුර; තර්ජන, ගර්ජන නිසා මගේ මතවාද වෙනසකට ලක්වුණේ නැහැ. තවදුරටත් ශක්තිමත් වුණා. එවැනි අවස්ථාවලට ශක්තිමත් ව මුහුණදෙන්න ධෛර්යය ලැබුණා. මගේ මතවාද වෙනස් වෙන්න බලපෑවේ මා ලබපු අත්දැකීම් සහ පොතපත ඇසුරින් ලැබුණු දැනුම.

### ප්‍රශ්නය; දේශීය සිනමා කර්මාන්තයේ ඔබ හඳුනා ගන්නා මූලික ගැටලු මොනවා ද? එහි හෙට දවස ගැන ඔබේ අදහස?

පිළිතුර; සිනමාව කර්මාන්තයක් ලෙස වඩාත් පුළුල්. චිත්‍රපටයක් නිර්මාණයත් ප්‍රදර්ශනයත් කර්මාන්තයේ ම කොටසක්. සිනමා ශාලාවලට පවතින ආර්ථික වාතාවරණය මතයි සිනමා ප්‍රදර්ශනය කර්මාන්තයක් ලෙස දියුණු වන්නේ. චිත්‍රපට නිපදවීමේ කර්මාන්තයක් ලෙස එය පවතින්නටනම් ඒ වෙනුවෙන් ආයෝජනය කළ මුදල් නැවත උපයා ගන්නට හැකියාව තිබිය යුතුයි. මේවා තමයි සිනමා කර්මාන්තයේ ගැටලු.

චිත්‍රපටවලින් මුදල් උපයා ගන්නේ නැත්නම් සිනමාකරුවන් අධෛර්යයට පත්වෙනවා. සිනමා ප්‍රදර්ශකයන්ට එවැනි බලපෑමක් නැහැ. ප්‍රදර්ශනය වන චිත්‍රපටයට ප්‍රේක්ෂක ආකර්ෂණය නොමැතිනම් ඒ වෙනුවට වෙනත් චිත්‍රපටයක් ප්‍රදර්ශනය කරන්නට ඔවුන්ට හැකියාව තිබෙනවා.

දේශීය සිනමාව නඟා සිටුවීම යන්න සිනමාවට පමණක් සීමා වන්නේ නැහැ. එය සමස්ත ආර්ථිකයේ ම කොටසක්. සිනමාව කර්මාන්තයක් ලෙස පවතින්නට නම් එහි තිරසර බවක් ඇතිවිය යුතුයි. විශේෂයෙන් ඊට ප්‍රේක්ෂක ආකර්ෂණය තිබිය යුතුයි. සිනමාව යනු සිනමා ශාලාවට ගොස් චිත්‍රපට නැරඹීම ම පමණක් නොවෙයි.

අප සිනමාව ආරම්භ කරන විට ලංකාවට ම තිබුණේ කැමරා දෙක තුනයි. නමුත් වර්තමානයේ චිත්‍රපට නිපදවීම ඉතා පහසුයි. තරගය තිබෙන්නේ චිත්‍රපට ප්‍රදර්ශනයේදී. එහි අසමතුලිතතාවක් තිබෙනවා. ප්‍රමිතිය සම්බන්ධයෙන් ගැටලුත් තිබෙනවා.

මේ නිසා ටෙලි නාට්‍ය කර්මාන්තයෙන් සිනමාවේ අය යැපුණත් අපහසුතාවට පත් වන්නේ ආයෝජකයන්. මෙවැනි පසුබිමක කුමන ආකාරයෙන් හෝ වෙළෙඳපොළ පුළුල් කර ගැනීමේ අභියෝගය අපට තිබෙනවා.

ඕස්ට්‍රේලියාව වැනි රටක ජීවත් වන ලාංකිකයන් චිත්‍රපට, වේදිකා නාට්‍ය, සංගීත සංදර්ශන නරඹන්න පැමිණෙනවා වගේ ම ශ්‍රී ලංකාවෙන් නිර්මාණකරුවනුත් එහි යනවා එම අවස්ථාවලට සහභාගි වීමට. මේ අයුරින් ඕස්ට්‍රේලියාව හා ශ්‍රී ලංකාව අතර වෙන ම ආර්ථිකයක් ගොඩ නැඟී තිබෙනවා. එරට ශ්‍රී ලංකාවේ නිර්මාණවලට තිබෙන්නේ හොඳ වෙළෙඳපොළක්. මෙරට සිනමාශාලාවලින් පමණක් යැපෙන්නට සිනමාවට බැහැ. ඒ නිසා ලාංකිකයන් ගොනු වූ රටවල, නගරවල නව වෙළෙඳපොළක් සොයා ගත යුතු වනවා. ශ්‍රී ලංකාව පදනම් කරගෙන Netflix පන්නයේ මාදිලියක් නිර්මාණය කරගන්නට හැකි වුවහොත් ඒ ඔස්සේ එතෙර වෙසෙන ලාංකිකයන්ට අපේ සිනමා නිර්මාණ නරඹන්නට පුළුවන්. එයත් එක්තරා ආකාරයක විසඳුමක්.

සිනමා කර්මාන්තය වර්ධනයට සිනමාකරුවන් ලෙස අප අතර කතාබහක් තිබෙනවා. අප තව ම සිටින්නේ සංක්‍රාන්ති අවධියක. සිනමාකරුවන්ට තමන්ට ගැළපෙන වෙළෙඳපොළ සොයාගෙන යාමට සිදුවෙනවා.

### ප්‍රශ්නය; දේශීය සිනමාවේ නවක සිනමාකරුවන් ගැන ඔබට අපේක්ෂාවක් තිබෙනවා ද?

පිළිතුර; ඔව්. අප සිනමාවට පිවිසෙන කාලයේ සිනමාකරුවකු වීම අමාරු කාර්යයක් වුවත් කළ නිර්මාණය ප්‍රදර්ශනය ගැන සහතිකයක් තිබුණා. දැන් ඕනෑ ම අයකුට සිනමාකරුවකු වීම පහසුයි. නමුත් කළ නිර්මාණය ප්‍රදර්ශනය අපහසුයි. අද කුමන නිර්මාණයක් කළත් ප්‍රදර්ශනය ගැන විශ්වාසයක් නැහැ. අපට තවමත් කිසියම් ආකාරයක ඉල්ලුමක් තිබෙන්නේ පැරණි සිනමාකරුවන් වීම නිසා. කුමන හේතුවකින් හෝ අපේ සිනමාවක් නරඹන ප්‍රේක්ෂක පිරිසක් සිටිනවා. ටෙලි නාට්‍යකරුවන් වුණත් මිනිස්සු අප ව නමින් දන්නවා. නමුත් නව ටෙලිනාට්‍ය නිර්මාණකරුවන් සිටිනවා ඔවුන්වත් නිර්මාණවත් නොහඳුනන, මතක නොසිටින. මෙවැනි තත්ත්වයක නවක සිනමාකරුවන්ට තිබෙන අභියෝගය වන්නේ තමන්ගේ කෘතියක් ප්‍රදර්ශනය කරවා ගැනීම. එයයි ජය ගත යුත්තේ. ඒ සඳහා නව මාන සොයා ගැනීමේ හැකියාව ඇත්තේ ඔවුන්ටමයි. තිබෙන ගැටලුව දන්නේ ඔවුන්. අපට එය පරිකල්පනය නොවෙන්න පුළුවන්. උදාහරණයක් ලෙස දැන් Youtube වැනි යහමින් මුදල් උපයන මාධ්‍ය සොයා ගත යුතුයි. අලුත් තත්ත්ව යටතේ කෙසේ ක්‍රියා කළ යුතු ද යන්න ඔවුන් විසින් ම තීරණය කළ යුතු වනවා.

සංවාදය
**ඉෂංබා සිංහආරච්චි**

# ඉන්ග්මාර් බර්ගමාන් නැවත කියවීම


කථිකාචාර්ය
**මනීෂ දුක්ගන්නාරාල**

ඓතිහාසික නාට්‍යවල නව පැතිකඩ අර්ථකථනය සහ අධ්‍යයනය අප ජීවත්වන යුගයට අත්‍යාවශ්‍ය වනවා. එම නිසා විශ්ව නාට්‍යකරුවන්ගේ නාට්‍ය සාක්ෂරතාව පිළිබඳ අධ්‍යයනය එහිදී ඉතා වැදගත්. එය වර්තමාන ශ්‍රී ලාංකේය තරුණ නාට්‍ය අධ්‍යක්ෂවරුන්ට ප්‍රයෝජනවත් වන්නට පුළුවන්.

ලෝකයේ වඩාත් ම කතාබහට ලක් වූ නාට්‍ය අධ්‍යක්ෂවරයකු වූ ඉන්ග්මාර් බර්ගමාන් සම්භාව්‍ය නාට්‍ය පුනර්-නිෂ්පාදනය කළ ස්වතන්ත්‍ර රචකයෙක්. සිනමා අධ්‍යක්ෂවරයකු වශයෙන් ලොව ජනප්‍රිය වුවත් ඔහුගේ කලාත්මක ප්‍රතිභාව වැඩිමනක් ප්‍රකට කළේ වේදිකාවෙන්. ෂේක්ස්පියර්, මොලියර්, ස්ට්‍රින්බර්ග්, ඉබ්සන් වැනි නාට්‍යකරුවන්ගේ නිර්මාණ කෙරෙහි ඔහු වඩාත් ආශක්ත වුණා.



ඉන්ග්මාර් බර්ගමාන්ගේ අදහසට අනුව වේදිකාව මිනිසාගේ ධ්වන්දාත්මක බව නිරූපණය කිරීමට සමත් ප්‍රබල ම කලා මාධ්‍යය. මුල් කෘතිය සහ එහි සාරය ප්‍රේක්ෂකයාට, වඩාත් සමීප කරවන්නේ කෙසේ ද? යන්න නාට්‍ය නිෂ්පාදනයෙන් සොයා බැලීමට ඔහු සෑම විට ම මහන්සි වුණා. ඔහුගේ යුගය වන තෙක් නාට්‍යාගාරයේ පැවති සංදර්ශනාත්මක භාවිත සහ නාට්‍ය උපක්‍රම පිළිබඳ ව ඔහු සෑහීමකට පත් වුණේ නැහැ. ඔහු විශ්වාස කළ ආකාරයට නාට්‍යාගාරය මිනිසා සහ මිනිසා තේරුම් ගැනීමේ කැඩපත විය යුතු වුණා. එවකට ස්වීඩනයේ ජනප්‍රිය ව සිටි පීටර් බෘක්, ජෝජියෝ ස්ට්‍රෙලර් සහ ෆ්‍රැන්ක්ස් කැස්ටොරෆ් වැනි අධ්‍යක්ෂවරුන්ගේ නිර්මාණ, යථා ස්වභාවය නිරූපණය නොකරන මායාකාර ලක්ෂණ ප්‍රකට කරන නිසා ඉන් බැහැර විය යුතුයි. ඒ වෙනුවට ඔහුගේ ගෞරවය පුද කළේ ටෝර්ස්ටෙන් හැමරන්, අල්ෆ් ස්ජෝබර්ග්, ඕලොෆ් මොලන්ඩෙර් වැනි නිර්මාණකරුවන් වඩා නිර්මාණාත්මක සහ ක්‍රමානුකූල ව නිර්මාණකරණයේ යෙදීමට තමන්ට පූර්වාදර්ශ සැපයූ නිසා යැයි විශ්වාස කරමින්. මුල් අවධියේ ඔහුගේ නිර්මාණ පිළිබඳ ව සොයා බැලීමේදී පැහැදිලි වූයේ නාට්‍ය අර්ථකථන, නාට්‍යයේ රිද්මය සහ ප්‍රේක්ෂක ප්‍රතිචාරයට සංවේදීතාව දැක්වීම වැනි ලක්ෂණ කෙරෙහි ඔහුගේ අවධානය යොමු වූ බව. එහෙත් පසුව ඕනෑ ම නාට්‍ය නිර්මාණයක මුල් කෘතියේ සාරය අනාවරණය කර ගැනීමටත් ස්ව-අර්ථකථනය ඉදිරිපත් කිරීමටත් බර්ග්මාන් එඩිතර වුණා. නාට්‍යයේ ප්‍රබල ම ලක්ෂ්‍යය ලෙස ඔහු හැඳින්වූයේ ප්‍රේක්ෂකයන්ට වැඩි ම බලපෑමක් එල්ල කළ හැකි ක්‍රියාව. තවත්




උපක්‍රමයක් වූයේ නාට්‍යමය බව පුළුල් කිරීමට නළුවන් යොදා ගත්තත් නළුවන් සහභාගි නොවන දර්ශනවලින් අවස්ථා තිව්‍ර කිරීම. එය එක්තරා ආකාරයකට බර්ග්මාන් ප්‍රේක්ෂකයාට ඉන්ද්‍රජාලික යථාර්ථයක් තේරුම් ගැනීමට අවස්ථාවක් ලබා දීමක් බඳුයි.

වූ නාට්‍යමය ප්‍රයෝග භාවිත කිරීම විටෙක විවේචනයට ද ලක් වුණා. එහෙත් ඉන් ප්‍රකට වුණේ ඔහුගේ නිර්මාණවල ඇති ස්වායක්තභාවය. බර්ග්මාන්ගේ නාට්‍යවලින් ආත්මය සහ කලාව අතර සම්බන්ධය ගවේෂණය කිරීමට ඔහු උත්සාහ කළ ආකාරය 'පර්සෝනා' වැනි චරිතවලින් මනාව පැහැදිලි වනවා.

නාට්‍යාර්ථයෙන් නිරූපණය කිරීමට. නිදසුනක් වශයෙන් නොවේජියානු ජාතික හෙන්රික් ඉබ්සන්ගේ 'සෙල්ලම් ගෙදර' නාටකයේ 'හෙල්මර්'ගේ පවුලේ සිටින්නේ එක් දරුවකු පමණයි. ඒ ගැහැනු දැරිවියක්. ඇය තම පවුලේ අර්බුදය දකිනවා. 'නෝරා' ද කම්පනයට පත් කාන්තාවක්. මවගේ සහ පියාගේ වෙන්වීමේ අර්බුදය


Macbeth


The Legend


Macbeth

වයස අවුරුදු එකොළහේදී නාට්‍ය කලාවේ අත්හදා බැලීම් ආරම්භ කළ මේ නාට්‍යකරුවා 1930 ගණන්වල අගභාගයේ සක්‍රීය ලෙස නාට්‍යය කලාවට බර අඩි තැබුවා. ස්වීඩනයේ ස්ටොක්හෝම්ස් විශ්වවිද්‍යාලයේ මාර්ටින් ලැම්ගේ දේශනවලට සහභාගි වුණු ඔහුට ඕගස්ට් ස්ට්‍රීන්බර්ගේ නාට්‍ය පිළිබඳ ව අසන්නට ලැබී තිබෙනවා. පසුව ස්ට්‍රීන්බර්ග් ඔහුගේ නාට්‍ය කලාවේ න්‍යායාචාර්යවරයකු බවට පත් වූ බවයි බර්ග්මාන් පවසන්නේ. මාස්ටර් ඔලොස්ගාර්ඩෙන් රඟහලෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ මේ නාට්‍යකරුවා සෙක්ෂ්පියර්ගේ සහ ස්ට්‍රින්බර්ග්ගේ නාට්‍ය නිෂ්පාදනය කරමින් ඉමහත් ජනප්‍රියත්වයක් උදාකර ගත්තා.

බර්ග්මාන්ගේ නාට්‍ය නිර්මාණවලින් බොහෝ විට උත්සාහ කර ඇත්තේ සරල බව කෙරෙහි අවධානය යොමු කිරීම සහ කලාව සහ ආත්මය අතර ඇති සම්බන්ධතාව ගවේෂණය කිරීමට. සරල අලංකරණ භාවිතයෙන් නළු නිළියන්ගේ පෞරුෂය, කතාව, ක්‍රියාව සහ මුහුණේ ඉරියව් වඩාත් පැහැදිලි ව පෙනෙන බව ඔහු විශ්වාස කළා. දෘශ්‍ය පරිකල්පනය ගොඩ නැගීමේදී යථාර්ථවාදී ලක්ෂණ අතික්‍රමණය කරමින් තමන්ට ම ආවේණික අනවශ්‍ය ලෙස අභින භාවිතය ඔහුගේ නාට්‍යවල සිදු නොවූ අතර විශේෂයෙන් ම වාචික අභින භාවිතයේදී ඔහුගේ නළු නිළියන් පරෙස්සම් වුණා. ඔහු මුළුමනින් ම විශ්වාස තැබුවේ සමකාලීන නාට්‍ය (අද්භූත නාට්‍යයේ සිට) නොසලකා හරිමින් සම්භාව්‍ය නාට්‍යය පිළිබඳ ව.

මුල් කෘතියේ ඇති විශ්වීය ලක්ෂණත් බර්ග්මාන්ගේ දෘෂ්ටිකෝණයත් මුසු වූ කතා කලාවක් සඳහා ඔහු අත්පොත් තැබුවේ තුරුණු වියට එළඹෙන්නට ද ප්‍රථම. ඔහු නිර්මාණය කළ 'ලිය රජ' අනුවාදය සදාචාරාත්මක නාට්‍යයක මෙන් වර්ණ භාවිතයත් රංග වස්ත්‍රවල සංකේතාත්මක බවත් නිසා බලය පිළිබඳ උභතෝකෝටිකය වඩා පුළුල් ව දැනුණු බව ඩේවිඩ් ඩ්‍රෝඩ් Bermangzs Theatre is The Serious Game නම් නිබන්ධනයෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කරනවා. 'හැමලට්' නාට්‍යයේ සාම්ප්‍රදායික මල් වෙනුවට මලකඩ ගැසුණු නියපොතු භාවිත කිරීම ක්‍රිස්තියානි අර්ථයෙන් පරිත්‍යාගය සහ ආශාවේ චේතනා උද්දීපනය කිරීමට උත්සාහ කිරීමක් බඳුයි. එය එක්තරා ආකාරයකට මුල් කෘතියේ කතුවරයා විසින් උපකල්පනය කරන ලද අභිප්‍රායට පටහැනි වුවත් බර්ග්මාන් උත්සාහ කළේ සැබෑ සමාජය සහ චිත්ත වේගී සන්දර්භ අනාගතයේදී මේ දැරිවියට කෙසේ බලපෑ හැකි ද? එවැනි අර්ථකථනයකින් නාට්‍ය පෙළෙහි වෙනසක් සිදු වුව ද මුල් කෘතියේ රචකයාගේ අභිමථාර්ථ මත පිහිටා තම අර්ථකථනය ද ඉදිරිපත් කිරීමට බර්ග්මාන් ක්‍රියා කිරීමෙන් අධ්‍යක්ෂවරයකු ලෙස බර්ග්මාන්ගේ භූමිකාව ප්‍රබල වුණා. 'මිස් යුලී' නාට්‍යයේදී ටෝර්න්ක්විස්ට් 'යුලී'ගේ ජීවිතයේ සියදිවි නසා ගැනීම සඳහා විවිධ අභිප්‍රේරණ පිළිබඳ සවිස්තරාත්මක සාකච්ඡාවක් ප්‍රේක්ෂකයා වෙත ගෙන එනවා. බර්ග්මාන්ගේ නාට්‍ය කලාවට අනුප්‍රාණය සැපයූ 'ඕගස්ට් ස්ට්‍රීන්බර්ග්' කෘතියක ඓතිහාසික පසුබිම පිළිබඳ ව අවධානය යොමු කළ අතර බර්ග්මාන් නාට්‍ය පෙළ නැවත අර්ථකථනය කිරීම පිළිබඳ අවධානය යොමු කළා. 'මිස් යුලී' නාට්‍ය පිළිබඳ ව පසුවදනක යෙදෙන ඔහු මෙසේ සඳහන් කරනවා. "ඇය තම ඔසවන ලද දෑත් අල්ලාගෙන සිටි නිසා ඇගේ ඉරියව්වලින් මාරාන්තික බලාපොරොත්තු සුන් වීම සහ ආරක්ෂාව යන දෙක ම ප්‍රකාශ කළා ය. ඊට අමතර ව ප්‍රේක්ෂකයාගේ බැල්ම යොමු වූයේ දැලි පිහියෙන් සිය ගෙල සියතින් ම කපා දැමීමට නියමිත ව තිබූ ඇගේ ගෙල දෙසට ය" මේ සංකල්පය බර්ග්මාන්ගේ පරම්පරාවේ අධ්‍යක්ෂවරුන්ට නූතනවාදී ප්‍රවේශයක් වුණා.

# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

වසර 47ක් තිස්සේ ශ්‍රී ලාංකික ප්‍රජාවට දැනුමින් හා නව්‍යතාවෙන් යුත් තොරතුරුවලින් යාවත්කාලීන කිරීමේ සමාජ සද්කාර්යයක යෙදෙන 'දෙසතිය' සඟරාවේ මෙවර කලාපයේ සිට රාජ්‍ය සේවා තරග විභාග සඳහා ම සුවිශේෂ වන අත්වැලක් ආරම්භ කරන බව අප පසුගිය කලාපයෙන් ඔබ ව දැනුවත් කළා.

ඉදිරියේදී රාජ්‍ය සේවයට අලුතින් බඳවා ගැනෙන සුවිශේෂ තනතුරුවලට පැවැත්වෙන තරග විභාග සඳහා අත්වැලක් අංග සම්පූර්ණ ව ඔබ වෙත ලබා දීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියා කරනවා. ඒ අනුව මෙවර කලාපයේ පළ වන්නේ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වන තරග විභාගයේ එක් ප්‍රශ්න පත්‍රයක් වන 'ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම' වෙනුවෙන් ආදර්ශ ප්‍රශ්නෝත්තර මාලාවක්.

විශේෂයෙන් මේ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී එම විෂයට අදාළ පසුගිය ප්‍රශ්නපත්‍ර අධ්‍යයනයේදී පෙනී ගිය පැහැදිලි කරුණක් තිබෙනවා. ඒ, දැනට රාජ්‍ය සේවයේ රාජ්‍ය නිලධාරීන්ට මාර්ගෝපදේශ සපයන ප්‍රධාන මෙහෙයුම් අත්පොත වන 'ආයතන සංග්‍රහය' පළමු කාණ්ඩයේ හා දෙවැනි කාණ්ඩයේ සෑම පරිච්ඡේදයක් කෙරෙහි ම අවධානය යොමු කිරීමත් කාර්යාලවල භාවිත වන ලිපිගොනුකරණය, ආකෘතිපත්‍ර භාවිතය, මෙහෙයුම් අත්පොත් භාවිතය, තැපෑල කළමනාකරණය ආදී විවිධ කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණයට අදාළ විෂය කොටස් පිළිබඳ ව ඉතා සියුම් තැන් සිට ම අවධානයෙන් යුතු ව අධ්‍යයනය කිරීමත් වැදගත් බව.



ඉදිරිපත් කිරීම
**නාලක දිසානායක**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(පාර්ලිමේන්තු කටයුතු)
මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
හා අධ්‍යක්ෂ (පාලන) වැ.බ
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**පහත ප්‍රශ්නාවලිය සඳහා පළමු ව ඔබ ඔබේ දැනුමින් පිළිතුරු සපයා ඉන්පසුව නිවැරදි පිළිතුරු සමග සසඳා බලන්න.**

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය 01

(02) ආයතන සංග්‍රහය හා කාර්යාලක්‍රම

1 කොටස

අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

01. සතියේ දින 7 ම සේවය කිරීමට නියම ව ඇති රාජ්‍ය නිලධාරියකුට වසරකට හිමි විවේක නිවාඩු ගණන කීයද?

I. දින 24 II. දින 28 III. දින 25 IV. දින 45

02. වාර්ෂික ස්ථාන මාරු කමිටුවක් පත් කිරීම සඳහා එම මාරු කිරීමට අදාළ ව නිලධරයන් කොපමණ සංඛ්‍යාවකට වඩා වැඩිවීම වැදගත් වේ ද?

I. 25 II. 50 III. 75 IV. 100

03. වැටුප් වර්ධක වාසි ලබා දීම සඳහා පූර්ව තනතුරේ සේවා කාලය අවම වශයෙන් කොපමණ කාලයක් තිබිය යුතු ද ?

I. මාස 08 II. අවුරුදු 01 III. මාස 03 IV. මාස 06

04. දීප ව්‍යාප්ත සේවාවක් නොවන්නේ?

I. ශ්‍රී ලංකා පරිපාලන සේවය
II. ශ්‍රී ලංකා වෛද්‍ය සේවය
III. ශ්‍රී ලංකා තාක්ෂණ සේවය
IV. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය

05. රැකියාවක කාර්ය හා වගකීම් සම්බන්ධ ව සංවිධානාත්මක ව සකස් කරන ප්‍රකාශය?

I. රැකියා විශ්ලේෂණය II. රැකියා පිරිවිතරය
III. රැකියා විස්තරය IV. පත්වීම් ලිපිය

06. ලිපි ගොනුවක ඇතුළත් විෂය කරුණු අනුව ලිපිගොනු වර්ග කළ හැකි ක්‍රමයක් නොවන්නේ?

I. විෂය ලිපිගොනු II. පුද්ගලික ලිපිගොනු
III. ආශ්‍රය ලිපිගොනු IV. විභාජිත ලිපි ගොනු

07. 1971 අංක 29 දරන පනත

I. රජයේ නිවාඩු පනත ය
II. ජාතික ලේඛනාරක්ෂක පනත ය
III. වත්කම් හා බැරකම් පනත ය
IV. සන්තකය ආපසු පවරා ගැනීමේ පනත ය

08. ගමනට ගත වන කාලය ද සමග සම්පූර්ණ නිවාඩු කාලය වසර 01යි මාස 02යි දින 10ක් වූ වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩුවකට අදාළ වන අනිවාර්ය සේවා කාලය

I. මාස 50 II. මාස 60
III. මාස 58 IV. මාස 54

09. පොදු 190

I. වත්කම් හා බැරකම් ප්‍රකාශය
II. හදිසි අනතුරු නිවාඩු අයදුම්පත
III. නිවාඩු පිළිබඳ රෙජිස්ටරය
IV. සේවා ගිවිසුම

10. විධිමත් විනය පරීක්ෂණයක් සාමාන්‍යයෙන් කොපමණ කාලයකදී අවසන් කළ යුතු ද?

I. මාස 02 II. මාස 06
III. මාස 04 IV. මාස 12

2 කොටස

**සාමාන්‍යයෙන් මේ කොටසට අදාළ ප්‍රශ්න ඇසෙන එක් රටාවක් ලෙස කිසියම් සිද්ධියක් ඉදිරිපත් කර (උදා- කාර්යාලයට අදාළ යම් යම් ආයතනික කාර්ය ඇතුළත්) ඒ සිද්ධිය පදනම් කරගෙන ආයතන සංග්‍රහය, කාර්ය පටිපාටික රීති හා කාර්යාල ක්‍රම පිළිබඳ ව දැනුම මැනීම හැඳින්විය හැකි ය. ඒ අනුව එවැනි සිදුවීමක් ආශ්‍රිත හෝ එසේ නොමැති ව හෝ විමසිය හැකි ප්‍රශ්න රටා කිහිපයක් පහත දක්වා ඇත.**

11. රාජ්‍ය සේවයේ තනතුරකට පත්කිරීමට පෙර පත්කිරීමේ බලධාරියකු සලකා බලන කරුණු දෙකක් ලියන්න.

12. වැඩ බැලීමේ වැටුපක් ගෙවීම සඳහා එම වැඩ බැලීමට පත්කරන තනතුර කුමන ආකාරයේ තනතුරක් විය යුතු ද?

13. පහත එක් එක් සේවාවේ නිලධාරීන්ගේ වැටුප් වර්ධකය ප්‍රතික්ෂේප කරන බලධරයා කවුරුන් ද?.

(අ) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය ....................................................
(ආ) කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණිය .................................

14. දිසා අධිකරණයක හෝ මහේස්ත්‍රාත් අධිකරණයක හෝ ගාස්තු අයකරන සේවා 02ක් ලියන්න.

15. පහත පොදු ආකෘති පත්‍ර හඳුන්වන්න.
(අ) පොදු 230 අ
(ආ) පොදු 230 ආ

16. නිලධාරියාගේ අසනීපයක් හෝ පවුලේ අයකුගේ අසනීපයක් හැර ඉකුත් නිවාඩු ලබාදිය හැකි වෙනත් අවස්ථා 02ක් ලියන්න.

17. විනය නියෝගයක අඩංගු විය යුතු කරුණු 02ක් ලියන්න.

18. දුම්රිය බලපත්‍රයක ලියූ යමක් වෙනස් කරන විට එය කෙසේ කළ යුතු ද? කරුණු 02ක් ලියන්න.

19. කාර්යාලයීය මෙහෙයුම් අත්පොත් වර්ග දෙකක් ලියන්න.

20. ආශ්‍රය ගොනු වර්ග දෙකක් ලියන්න.

3 කොටස

සාමාන්‍යයෙන් මෙම කොටසේදී ද පෙර පරිදි ම සිදුවීමක් ආශ්‍රිත ව හෝ එසේ නොමැති ව හෝ ප්‍රශ්න ඉදිරිපත් කළ හැකි ය.

21. දේශපාලන අයිතිවාසිකම අහිමි නිලධාරියකුට අහිමි අයිතිවාසිකම් මොනවාද?

22. රාජ්‍ය නිලධාරියකුට ණය/ අත්තිකාරම් ලබා දිය හැකි අවස්ථා 03ක් ලියන්න.

23. රජයේ දෙපාර්තමේන්තුවක විනාශ කරන ලේඛන සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු ලේඛනයක අඩංගු කරුණු 05ක් ලියන්න.

24. ලේඛනාගාරයකට නොයැවෙන ලේඛන වර්ග 5ක් ලියන්න.

25. රජයේ නිවාස වෙන් කිරීමේදී තෝරා ගැනීමේ උපමාන 05ක් ලියන්න.

## පිළිතුරු පත්‍රය

**1 කොටස**

1) II 2) II 3) IV 4) III 5) III 6)IV 07) I 8) III 9) III 10) II

**2 කොටස**

11. 1. අනුමත තනතුරක් තිබීම
    2. අදාළ තනතුරේ පුරප්පාඩු තිබීම
    3. ඒ සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන් ව ඇති බව
    4. අනුමත සේවා ව්‍යවස්ථාවක් හෝ බඳවා ගැනීමේ පටිපාටියක් තිබීම

12. නිත්‍ය තනතුර හා සම තත්වයේ තනතුරක වැඩ බැලීම හෝ නිත්‍ය තනතුරට වඩා ඉහළ තත්ත්වයේ තනතුරක වැඩබැලීම

13. අ. රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්
    ආ. රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්

14. නඩු පොත් බැඳීම, නඩු වාර්තා පිටපත් කිරීම, ලේඛන සෙවීම

15. අ. පෞද්ගලික වාර්තා සටහන් ලිපිගොනුව
    ආ. ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතිය

16. 1. පවුලේ කෙනකුගේ මරණය
    2. නිලධාරියාගේ විවාහය
    3. රාජකාරිමය නොවන කරුණකට සිතාසි පිට උසාවි යෑම

17. 1. එක් එක් චෝදනාවට වැරදිකරු ද නිවැරදිකරු ද යන වග
    2. සම්පූර්ණයෙන් නිවැරදිකරුනම් ඒ බව
    3. වරදකරුනම් දෙන දඬුවම් මොනවාද යන වග

18. අදාළ බලධරයා විසින් එම වෙනස් කිරීම සහතික කළ යුතු ය.
    වෙනස් කිරීමට යටින් අත්සන යොදා සිය නම හා පදවි නාමය සඳහන් කළ යුතු ය

19. 1. ප්‍රතිපත්තිමය මෙහෙයුම් අත්පොත්
    2. දෙපාර්තමේන්තුමය මෙහෙයුම් අත්පොත්
    3. සංවිධානමය මෙහෙයුම් අත්පොත්
    4. පරිපාලනමය මෙහෙයුම් අත්පොත්
    5. බහුකාර්ය මෙහෙයුම් අත්පොත්

20. 1. ප්‍රතිපත්ති ගොනු
    2. චක්‍රලේඛ හා උපදෙස් ගොනු
    3. පූර්වාදර්ශ ගොනු
    4. කාර්ය පටිපාටික ගොනුව

**3 කොටස**

21. 1. මැතිවරණයකට ඉදිරිපත් වීම
    2. මැතිවරණයකට ඉදිරිපත්වන ඡන්ද අපේක්ෂකයකුට මොනයම් ආකාරයෙන් හෝ ආධාර කිරීම
    3. දේශපාලන පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීම
    4. දේශපාලන කරුණු ගැන පුවත්පත්වලට ලිපි ලිවීම හෝ දේශපාලන රැස්වීම්වලට සහභාගිවීම

22. 1. මෝටර් රථයක් මිල දී ගැනීම සඳහා ණය
    2. මෝටර් සයිකලයක්/ ස්කූටරයක් මිලදී ගැනීම සඳහා ණය
    3. පාගන බයිසිකලයක් මිලදී ගැනීම සඳහා ණය
    4. මුදල් අමාරුකම් මඟ හරවා ගැනීම හා වෙනත් විශේෂ කාර්ය සඳහා වන ණය
    5. ණයගැතිභාවයෙන් මිදීම සඳහා ණය

23. 1. ලේඛනය/ ලිපි ගොනුවේ අංකය හා දිනය
    2. විෂයය
    3. ඊට අදාළ කාල පරිච්ඡේදය
    4. එහි අඩංගු කරුණු
    5. විනාශ කිරීමට බලය දුන් ලිපියේ යොමුව
    6. විනාශ කර දැමූ පිළිවෙළ
    7. විනාශ කර දැමූ දිනය

24. - රහස්‍ය ලේඛන
    - නඩු කටයුතු සඳහා සම්බන්ධ ලේඛන
    - ඔප්පු
    - පිඹුරු
    - ණය හා සම්බන්ධ මූලික ලේඛන
    - ප්‍රතිපත්ති ගොනු

25. - පොරොත්තු ලේඛනයේ නම සඳහන් ව තිබූ කාලය
    - දරුවන් ගණන (අවු 18 අඩු පිරිමි දරුවන් හා අවිවාහක ගැහැනු දරුවන්)
    - වැඩ කරන ස්ථානයේ සිට පදිංචි ව සිටින ස්ථානයට දුර
    - නිලධාරියා ස්ථිර ද තාවකාලික ද යන වග
    - ශාරීරික ආබාධ සහිත නිලධරයෙක් ද යන වග
    - ජ්‍යෝෂ්ඨතා

# සප්ත ලෝක වාර්තා

වර්නන් ගුණසේකර



Yared Nuguse


Jakob Ingebrigtsen



Grant Fisher



Toshikazu Yamanishi

පෙබරවාරි මාසයේ දින අටක කාලයක් ඇතුළත පමණක් මලල ක්‍රීඩාවේ ලෝක වාර්තා හතක් බිඳ වැටුණා. මේ වික්‍රමාන්විත ක්‍රීඩාවේ යෙදුණේ වෙනස් මහාද්වීප හතරකින් පැමිණෙන ක්‍රීඩකයන් පස් දෙනෙක්. ඔවුන් මේ නව ලෝක වාර්තා පිහිටුවූයේ ඔලිම්පික් ක්‍රීඩා උලෙළක, ලෝක ශූරතාවලියක හෝ මහාද්වීප හෝ ගෝලීය මට්ටමේ තරගාවලියක නොවෙයි.

2024 පැරිස් ඔලිම්පික් සහ ටෝකියෝහි පැවැත්වීමට නියමිත 2025 ලෝක ශූරතාවලිය අතර සම දුරස්ථ ව තිබෙන පෙබරවාරි මස මැදදී මේ ක්‍රීඩකයන් පස් දෙනා මීටර් 1500 සිට ඉහළට අර්ධ මැරතන් දක්වා වන පරාසයක ලෝක වාර්තාගත දස්කම් ප්‍රදර්ශනය කිරීමට සමත් වුණා.

ඔලිම්පික් ක්‍රීඩා උලෙළෙන් පසුව ලෝක මලල ක්‍රීඩාවේ යළි පිබිදීම සිදු ව තිබෙන්නේ ආකර්ෂණීය අයුරින්. ගෘහස්ථ සැතැපුම දිවීමේ ලෝක වාර්තාව දින පහක් ඇතුළත දෙවතාවක් බිඳ දැමුණා. පළමු ව එම වාර්තාව මකා දැමුවේ ඔලිම්පික් මීටර් 1500 ලෝකඩ පදක්කම්ලාභී ඇමරිකාවේ යොරේඩ් නෙගස් (Yared Nuguse). ඒ, නිව්යෝක් නුවර වාර්ෂික මිල්රෝස් ක්‍රීඩා උලෙළේ. එහිදී ඔහු මිනිත්තු 3:46.63ක කාලයක් සටහන් කරමින් මකා දැමුවේ 2019 වසරේ බොස්ටන්හිදී ඉතියෝපියාවේ යොමිෆ් කොජෙල්චා (Yomif Kejelcha) බිහි කළ මිනිත්තු 3;47.01ක වාර්තාව.

දෙවැනි ව නෝර්වේජියානු ජාතික යාකොබ් ඉන්යබ්‍රිට්සන් (Jakob Ingebrigtsen) උතුරු ප්‍රංශයේ ලියිවා නුවරදී එම වාර්තාව තත්පර එකහමාරකට ආසන්න කාලයකින් අඩු කරමින් මිනිත්තු 3:45.14ක කාලයක් සටහන් කළේ ඒ අතරතුර මිනිත්තු 3:29.63ක මීටර් 1500 ලෝක වාර්තාවක් ද පිහිටුවමින්. මෙහිදී ඔහු මකා දැමුවේ ඔහු විසින් ම 2022 වසරේ මේ නුවරදී ම පිහිටුවූ මිනිත්තු 3:30.60ක වාර්තාව. ඉන්යබ්‍රිට්සන් මේ නව ලෝක වාර්තා ද්විත්වය පිහිටුවූයේ ලෝක ගෘහස්ථ මලල ක්‍රීඩා ගෝල්ඩ් තරගාවලියේ. මේ අනුව ඔහු 1954 වසරේ ඕස්ට්‍රේලියාවේ ජෝන් ලැන්ඩිගෙන් පසුව එක ම තරගයේ සැතැපුම හා මීටර් 1500 ලෝක වාර්තා පිහිටුවීමට සමත් වූ පළමු ක්‍රීඩකයා බවට පත්වුණා.


Jacob Kiplimo

2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ මීටර් 5000 ඉසව්වේ රන් පදක්කම දිනා ගත් මේ 24 හැවිරිදි ක්‍රීඩකයා කෙටි ධාවන මීටර් 1500, කෙටි ධාවන සැතැපුම, මීටර් 2000 සහ මීටර් 3000 ඉසව්වල වර්තමාන ලෝක වාර්තාලාභියා.

පසුගිය වසරේ ඔලිම්පික් මීටර් 5000 සහ 10000 ඉසව්වල ලෝකඩ පදක්කම් හිමිකර ගත් ඇමරිකාවේ 27 හැවිරිදි ග්‍රාන්ට් ෆිෂර් (Grant Fisher) නිව්යෝක් නුවරදී මිනිත්තු 7:22.91ක කාලයකින් මීටර් 3000, ගෘහස්ථ ඉසව්වේ නව ලෝක වාර්තාගත ධාවනයක යෙදුණේ නෙගස් සැතපුමේ

ලෝක වාර්තාව බිහිකළ දිනයේ ම. එදා ෆිෂර් බිඳ දැමුවේ 2023 වසරේ ඉතියෝපියාවේ ලමීචා ගර්මා (Lamecha Girma) විසින් ලියිවා නගරයේදී සටහන් කර තිබූ මිනිත්තු 7:23.81ක වාර්තාව.

ඊට දින හයකට පසුව, මේ ඇමරිකානුවා තත්පර පහකට වැඩි කාලයකින් ඉතියෝපියාවේ කනනිසා බකලේ (Kenenisa Bekele)ගේ මීටර් 5000 වාර්තාව මකා දැමුවා. 2004 වසරේ එංගලන්තයේ බර්මිංහැම් නගරයේදී ඔහු තබා තිබූ මිනිත්තු 12:49.60 ලෝක වාර්තාව ඇමරිකාවේ බොස්ටන් නුවරදී බිඳ දැමුවේ ෆිෂර්. ඔහුගේ නව ලෝක වාර්තාව මිනිත්තු 12:44.01ක්.

මේ ලෝක වාර්තා සමූහය සම්පූර්ණ කරමින් තවත් ලෝක වාර්තා දෙකක් එක ම දිනයේදී බිඳ වැටුණා. උගන්ඩාවේ ජේකබ් කප්ලීමෝ (Jacob Kiplimo) මිනිත්තු 56:42කින් බාසිලෝනා අර්ධ මැරතන් තරගය ධාවනය කරමින් නව ලෝක අර්ධ මැරතන් වාර්තාවක් බිහි කළේ එම ඉසව්වේ කළින් තිබූ වාර්තාව තත්පර 48කින් මකා දමමින්. මෙහි කළින් තිබූ වාර්තාව වූයේ ඉතියෝපියාවේ යොමිෆ් කෙජෙල්චාගේ 57.30. ඒ අනුව මෙය අර්ධ මැරතන් ලෝක වාර්තාවේ විශාල ම දියුණුව වුණා. මේ ජයග්‍රහණයත් සමග කප්ලීමෝ කිලෝමීටර් 21.1කින් යුත් අර්ධ මැරතන් තරග ධාවනය මිනිත්තු 57ට අඩු කාලයකින් සම්පූර්ණ කළ එදා මෙදා තුර පළමු පුද්ගලයා බවට ඉතිහාසගත වුණා.

පෙර තිබූ ලෝක වාර්තාව බිඳ දැමීම කරා යෙදුණු ධාවනයේදී කප්ලීමෝ පැයට කිලෝමීටර් 22.3ක සාමාන්‍ය වේගයක් පවත්වා ගෙන ගියා. ඔහු තරගය අවසන් කළේ දෙවැනි ස්ථානයට පත් කෙන්යාවේ ජෙෆ්රී කැම්වොරෝට මිනිත්තු දෙකකටත් වඩා වැඩි කාලයකට පෙර වීම විශේෂත්වයක්. ඊට තවත් තත්පර 56කට පසුව තෙවැනියට තරගය අවසන් කළේ ද කෙන්යාවේ ම තරගකරුවකු වන සැම්වල් මයිලු.

කප්ලීමෝ අර්ධ මැරතන් ලෝක වාර්තාව බිඳ දැමූ දිනයේ ම ජපානයේ ටොෂිකාසු යමානිශි (Toshikazu Yamanishi) කිලෝමීටර් 20 තරග ඇවිදීම ඉසව්වේ වාර්තාව පැය 1:16.10ක් දක්වා පහළට ගෙන ආවා. ඔහු විසින් බිඳ හෙළනු ලැබුවේ ජපානයේ ම යුසුකේ සුසුකි (Yusuke Suzuki) විසින් 2015 වසරේ පිහිටුවා තිබූ වාර්තාව.

කාබන් තහඩු සහ ක්‍රීඩා පාවහන් හා ස්පයික්ස්වල තිබෙන 'අති අවධි' ෆෝම්වලින් යුත් අධි නවීන තාක්ෂණය නිසා ක්‍රීඩකයන්ගේ දක්ෂතා වර්ධනය වී තිබෙනවා. මේ පාවහන් වෙළෙඳපොළට පැමිණි 2017 වසර ආරම්භයෙන් පසුව කිලෝමීටර් 5, කිමී 10ට වැඩි, අර්ධ හෝ පූර්ණ මැරතන් තරග බිමේ බිහිවූ පිරිමි හෝ කාන්තා 40 වැනි ලෝක වාර්තාව වනුයේ කප්ලීමෝගේ අර්ධ මැරතන් හපන්කම. මේ පාවහන්වලින් සාමාන්‍ය වශයෙන් සෑම මාස දෙකකට වරක් මාර්ග ධාවන ලෝක වාර්තාවක් බිහිවනවා. වසර 2000 සිට 2016 අවසානය දක්වා වකවානුවේ මේ සියලු දුර ප්‍රමාණවල ලෝක වාර්තා තිබුණේ 44ක් පමණයි. එය වසරකට වාර්තා තුනකටත් අඩුයි.

මේ 'සුපර් පාවහන්' පළමු වරට දක්නට ලැබුණේ රියෝ ඩි ජනේරෝ නුවර පැවති 2016 ඔලිම්පික් මැරතන් තරගයේ. එහිදී 'නයික්' ලාංඡනයේ ක්‍රීඩකයන් පදක්කම් ප්‍රදානය කෙරෙන වේදිකාවේ ඔවුන්ගේ අණසක පැතිරවූවා.




දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-